| නාරිවේදය පිලිබඳ මහාචාර්ය එස්. එස්. රත්නම් ග්‍රන්ථ තිළිණය | කේ. මයූරදන් |
| සායනික වෛද්‍ය විද්‍යාව පිලිබඳ මහාචාර්ය කේ. ධර්මදාස රන් පදක්කම | එච්. ඩී. තෙන්නකෝන් |
| ප්‍රසව හා නාරිවේදය පිලිබඳ ආචාර්ය ඒ. ඩී. විජේසේන අනුස්මරණ ත්‍යාගය | ඒ. කේ. විදානපතිරණ |
| සායනික ප්‍රසවවේදය හා නාරිවේදයෙහි විශිෂ්ඨත්වය සඳහා වූ මහාචාර්ය ටී. විස්වනාදන් රන් පදක්කම | ඒ. කේ. විදානපතිරණ |
| ෆ්ලෝරා සහ විල්සන් බණ්ඩාරනායක අනුස්මරණ ග්‍රන්ථ තිළිණය | කිසිවකු සුදුසුකම් නොලැබීය |
| විකලාංගවේදය පිලිබඳ ඩෝගෝ ඔස්ටින් රන් පදක්කම | එච්. ඩී. තෙන්නකෝන් |
| ශල්‍ය විද්‍යාව පිලිබඳ වෛද්‍ය එම්. එන්. බුර්හාන් රන් පදක්කම | එස්. එම්. සේනානායක මෙනෙවිය |
| ජෝසප් නල්ලයියා ආරුමුගම් අනුස්මරණ ප්‍රදානය | එස්. එම්. සේනානායක මෙනෙවිය |

| | |
|---|---|
| කෞමාරභෘත්‍යය පිලිබඳ වෛද්‍ය ඇලරික් ජයසිංහ අනුස්මරණ රන් පදක්කම | එස්. එම්. සේනානායක මෙනෙවිය |
| පෙරි ප්‍රදර්ශනය | කිසිවකු සුදුසුකම් නොලැබීය |
| විශිෂ්ඨතම ශිෂ්‍යයා සඳහා වන සුමනාවති ද කොස්තා ජුබිලි ප්‍රදානය | කිසිවකු සුදුසුකම් නොලැබීය |
| **විද්‍යා පීඨය** | |
| උද්භිද විද්‍යාව පිලිබඳ මහාචාර්ය බී. එල්. ටී. ද සිල්වා අනුස්මරණ ත්‍යාගය | පී. පී. හඳකුඹුර |
| ජාන විද්‍යාව හා ශාක අභිජනනය පිලිබඳ ස්වර්ණා සේනාධිරාජා අනුස්මරණ ත්‍යාගය | එන්. ඩී. ආර්. ඩිලානි |
| උද්භිද විද්‍යාව පිලිබඳ ශ්‍රීමත් නයිජල් බෝල් ප්‍රදානය | පී. පී. හඳකුඹුර |
| උද්භිද විද්‍යාව පිලිබඳ මහාචාර්ය බී. ඒ. අබේවික්‍රම ප්‍රදානය | එල්. ආර්. ආටිගල |
| උද්භිද විද්‍යාව පිලිබඳ මහාචාර්ය පී. සී. සර්බාධිකාරි ප්‍රදානය | ඊ. ඩී. ඩබ්. රත්නායක |
| සත්ත්ව විද්‍යාව පිලිබඳ ගුලාම් හුසේන් ඒ. ජේ. නූර්බායි රන් පදක්කම | පී. බී. රත්නායක |
| සත්ත්ව විද්‍යා ව්‍යාපෘතිය පිලිබඳ ගුලාම් හුසේන් ඒ. ජේ. නූර්බායි රන් පදක්කම | පී. බී. රත්නායක |
| පක්ෂි විද්‍යාව පිලිබඳ පී. බී. කරුණාරත්න අනුස්මරණ රන් පදක්කම | කිසිවකු සුදුසුකම් නොලැබීය |
| පක්ෂි විද්‍යාව සඳහා වන ක්ෂේත්‍ර පක්ෂි විද්‍යා කණ්ඩායම් පදක්කම | කිසිවකු සුදුසුකම් නොලැබීය |
| ජෛව රසායන හා අණුක ජීව විද්‍යාව පිලිබඳ ගුලාම්හුසේන් ඒ. ජේ. නූර්භායි රන් පදක්කම | පී.වී.ඩී.ජී.එන්. සිල්වා |
| ජෛව රසායන හා අණුක ජීව විද්‍යාව සඳහා වූ මහාචාර්ය ස්ටැන්ලි විජේසුන්දර අනුස්මරණ ප්‍රදානය | පී.වී.ඩී.ජී.එන්. සිල්වා |
| ඖෂධවේදය පිලිබඳ ගුලාම්හුසේන් ඒ. ජේ. නූර්භායි රන් පදක්කම | කිසිවකු සුදුසුකම් නොලැබීය |
| ඖෂධවේදය පිලිබඳ සේනක බිබිලේ රන් පදක්කම | කිසිවකු සුදුසුකම් නොලැබීය |
| රසායන විද්‍යාව පිලිබඳ හිකාපි ෆුම්පි ඛාන් රන් පදක්කම | අයි. ඒ. මුදුන්කොටුව |
| විශ්ලේෂී රසායන විද්‍යාව පිලිබඳ ධර්මචන්ද්‍ර සහ තාමරස ගුණවර්ධන අනුස්මරණ රන් පදක්කම | ඩී. එන්. සී. වික්‍රමසිංහ |
| භෞතික රසායන විද්‍යාව පිලිබඳ මහාචාර්ය පර්ලි පෙරෙයිරා අනුස්මරණ රන් පදක්කම | එම්. ඩී. සූරියාරච්චි |
| අකාබනික රසායන විද්‍යාව පිලිබඳ මහාචාර්ය ආර්. එස්. රාමක්‍රිෂ්ණා රන් පදක්කම | එම්. ඩී. සූරියාරච්චි |
| ගණිතය පිලිබඳ ධර්මදාස පුංචිහේවා අනුස්මරණ ත්‍යාගය | එස්. එච්. වයි. කෝට්ටෙගොඩ |
| ගණිතය පිලිබඳ ගුලාම්හුසේන් ඒ. ජේ. නූර්භායි රන් පදක්කම | එස්. එච්. වයි. කෝට්ටෙගොඩ |
| ගණිතය සඳහා වූ ඩග්ලස් අමරසේකර ත්‍යාගය | ඊ.පී.එස්. සිල්වා |
| ගණිතය සඳහා වූ ඩී.පී. ඇපාසිංහ දම්පතීන් අනුස්මරණ රන් පදක්කම | එස්. එච්. වයි. කෝට්ටෙගොඩ |
| සංඛ්‍යානය පිලිබඳ වී. ඩබ්. සමරනායක දම්පතීන් අනුස්මරණ රන් පදක්කම | පී.ඒ.කේ.එස්. පෙරේරා |
| සංඛ්‍යාන විද්‍යාව හා පරිගණක විද්‍යාව පිලිබඳ මහාචාර්ය වී. කේ. සමරනායක අනුස්මරණ රන් පදක්කම | එස්. ඉසෙඩ්. රසීක් |
| සංඛ්‍යාන විද්‍යාව ව්‍යාපෘතිය සඳහා පිරිනැමෙන සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුවේ රන් පදක්කම | පී.ඒ.කේ.එස්. පෙරේරා |
| භෞතික විද්‍යාව පිලිබඳ ආචාර්ය සී. ඒ. හේවාවිතාරණ අනුස්මරණ ත්‍යාගය | ඩබ්. ඩී. එස්. රුහුණුසිරි |
| භෞතික විද්‍යාව සඳහා මයිල්වාගනම් අනුස්මරණ ප්‍රදානය | ඩබ්. ඩී. එස්. රුහුණුසිරි |
| භෞතික විද්‍යා ව්‍යාපෘතිය සඳහා වන ගුලාම් හුසේන් ඒ. ජේ. නූර්භායි රන් පදක්කම | ඩබ්. ඩී. එස්. රුහුණුසිරි |
| ජෛව විද්‍යාව පිලිබඳ විද්‍යාවේදී (සාමාන්‍ය) උපාධි විශිෂ්ටතම ශිෂ්‍යයා සඳහා වන ප්‍රදානය | කිසිවකු සුදුසුකම් නොලැබීය |
| භෞතික විද්‍යාව පිලිබඳ විද්‍යාවේදී (සාමාන්‍ය) උපාධි විශිෂ්ටතම ශිෂ්‍යයා සඳහා වන ප්‍රදානය | ආර්. රත්දෙනිය |
| කුමාරස්වාමි ත්‍යාගය | ආර්. රත්දෙනිය |
| ජෝශප් නල්ලයියා ආරුමුගම් අනුස්මරණ ප්‍රදානය | ඩබ්. ඩී. එස්. රුහුණුසිරි |
| වසරේ කැපීපෙනෙන විද්‍යා ශිෂ්‍යයා සඳහා වූ ජස්ටින් සමරසේකර ප්‍රදානය | පී. පී. හඳකුඹුර |
| පරිගණක විද්‍යාව සහිත සංඛ්‍යාන විද්‍යාවෙහි විශිෂ්ඨතම අවසන් වසර ව්‍යාපෘතිය | එල්. කේ. ජී. ඒ. ඒ. හම්සා |
| **කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගනක පාසල** | |
| පරිඝනක විද්‍යාව සඳහා වූ මහාචාර්ය මොහාන් මුණසිංහ ප්‍රදානය | එෆ්. එච්. ඒ. එම්. සිල්වා |
| විශිෂ්ඨතම පරිගනක විද්‍යා ව්‍යාපෘතිය සඳහා වූ සින්ටෙක් ප්‍රදානය | ඩී. ඒ. අයි. ජයසිංහ |
| කාර්මික පුහුණුව සඳහා වූ ඩේවිඩ් පීරිස් සමූහය විසින් ප්‍රදානය කරනු ලබන රන් පදක්කම | එෆ්. එච්. ඒ. එම්. සිල්වා |
| වර්චූසා අධ්‍යයන විශිෂ්ඨත්ව සම්මානය | ඊ. එම්. ඒ. කේ. ඒකනායක |

## IV-07 වගුව: උපාධි අපේක්ෂක විවෘත ප්‍රදාන – 2008

| පීඨ | ශිෂ්‍යත්වයේ/ත්‍යාගයේ/රන් පදක්කමේ නම | ලැබූ අය |
|---|---|---|
| ශාස්ත්‍ර | සාමාන්‍ය කුසලතාව සඳහා වූ කනකරත්න සම්මානය | ඩබ්. ඩී. මදුරංගි |
| නීති | වසරෙහි හොඳම ශිෂ්‍යයා සඳහා වන සම්මානය | එන්. ජේ. ඇන්කටෙල් |
| විද්‍යා | ඩී. පී. පී. සමරසේකර සාම ත්‍යාගය | පී. බී. රත්නවීර |

## IV-08 වගුව : පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව, ත්‍යාග සහ පදක්කම් - 2008

| පීඨය සහ ශිෂ්‍යත්වයේ/ත්‍යාගයේ/රන් පදක්කමේ නම | ලැබූ අය |
|---|---|
| **අධ්‍යාපන** | |
| මන්වර්ජී ෆ්‍රාම්ජි බාත් රන් පදක්කම | ඩී. බාබු |
| අර්නස්ට් පෙරේරා අනුස්මරණ ප්‍රදානය | කේ. ටී. සුජාති |
| **කළමනාකරණ හා මූල්‍ය** | |
| සමස්ත කාර්ය සාධනය සඳහා වූ ආචාර්ය ලීනුස් සිල්වා ප්‍රදානය | අයි. කේ. පීරිස් |
| ව්‍යාපාර සංඛ්‍යානය සඳහා වූ වීරකෝන් ප්‍රදානය | ටී. ගංගොඩගමගේ<br>එල්. එම්. ඒ. ගුණවර්ධන<br>යූ. පී. හේරත් |
| මූල්‍ය වාර්තාකරණය හා කළමනාකරණ පාලන ක්‍රමවේද සඳහා CIMA සම්මානය | ජී. එල්. වීරකෝන් |
| සමකාලීන කළමනාකරණ චින්තනය සඳහා වූ CWE සම්මානය | බී. සෙල්වරාජ් |
| අලෙවිකරණ කළමනාකරණය සඳහා වූ හේලීස් සම්මානය | එන්. අබේසේකර |
| මානව සම්පත් කළමනාකරණය පිළිබඳ 1990 MBA උපාධි ප්‍රදානය | බී. එම්. ජී. ජේ. බණ්ඩාරණායක |
| කළමනාකරණය සඳහා CIC සම්මානය | එන් අබේසේකර<br>පී. ඒ. ටී. ඉපාර |
| විශිෂ්ඨතම නිබන්ධනය සඳහා ඇග්‍රෝ ටෙක්නිකා සමාගම විසින් කරනු ලබන ප්‍රදානය | අයි. කේ. පීරිස් |
| අලෙවිකරණ ක්ෂේත්‍රය සම්බන්ධ නිබන්ධනය සඳහා වන සිමෙන්ති සංස්ථා සම්මානය | එන්. අබේසේකර |
| ආයතනික චර්යාරටා පිළිබඳ ජිනසේන සම්මානය | අයි. කේ. පීරිස් |
| මෙහෙයුම් කළමනාකරණය සඳහා වූ හේකෙම් සමාගම විසින් පිරිනමන සම්මානය | එම්. ඒ. මයිනර් |
| ආයෝජන කළමනාකරණය සඳහා වූ සේතුරාමන් චෙට්ටියාර් අරමුදල විසින් කරනු ලබන ප්‍රදානය | එම්. එම්. සී. ප්‍රියන්ජිත් |
| **විද්‍යා** | |
| විශ්ලේෂී රසායන විද්‍යාව සඳහා වූ ආර්. එස්. රාමක්‍රිෂ්ණා රන් පදක්කම | කිසිවකු සුදුසුකම් නොලැබීය |
| **වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIM)** | |
| පවුල් වෛද්‍ය විද්‍යා ඩිප්ලෝමාව සඳහා වන වෛද්‍ය ටී. නාගේන්ද්‍රා රන් පදක්කම | ඒ. ජේ. ජමීල් |
| වෛද්‍ය විද්‍යාත්මක ක්ෂුද්‍රජීව විද්‍යාව පිළිබඳ ආචාර්ය තිස්ස විතාරණ රන් පදක්කම | සී. එන්. බඳනසිංහ |
| ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳ ආචාර්ය සී. එච්. පියරත්න රන් පදක්කම | ඒ. පී. ද සිල්වා |
| වෛද්‍ය විද්‍යාව පිළිබඳ වෛද්‍ය ජෝන් එෆ්. ස්ටෝක්ස් රන් පදක්කම | එම්. ඒ. නිරිඇල්ල |
| සායනික වෛද්‍ය විද්‍යාව සඳහා වෛද්‍ය පී. ටී. ද සිල්වා රන් පදක්කම | කිසිවකු සුදුසුකම් නොලැබීය |
| මනෝ විද්‍යාව පිළිබඳ ඇන්ඩෲ සිම්ස් රන් පදක්කම | ඒ. හපන්ගම |
| මනෝ විද්‍යාව පිළිබඳ ඇන්ඩෲ සිම්ස් රන් පදක්කම | එච්. වෛද්‍යසේකර |
| සායනික ශල්‍ය වෛද්‍ය විද්‍යාව සඳහා මහාචාර්ය මිල්රෝයි පෝල් රන් පදක්කම | ටී. ගෝබිශන්කර් |
| සායනික ශල්‍ය වෛද්‍ය විද්‍යාව සඳහා මහාචාර්ය මිල්රෝයි පෝල් රන් පදක්කම | ටී. සී. වීරසූරිය |
| ශල්‍යවිද්‍යාව පිළිබඳ වෛද්‍ය චූසපිල්ලෙ ගේබ්‍රියල් අනුස්මරණ රන් පදක්කම | කේ. උමාශංකර් |
| ශල්‍යවිද්‍යාව පිළිබඳ වෛද්‍ය චූසපිල්ලෙ ගේබ්‍රියල් අනුස්මරණ රන් පදක්කම | ටී. ගෝබිශන්කර් |
| ළමා රෝග | ඩී. සී. වීරසූරිය |

| | |
|---|---|
| පිළිබඳ මහාචාර්ය ප්‍රියානි සොයිසා විසින් ප්‍රදානය කරනු ලබන රන් පදක්කම | |
| ප්‍රසව හා නාරිවේද පිළිබඳ හෙන්රි නානායක්කාර රන් පදක්කම | එච්. එම්. ආර්. පී. හේරත් |
| අක්ෂි වෛද්‍යවේදය පිළිබඳ වෛද්‍ය පී. ඒ. වීරසිංහ රන් පදක්කම | කිසිවකු සුදුසුකම් නොලැබීය |
| සායනික නියෝ ප්ලාස්මවේදය පිළිබඳ වෛද්‍ය එච්. කේ. ටී. ප්‍රනාන්දු අනුස්මරණ රන් පදක්කම | කිසිවකු සුදුසුකම් නොලැබීය |
| **කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගනක පාසල (UCSC)** | |
| පරිගනක විද්‍යාව සඳහා විශිෂ්ටතම විද්‍යාපති උපාධිලාභියාහට පිරිනැමෙන කින්ස්ලේක් ප්‍රදානය | කිසිවකු සුදුසුකම් නොලැබීය |
| ජපන් ජාත්‍යන්තර සහයෝගිතා සංගමය විසින් පරිගණක විද්‍යාව සඳහා විශිෂ්ටතම විද්‍යාපති උපාධිලාභියාහට පිරිනමනු ලබන ප්‍රදානය | කිසිවකු සුදුසුකම් නොලැබීය |

**IV-09 වගුව : ජනමාධ්‍යවේදය පිළිබඳ ඩිප්ලෝමාව සඳහා ශිෂ්‍යත්ව, ත්‍යාග හා පදක්කම් - 2008**

| ශිෂ්‍යත්වයේ/ත්‍යාගයේ/රන් පදක්කමේ නම | ලැබූ අය | |
|---|---|---|
| | **2006** | **2007** |
| උපරිම මධ්‍යන්‍යය සඳහා මහාචාර්ය හිදියෝ ශිමුසු අරමුදල මගින් කරනු ලබන ප්‍රදානය | එස්. එම්. සප්‍රි | අයි ජෙගනාදන් |
| ජනමාධ්‍ය වේදයෙහි ඉතිහාසය විෂයයෙන් ලැබූ උපරිම ලකුණු ප්‍රමාණය සඳහා මහාචාර්ය හිදියෝ ශිමුසු අරමුදල මගින් කරනු ලබන ප්‍රදානය | එස්. එම්. සප්‍රි | එස්. පුංචිහේවා |
| භාෂාව හා සන්නිවේදනය සඳහා ලැබූ උපරිම ලකුණු ප්‍රමාණය සඳහා මහාචාර්ය හිදියෝ ශිමුසු අරමුදල මගින් කරනු ලබන ප්‍රදානය | ඩී. එස්. එස්. සත්කුමාර | ඩබ්. එල්. ඩී. සී. ද ඒ. ගුණතිලක |
| ජනමාධ්‍යකරණයෙහිදී නිර්මාණශීලී ලේඛනය සඳහා ලැබූ උපරිම ලකුණු සංඛ්‍යාව වෙනුවෙන් මහාචාර්ය හිදියෝ ශිමුසු අරමුදල මගින් කරනු ලබන ප්‍රදානය | වී. ගංගා | පී. එස්. ශාමිලා |
| ප්‍රවෘත්ති එක්රැස් කිරීමෙහි ක්‍රමවිධි සඳහා ලැබූ උපරිම ලකුණු සංඛ්‍යාව වෙනුවෙන් මහාචාර්ය හිදියෝ ශිමුසු අරමුදල මගින් කරනු ලබන ප්‍රදානය | වී. එච්. ආර්. ශ්‍යාමලී | ඩබ්. එච්. එස්. ඩී. සොඳුරුවිල<br>එච්. ඩී. ජේ. ජයකොඩි |
| විශිෂ්ටතම ව්‍යාපෘති වාර්තාව සඳහා වූ ඩී. එෆ්. කාරියකරවන රන් පදක්කම | එස්. එම්. සප්‍රි | බී. ඒ. චන්දිම |
| විශිෂ්ටතම සිංහල මාධ්‍ය ක්‍රියාකාරකම සඳහා ජියුන් අයොකි රන් පදක්කම | වයි. බී. සෙනෙවිරත්න | කිසිවකු සුදුසුකම් නොලැබීය |
| විශිෂ්ටතම දමිළ මාධ්‍ය ක්‍රියාකාරකම සඳහා ජියුන් අයොකි රන් පදක්කම | එස්. එම්. සප්‍රි | අයි. ජෙගනාදන් |
| විශිෂ්ටතම ඉංග්‍රීසි මාධ්‍ය ක්‍රියාකාරකම සඳහා ජියුන් අයොකි රන් පදක්කම | කිසිවකු සුදුසුකම් නොලැබීය | |

## විශ්වවිද්‍යාලයීය පර්යේෂණ ප්‍රදාන

ශාස්ත්‍ර පීඨයෙහි මහාචාර්ය නෙලූෆර් ද මෙල්, වෛද්‍ය පීඨයෙහි මහාචාර්ය එන්. ඩී. කරුණාවීර සහ විද්‍යා පීඨයෙහි මහාචාර්ය ඩබ්. ඩී. රත්නසූරිය වෙත විශ්වවිද්‍යාලයීය පර්යේෂණ ප්‍රදාන පශ්චාත් උපාධි ප්‍රදානෝත්සවයේදී විශ්වවිද්‍යාලය විසින් ප්‍රදානය කරන ලදී.

## V වන කොටස

## පීඨ

# 01. ශාස්ත්‍ර පීඨය

### හැඳින්වීම

2008 වර්ෂය තුළ මහාචාර්ය අමල් ජයවර්ධන මහතා ශාස්ත්‍ර පීඨයේ පීඨාධිපති ලෙස කටයුතු කළ අතර, අයි. කේ. කේ. විජේකෝන් මහත්මිය පීඨයේ සහකාර ලේඛකාධිකාරී ලෙස තවදුරටත් කටයුතු කළාය. 2008.12.31 දින සිට ක්‍රියාත්මක වන පරිදි මහාචාර්ය අමල් ජයවර්ධන මහතා තම ධූරකාලය අවසන් කළ අතර ජනගහන විද්‍යා අංශ ප්‍රධානී මහාචාර්ය ඉන්ද්‍රලාල් ද සිල්වා මහතා නව පීඨාධිපති ලෙස 2009.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි තේරී පත් විය.

පීඨය තව දුරටත් ජනගහන විද්‍යා, ඉංග්‍රීසි, ආර්ථික විද්‍යා, භූගෝලවිද්‍යා, ඉතිහාසය හා ජාත්‍යන්තර සබඳතා, දේශපාලන විද්‍යාව හා රාජ්‍ය ප්‍රතිපත්ති, සිංහල හා සමාජයීය විද්‍යා යන අංශ අටකින් යුක්තව ක්‍රියාත්මක විය. ඊට අමතරව පීඨයෙහි අරාබි සහ ඉස්ලාමීය ශිෂ්ටාචාර අංශය, ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අංශය, පරිගණක අංශය (ශිෂ්‍ය පරිගණක ඒකකයෙන් සහ පරිගණක ඉගැන්වීමේ ඒකකයෙන් සමන්විත) ජනමාධ්‍යවේද අංශය හා ගණිත අංශය යන අංශ පහක් (05) ද විය.

### පීඨයෙහි දර්ශනය හා මෙහෙවර

පීඨයෙහි දර්ශනය විශ්වවිද්‍යාලයෙහි දර්ශනය හා සමගාමී වේ : "දිවයිනේ ප්‍රථම විශ්වවිද්‍යාල කොලීජිය සමග ඓතිහාසික බැඳීම් තුළින් උරුම කරගත් බුද්ධිමය සම්ප්‍රදාය සහිත කොළඹ විශ්වවිද්‍යාලය බහුවිධ සමාජයක ප්‍රජාතාන්ත්‍රික ඇගයීම රැකගනිමින් ඥානය, අධ්‍යාපනය, පර්යේෂණ හා නිර්මාණශීලීත්වය මෙන්ම ව්‍යවසායකත්වය ඒකරාශී කිරීම මගින් මානව සංවර්ධනය උසස් තලයකට පත් කිරීම සඳහා කටයුතු කරන ජගත් මට්ටමේ විශිෂ්ට ආයතනයක් බවට පත්වීමට යත්න දරයි." සේවා පරිසරය සමග කටයුතු කිරීමේදී අධ්‍යාපන හා මානසික ශක්‍යතාවයෙන් හෙබි උපාධිධාරීන් පිරිසක් දායාද කිරීම සඳහා කර්මාන්ත අංශය හා අධ්‍යයන පාර්ශ්ව සමග ශක්තිමත් හවුල් සබඳතා ගොඩනගා ගැනීමට පීඨය කැපවී සිටී.

පීඨයෙහි මෙහෙවර වනුයේ ඉගැන්වීමෙහි, පර්යේෂණයෙහි, පුහුණුවෙහි හා ඇගයීමෙහි උසස් ම අධ්‍යයන හා සාරධර්ම පදනම් මත පිහිටමින් සමාජ විද්‍යා හා සමාජ මානව විද්‍යාවන්හි විදග්දබව, තීව්‍ර විමසීම, නිපුණතා යනාදිය එකවර නගා සිටුවීමත්; ශිෂ්‍යයන් වෙත නිශ්චිත නිපුණතාවයන් හා හැකියාවන් පමණක් නොව, පුළුල් සමාජ හා මානව දැක්මක් ලබා දීම හා එමගින්, වෙනස් වන කාර්ය ලෝකයෙහිදී සමාජ වගකීමකින් හා සාරධර්ම වලට අනුකූල වූ කැපවීමකින් යුක්තව ඒ ඒ අවස්ථාවනට ගැලපීමට හැකියාවක් ලබා දීමත් වේ.

**පීඨයෙහි උපාධි අපේක්ෂක ප්‍රජාවගේ ශක්‍යතා වර්ධනය කිරීම සඳහා උපාධි අපේක්ෂකයින්ගේ අධ්‍යාපනයෙහි අදාලත්වය හා ගුණත්වය වර්ධනය කිරීමේ වැඩසටහන (IRQUE) වෙතින් රුපියල් මිලියන 20 ක ප්‍රතිපාදන පීඨයට ලැබිණි.**

උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන "උපාධි අපේක්ෂකයින්ගේ අධ්‍යාපනයෙහි අදාලත්වය හා ගුණත්වය වර්ධනය කිරීමේ (IRQUE) වැඩසටහනෙහි තත්ත්වය උසස් කිරීමේ අරමුදලෙහි (QEF) තෙවන අදියරෙන් ලබා දෙන තරගකාරී ප්‍රතිපාදන ක්‍රමය යටතේ, කොළඹ විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍ර පීඨය රුපියල් මිලියන 20

ක ප්‍රතිපාදනයක් තම පීඨයෙහි උපාධි අපේක්ෂකයන් ගේ අධ්‍යයන හැකියාවන් වර්ධනය කිරීම සඳහා දිනා ගන්නා ලදි.

තම උපාධිධාරීන්ගේ විරැකියාව ශාස්ත්‍ර පීඨය අභිමුවෙහි ඇති ප්‍රධානතම ප්‍රශ්නය ලෙස හඳුනාගෙන තිබේ. ඊට මුල් වන හේතු ලෙස පහත කරුණු හඳුනා ගෙන තිබේ. එනම් අ) වර්තමානයේ බිහිවන උපාධිධාරීන්ගේ දැනුමෙහි තත්ත්වය හා ශ්‍රම වෙළඳපොළ විසින් අපේක්ෂා කරනු ලබන ප්‍රමිතිය අතර පවත්නා වෙනස ආ) ක්ෂේත්‍ර සුවිශේෂී උපාධිධාරීන් වෙනුවට දැනුම පාදක කරගෙන බිහිවූ උපාධිධාරීන් කෙරෙහි ඇති කැමැත්ත ඇ) නව තාක්ෂණයෙහි සේවක මණ්ඩලය සතු පුහුණුව මඳබව හා සේවක මණ්ඩලය තුල එවැනි වෙනසක් ඇති කිරීමෙහි අවශ්‍යතාව සහ ඈ) ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වීම වේ.

QEF ප්‍රතිපාදන යටතේ, ශාස්ත්‍ර පීඨය තම සිසුන් සතු අඩු ලුහුඬුකම් වන ඉංග්‍රීසි බසෙහි චාතුර්යය නොමැතිබව, තොරතුරු තාක්ෂණ දක්ෂතා හා මෘදුකාංග දක්ෂතා නොමැතිබව වැනි මූඛ්‍ය ප්‍රශ්න සඳහා විසඳුම් සොයනු ඇත. පීඨයෙහි අධ්‍යයනය ලබන සුවිශාල සිසුන් සංඛ්‍යාවගේ අවශ්‍යතා සපුරාලීමට ප්‍රමාණවත් වන පරිදි ඒ සඳහා අවශ්‍ය පරිගණක හා වෙනත් නව ඉගැන්වීම් හා ඉගෙනුම් උපකරණ සහ පහසුකම් ප්‍රමාණවත් අයුරින් නොමැති වීම ඉහත කී දක්ෂතා එම සිසුන් අතර වර්ධනය කිරීමට බාධාවක් ව පවතී. ඉහත දක්වන ලද ක්ෂේත්‍රයන්හි පවත්නා දුර්වලතා කෙරෙහි අවධානය යොමුකරමින් පීඨයෙහි උපාධිධාරීන් රැකියා සඳහා සුදුසුකම්වලින් යුක්ත කිරීම සඳහා ඔවුන්ගේ තත්ත්වය වර්ධනය කිරීම ව්‍යාපෘතියෙහි අවශ්‍යතාව වේ.

ව්‍යාපෘතියෙහි එක් එක් ක්‍රියාකාරකම් විවිධ වූ ක්‍රියාත්මක අවධීන් පසු කරමින් පවතී. ව්‍යාපෘතිය සඳහා ඉල්ලුම් කර ඇති ඉගැන්වීම් උපකරණ හා දැව භාණ්ඩ බොහොමයක් ලබාගැනීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. අධ්‍යයන මග පෙන්නුම් සංවර්ධනයට (‘අ’ ක්‍රියාකාරකම) සම්බන්ධ වැඩමුළු 2ක් පැවැත්විණ. ඉංග්‍රීසි අංශය යටතේ දැනට ශාස්ත්‍රවේදී උපාධිය හදාරමින් සිටින ඉංග්‍රීසි ගුරුවරුන් පුහුණු කිරීම් සම්බන්ධ පාඨම් සටහන් සංවර්ධනය කිරීම ඇරඹී ඇත. (‘අ-4’ ක්‍රියාකාරකම) එසේම, මනෝ සමාජයීය උපදේශකයෙකු පත්කිරීම සඳහා ඉල්ලුම්පත් කැඳවා තිබේ. (‘ආ’ ක්‍රියාකාරකම)

## වාර්ෂික ඇගයීම් වැඩමුළුව 2008

ශාස්ත්‍ර පීඨයෙහි වාර්ෂික ඇගයීම් වැඩමුළුව 2008 ජූනි මස 27 හා 28 යන දිනයන්වල කොළඹ රේණුකා හෝටලයෙහිදී පවත්වනු ලැබූ අතර, ඒ සඳහා 60 දෙනෙකුගේ පමණ සහභාගිත්වයක් පැවැතිණ. විශ්වවිද්‍යාලයෙන් පරිබාහිර පාර්ශ්ව වශයෙන් මෙම වැඩමුළුව සඳහා සම්පත් දායකයන් ලෙස මහාචාර්ය කොලින් පීරිස් (QAA, IRQUE), ආචාර්ය හේමමාලා රත්වත්ත (විවෘත විශ්වවිද්‍යාලය) සහ මහාචාර්ය නිලන්ති ද සිල්වා (කැලණිය විශ්වවිද්‍යාලය) සහභාගී වූහ. ඊට අමතරව, අංශ ප්‍රධානීන් සහ ඒකක  සම්බන්ධීකාරකවරු ද වැඩමුළුවෙහිදී ඉදිරිපත් කිරීම් කළහ. මෙම වැඩමුළුව ශාස්ත්‍ර පීඨයෙහි අධ්‍යයන අධ්‍යක්ෂ මහාචාර්ය නෙලුෆ ද මෙල් විසින් සංවිධානය කරන ලද අතර ආචාර්ය ඉරේෂා කරුණාරත්න (සමාජ විද්‍යා) සහ දිනිති කරුණානායක මිය (ඉංග්‍රීසි අධ්‍යයනාංශය) වාර්තා සම්පාදකවරියන් ලෙස කටයුතු කළහ.

පහත සඳහන් පුළුල් විෂය පරාසයන් පිලිබඳ වැඩමුළුවෙහිදී සාකච්ඡාවට භාජනය විය: (අ)ලකුණු පාදක කරගත් පාඨමාලා ඒකක ක්‍රමය (ආ)ශිෂ්‍ය සීමාවාසික වැඩසටහන (ඇ)අධ්‍යයන ප්‍රවාහ. (ඈ)ඉංග්‍රීසි මාධ්‍යයෙන් උපදෙස් දීම (ඉ)සම විමසීම් සහ ශිෂ්‍ය ඇගයීම් (ඊ) විභාග ක්‍රමවේද

## පර්යේෂණ සැසි

කොළඹ විශ්වවිද්‍යාලයීය සනාතන සහා ශාලාවේදී ශාස්ත්‍ර පීඨය තම පර්යේෂණ සැසි ඔක්තෝබර් මස 24 සහ 25 යන දෙදින පවත්වන්නට යෙදුණි. ප්‍රධාන දේශනය

මහජන වීන ජනරජයෙහි ශ්‍රී ලංකා තානාපති හා විදේශ කටයුතු අමාත්‍යාංශයෙහි හිටපු. ලේකම් නිහාල් ප්‍රනාන්දු මහතා විසින් සිදු කරන ලදි. තේමාවට අදාල ව සිව් වැදැරුම් පුවරු වූ අතර ඒවා නම් (අ) වෙනස්වන ප්‍රජාවන් හා සංස්කෘතීන් (ආ)දැනුම නිශ්පාදනය ( ආයතන හා ක්‍රමවිධි (ඇ) ජලජ සම්පත් හා කාලගුණය (ඈ) මහජන ප්‍රතිපත්තිය වේ. ඉහත දැක්වූ තේමා යටතේ පීඨය විසින් අධ්‍යයන පත්‍රිකා පහලොවක් ඉදිරිපත් කරන ලද අතර ඒවා ඉදිරිපත් වූයේ සමාජ විද්‍යා, ඉතිහාසය හා ජාත්‍යන්තර සබඳතා, ඉංග්‍රීසි, සිංහල, භූගෝල විද්‍යා හා ජනගහන විද්‍යා යන අංශ වලිනි. සිංහල අංශයේ ක්‍රිශාන්ත ෆ්‍රෙඩ්රික් මහතා, සමාජ විද්‍යා අංශයේ දිල්රුක්ෂි අබේසිංහ මිය සහ ශාස්ත්‍ර පීඨයේ පීඨාධිපති කාර්යාලයීය කාර්ය මණ්ඩලයේ සහය ලබමින් මෙම වැඩමුළුව සංවිධානය කරනු ලැබුයේ අධ්‍යයන අධ්‍යක්ෂිකා මහාචාර්ය නෙලුෆ ද මෙල් විසිනි.

## පර්යේෂණ ප්‍රදානය

2008 වර්ෂය සඳහා ශාස්ත්‍ර පීඨයෙහි පර්යේෂණ වෙනුවෙන් කරන ලද ප්‍රදානය ඉංග්‍රීසි අධ්‍යයනාංශයේ මහාචාර්ය නෙලුෆ ද මෙල් විසින් දිනා ගන්නා ලදි.

## කාර්ය මණ්ඩල තොරතුරු

සමාජ විද්‍යා අංශයේ සාමාජිකයෙකු වූ මහාචාර්ය තිලක් හෙට්ටිආරච්චි මහතා උපකුලපති වශයෙන් තම දෙවන නිලකාලය සම්පූර්ණ කළේය.

අධ්‍යයන කාර්ය මණ්ඩලයෙහි ස්ථිර සාමාජිකයින් 134 දෙනෙකු සිටි අතර එයට මහාචාර්ය වරුන් 17 දෙනෙක්, සහාය මහාචාර්යවරුන් 4 දෙනෙක්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් 69 දෙනෙක්, කථිකාචාර්යවරුන් 7 දෙනෙක්, පරිවාස කථිකාචාර්යවරු 25 දෙනෙක් සහ ස්ථිර උපදේශකවරු 13 දෙනෙක් ඊට ඇතුළත් වූහ. ඊට අමතරව පද්ධති විශ්ලේෂකවරු දෙදෙනෙකු ද තාවකාලික සහකාර කථිකාචාර්යවරුන් 24 දෙනෙකුද, තාවකාලික නිබන්ධකවරුන් 24 දෙනෙකු සහ තාවකාලික උපදේශකවරු 4 දෙනෙකුද 2008 වසර තුළ අධ්‍යයන කටයුතුවල නියුක්ත ව සිටියහ.

වර්ෂය තුල අංශ ප්‍රධානීන් ලෙස කටයුතු කළ අය පහත දැක්වෙන පරිදි වේ. මහාචාර්ය ඩබ්. අයි. ද සිල්වා (ජනගහන විද්‍යා); මහාචාර්ය නෙලූකා සිල්වා (ඉංග්‍රීසි); මහාචාර්ය ජයන්ති ද සිල්වා (භූගෝල විද්‍යා); මහාචාර්ය ජයදේව උයන්ගොඩ (දේශපාලන විද්‍යා හා රාජ්‍ය ප්‍රතිපත්ති); අයි. වී එදිරිසිංහ මහතා (2008.07.09 දක්වා) හා ආචාර්ය සුභාංගි හේරත් (2008.07.09 සිට) (සමාජ විද්‍යා); මහාචාර්ය නයනි මෙලගොඩ (ඉතිහාසය හා ජාත්‍යන්තර සබඳතා); මහාචාර්ය එල්. ඒ. ඩී. ආනන්ද තිස්ස කුමාර (සිංහල) සහ මහාචාර්ය සුනිල් චන්ද්‍රසිරි (ආර්ථික විද්‍යා)

මතු සඳහන් අය ඒකක සම්බන්ධීකාරකවරු ලෙස කටයුතු කළහ. එම්. එම්. එම්. සබීර් (අරාබි සහ ඉස්ලාමීය ශිෂ්ටාචාර); නලිනි මහේසන් මිය (ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය); කමල් වලේබොඩ මහතා (ජනසන්නිවේදන ඒකකය), සුසන්ත ලියනාරච්චි මහතා (පරිගනක ඒකකය), මහාචාර්ය එස්. ඒ. නෝබට් (ගණිත ඒකකය)

**V-01 වගුව : පත් කිරීම්, උසස් කිරීම්, ඉල්ලා අස්වීම් සහ සේවය අවසන් කිරීම්**

| අංශය සහ නම | තනතුර | ක්‍රියාත්මක දිනය |
|---|---|---|
| **පත්කිරීම්** | | |
| **ජනගහන විද්‍යා** | | |
| තිශාන්ති පෙරේරා මිය | පරිවාස කථිකාචාර්ය | 2008.08.12 |
| **ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ ඒකකය** | | |
| බී. ජේයක්‍රිප්නන් මිය | පරිවාස කථිකාචාර්ය | 2008.05.02 |
| ඩබ්. එන්. එම්. වික්‍රමසේකර මිය | පරිවාස කථිකාචාර්ය | 2008.05.02 |
| ඒ. එම. ඒ. යූ. අත්තනායක මිය | පරිවාස කථිකාචාර්ය | 2008.05.27 |

| | | |
|---|---|---|
| එස්. වයි. ඩයස් මිය | පරිවාස කථිකාචාර්ය | 2008.05.02 |
| ආර්. එම්. තිලකරත්න | පරිවාස කථිකාචාර්ය | 2008.05.02 |
| ජ්. පී. එන්. ඩී. ගුණරත්න | පරිවාස කථිකාචාර්ය | 2008.05.02 |
| **උසස් කිරීම්** | | |
| **ඉංග්‍රීසි** | | |
| මහාචාර්ය නෙලූකා ද සිල්වා | මහාචාර්ය | 2007.02.27 |
| **සමාජ විද්‍යා** | | |
| ආචාර්ය කුමුදු කුසුම් කුමාර | ජ්‍යෙ. කථිකාචාර්ය (II ශ්‍රේණිය) | 2007.09.14 |
| ජ්. රොබින්සන් මහතා | ජ්‍යෙ. කථිකාචාර්ය (II ශ්‍රේණිය) | 2008.01.24 |
| එම්. ටී. එම්. මහීස් | ජ්‍යෙ. කථිකාචාර්ය (II ශ්‍රේණිය) | 2007.09.01 |
| මහාචාර්ය රෝහිනී පරණවිතාන | මහාචාර්ය | 2006.09.06 |
| **විශ්‍රාම යාම්** | | |
| **ආර්ථික විද්‍යාව** | | |
| මහාචාර්ය චන්ද්‍රා රුද්‍රිගු | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | 2008.09.30 |
| **ඉතිහාසය හා ජාත්‍යන්තර සබඳතා** | | |
| මහාචාර්ය ඩබ්. එම්. කරුණාදාස | මහාචාර්ය | 2008.09.30 |
| මහාචාර්ය එම්. ජී. ඒ. කුරේ | සහාය මහාචාර්ය | 2008.09.30 |
| මහාචාර්ය ආර්. ඒ. ආරියරත්න | සහාය මහාචාර්ය | 2008.09.30 |
| **සිංහල** | | |
| මහාචාර්ය ඒ. බී. දිසානායක | සහාය මහාචාර්ය | 2008.09.30 |
| මහාචාර්ය පී. විජේගුණසිංහ | සහාය මහාචාර්ය | 2008.09.30 |
| **ජනසන්නිවේදන ඒකකය** | | |
| ආචාර්ය ධර්මසේන පතිරාජ | ජ්‍යෙ. කථිකාචාර්ය (II ශ්‍රේණිය) | 2008.10.01 |
| **ඉල්ලා අස්වීම්** | | |
| **ජනගහණ විද්‍යාව** | | |
| මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක | පීඨාධිපති/උපාධි අධ්‍යයන පීඨය | 2008.07.25 |
| **ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ ඒකකය** | | |
| එෆ්. එස්. නලීම් මිය | පරිවාස කථිකාචාර්ය | 2008.06.13 |
| එම්. පී. එමැනුවෙල් මිය | උපදේශක (II ශ්‍රේණිය) | 2008.04.01 |
| ජේ. ඒ. හපුතන්ත්‍රි මිය | උපදේශක (II ශ්‍රේණිය) | 2008.04.08 |

## පීඨයෙහි පත්කිරීම්

මහාචාර්ය නෙලුෆා ද මෙල් මිය 2008 ඔක්තෝබර් 28 වන දින ශාස්ත්‍ර පීඨයෙහි අධ්‍යයන අධ්‍යක්ෂ පදවියෙන් නිදහස් කරන ලද අතර, මහාචාර්ය ජෝර්ජ් කුරේ මහතා 2008 සැප්තැම්බර් මස 30 වන දින සිට පීඨයෙහි අධ්‍යයන උපදේශක පදවියෙන් ඉල්ලා අස්විය. ආචාර්ය චන්දන අලුත්ගේ තොරතුරු හා ප්‍රලේඛණ මධ්‍යස්ථානයෙහි (IDC) සම්බන්ධීකාරක ලෙස තවදුරටත් කටයුතු කළේය.

## ප්‍රථම උපාධි වැඩසටහන්

2008 වර්ෂයේදී පීඨයෙහි සමස්ත උපාධි අපේක්ෂකයින්ගේ සංඛ්‍යාව 3000 ඉක්මවිය. සීමාවාසික පාඨමාලා ද සහිතව පුළුල් පරාසයක පාඨමාලාවන් සිසුන් වෙත ඉදිරිපත් කරමින් පාඨමාලා ඒකක ක්‍රමය තව දුරටත් පැවැත්විණ.

ජනගහන විද්‍යා අංශය ප්‍රථම වතාවට ජනගහන විද්‍යාව පිළිබඳ විශේෂ උපාධිය නැවත ස්ථාපනය කරන ලදි. පාඨමාලාව 2008 ජූලි මස ආරම්භ වූ අතර සිසුන් 28 දෙනෙකු ඒ සඳහා ලියාපදිංචි විය. ප්‍රජා විද්‍යා අංශය ජනගහන විද්‍යාව විෂයයක් වශයෙන් සාමාන්‍ය උපාධිය සඳහා තව දුරටත් උගන්වන ලද අතර දෙවන හා තෙවන වසර සඳහා අතුරු විෂයයක් වශයෙන් අතිකූත් විශේෂ උපාධි අපේක්ෂක සිසුන් සඳහා ද උගන්වනු ලැබීය.

පාඨමාලා ඒකක ක්‍රමය යටතේ ආර්ථික විද්‍යා අංශය තව දුරටත් තම දේශන පවත්වන්නට යෙදුන අතර විශේෂ උපාධි අපේක්ෂක සිසුන් විෂයධාරා විශේෂීකරණ ක්‍රියාදාමය තෙවන වසර සිට ඉදිරියට අනුගමනය කරන ලදී. නව පාඨමාලා ඒකක වැඩි ප්‍රමාණයක් හඳුන්වා දෙන ලදී. ආර්ථික විද්‍යාව පිළිබඳ විශේෂ උපාධි පාඨමාලාව සඳහා සැලකිය යුතු ඉල්ලුමක් තිබූ නිසා, අංශය විසින් සිංහල මාධ්‍යය සඳහා **184** දෙනෙක් ද, දෙමළ මාධ්‍යය සඳහා **39** දෙනෙක්ද ඉංග්‍රීසි මාධ්‍යය සඳහා **34** දෙනෙක් ද ඇතුලත් කර ගන්නා ලදී.

**2008** වසර තුල විශේෂ උපාධි පාඨමාලාව නැවත පිළියෙල කිරීම සහ විෂයමාලා සංවර්ධනය කෙරෙහි කැපී පෙනෙන අවධානයක් යොමු කරන ලදි. පාඨමාලාවන් සම්බන්ධව ශිෂ්‍ය ඇගයීම් සිදු කරන ලදී. කාර්ය මණ්ඩලය විසින් සීමාවාසික වැඩසටහන ද විමසීමට ලක් කරන ලදී.

අංශය විසින් තම ප්‍රථම උපාධි වැඩසටහන් වලට අමතරව, ආර්ථික විද්‍යාව ඉගැන්වීම සඳහා තම සහයෝගය අ)ඉතිහාසය හා දේශපාලන විද්‍යාව වැනි පීඨයෙහි වෙනත් අංශ සහ ආ) විද්‍යා පීඨයෙහි සත්ත්ව විද්‍යා අංශය වෙත සපයන ලදි. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් පවත්වනු ලබන M.Sc. සහ MD පාඨමාලාවන්හි සෞඛ්‍ය ආර්ථික ඒකක සම්බන්ධ වෛද්‍ය පරිපාලනය හා ප්‍රජා වෛද්‍ය විද්‍යාව ඉගැන්වීම සඳහා ඉගැන්වීම් හා පර්යේෂණ සහාය ලබා දෙන ලදී.

ඉංග්‍රීසි අධ්‍යයන අංශය සාමාන්‍ය හා විශේෂ උපාධීන් සඳහා ඉංග්‍රීසි සාහිත්‍යය, ඉංග්‍රීසි භාෂාව හා ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම (ELT), සංස්කෘතික අධ්‍යයනය යන විෂය ක්ෂෙත්‍ර සඳහා පාඨමාලා ඒකක ගණනාවක් ඉදිරිපත් කර ඇත.

**2000** වසරේ සිට, ඉංග්‍රීසි අධ්‍යයනාංශය විසින් සිසුන් අතර වැඩි ඉල්ලුමක් ඇති ඉංග්‍රීසි භාෂාව සහ ELT සඳහා වන පාඨමාලා ඒකක වැඩි කර ඇත. තවද, අමතර ලියාපදිංචි කර ගැනීම් යටතේ ද බාහිරව පැවැත්වෙන ප්‍රථම විභාගයක් මගින් පළමු වසරට ඉංග්‍රීසි ගුරුවරුන් ඇතුලත් කර ගැනීමෙන්ද අධ්‍යයනාංශය වෙත ඇතුලත් කර ගැනෙන සිසුන් සංඛ්‍යාව වැඩි කර ඇත. ඉංග්‍රීසි උපාධිධාරී ගුරුවරුන්, නොයෙකුත් ආයතන වල පුහුණුකරුවන්, ප්‍රතිපත්ති සැලසුම්කරුවන් ආදී වශයෙන් සේවය සැපයීමේදී ඉංග්‍රීසි භාෂාව හා ELT පාඨමාලා ඒකක සුවිශේෂී ලෙස තම හැකියාවන් ගෙන් ඵල නෙලා ගැනීමට උපකාරී වී ඇත.

ඉතිහාසය හා ජාත්‍යන්තර සබඳතා අංශය විසින් **1000** කට අධික සාමාන්‍ය උපාධිධාරී ප්‍රජාවකට පාඨමාලා ඉදිරිපත් කර ඇති අතර අධ්‍යයනාංශය විසින් විශේෂ උපාධි පිරිනමන විෂයයන් වන ඉතිහාසය හා ජාත්‍යන්තර සබඳතා යන විෂයයන් ද විශේෂ උපාධිධාරීන් **180** දෙනෙකු විසින් හදාරන ලදී.

සිංහල අධ්‍යයනාංශය විසින් සාමාන්‍ය හා විශේෂ උපාධි හදාරන සිසුන් හට පාඨමාලා සපයන ලදී.

සමාජ විද්‍යා අධ්‍යයනාංශය විසින් ද සාමාන්‍ය හා විශේෂ උපාධි සඳහා තවදුරටත් පාඨමාලා ඉදිරිපත් කරන ලද අතර, නව අධ්‍යයන පාඨමාලා දෙකක් සඳහා පීඨ සභාවේ සහ සනාතන සභාවේ අනුමැතිය ලබා ගන්නා ලදි. එනම්: අ) මනෝ විද්‍යාව සඳහා අනු අංශයක් ස්ථාපනය කිරීමේ අදහසින් විෂයයක් වශයෙන් මනෝ විද්‍යාව සාමාන්‍ය උපාධිය සඳහා ඉදිරිපත් කිරීම ආ) සමාජ විද්‍යා විශේෂ උපාධි පාඨමාලාව තුල සමාජ කටයුතු වලට අදාල වූ අධ්‍යයන ධාරාවක් සැකසීම වේ. මින් පළමුවැන්න **2009** වසරෙහිදී ආරම්භ වීමට නියමිත අතර, දෙවැන්න **2008** වසරෙහි ඔක්තෝබර් මස ඇරඹිණ. ලුබ්ජානා විශ්වවිද්‍යාලයෙහි විද්වත්හු සමාජ කටයුතු පිළිබඳ මෙම නව ඒකකය හඳුන්වාදීමට ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වී කටයුතු කරන අතර ලුබ්ජානා විශ්වවිද්‍යාලයෙහි සමාජ කටයුතු පීඨයෙහි පීඨාධිපති හා ස්ලෝවේනියාවේ සමාජ කටයුතු ක්ෂේත්‍රයෙහි ඉතා උසස් නමක් දිනා ගත් විද්වතෙක් වන මහාචාර්ය විටෝ ෆ්ලේකර් දැනට මෙම නව අධ්‍යයන ධාරාවෙහි ප්‍රථම පාඨමාලා ඒකකය සංවිධානය කිරීම හා ඉගැන්වීමෙහි නිරත වී සිටී.

ජ්‍යෙෂ්ඨ අධිශිෂ්‍යත්වලාභියෙකු වන මහාචාර්ය ශ්‍රීනික ජයරත්න ගේ සහයෝගය ද 2008 ඔක්තෝබර් මස සිට 9 මසක් දක්වා ලබා ගැනීමේ වාසිය ද අධ්‍යයනාංශය සතු වේ. මනෝවිද්‍යා, සමාජ කාර්ය හා ක්‍රමවේදය යන ක්ෂේත්‍ර කෙරෙහි ඔහු ගේ අධ්‍යයන ප්‍රතිදානය ඔස්සේ ඔහු අධ්‍යයනාංශයට වටිනා සම්පතක් විය.

දේශපාලන විද්‍යාව හා රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනාංශය විසින් 2008 වසර සඳහා විවිධ නව ක්‍රියා මාර්ග කිහිපයක්ම ගෙන ඇත. එසේ සපුරා ගත් ප්‍රධාන ඉලක්ක කිහිපයක් වනුයේ අ) ප්‍රථම උපාධි අධ්‍යයන පාඨමාලා සහ විෂය නිර්දේශ නැවත විමසීම් ආ) ගැටුම්, බලය හා ප්‍රජාතන්ත්‍රවාදය (සී.පී.ඩී.) පිළිබඳ ව්‍යාපෘතිය ආරම්භ කිරීම, නෝර්වේ හි ඔස්ලෝ විශ්වවිද්‍යාලය, ඉන්දුනීසියාවෙහි ගජා මඩා විශ්වවිද්‍යාලය හා අධ්‍යයනාංශය අතර ත්‍රිපාර්ශ්වික ඒකාග්‍රතාවකින් යුතුව ක්‍රියාත්මක වන දේශපාලන විද්‍යා හා ගැටුම්, බලය හා ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ පර්යේෂණ ශාස්ත්‍රපති හා දර්ශන ශූරී උපාධි පාඨමාලා ඇරඹීම සිදුවනු ඇත, ඇ) අධ්‍යයනාංශයෙහි වෙබ් අඩවිය සම්බන්ධ කටයුතු සම්පූර්ණ කිරීම

භූගෝලවිද්‍යා අධ්‍යයනාංශය විසින්ද සාමාන්‍ය හා විශේෂ උපාධි සිසුන් හට පාඨමාලා ඉදිරිපත් කරන ලද අතර එහි කාර්ය මණ්ඩලය විසින් මාර්ග සංවර්ධනය හා කොළඹ කටුනායක අධිවේගී මාර්ග ව්‍යාපෘති සඳහා ද ප්‍රථම උපාධි අධ්‍යාපන පාඨමාලා තත්ත්ව සුරක්ෂණය සම්බන්ධ පාඨමාලා සඳහා ද සම්බන්ධ වෙමින් තම විශේෂඥ ඥානය ජාතික සංවර්ධනය කෙරෙහි දායක කරන ලදී.

ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ ඒකකය විසින් නත්‍ය පන්ති කාමර ඔස්සේ වැඩි  අධ්‍යයන අවස්ථා ඇති කිරීමේ දර්ශනයකින් යුතුව, ආසියානු සංවර්ධන බැංකුව මගින් මූල්‍යාධාර සපයනු ලබන දුරස්ථ අධ්‍යාපන නව්‍යකරණ ව්‍යාපෘතිය (DEMP) යටතේ ව්‍යාපාරික ඉංග්‍රීසි භාෂාව පිළිබඳ අන්තර්ජාලමය විද්‍යුත් ඩිප්ලෝමාවක් ඇති කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යෝජනාවලියක් ඉදිරිපත් කරන ලදී. මෙම යෝජනාවලිය පිළිගන්නා ලද අතර අදාල අන්තර්ගතය පිළියෙල කිරීමේ කටයුතු කෙරෙහි එළඹී ඇත.

2008 දී අරාබි හා ඉස්ලාමීය ශිෂ්ටාචාරය පිළිබඳ අධ්‍යයනාංශය තම සම්පත් සංවර්ධනය කිරීම හා කාර්ය මණ්ඩලය පුහුණු කිරීම පිළිබඳ ඉරාන ඉස්ලාමීය සමූහාණ්ඩු තානාපති කාර්යාලය සමග සාකච්ඡා පවත්වන්නට යෙදුණු අතර මෙම පරිපාටිය යටතේ ව්‍යාපෘති යෝජනාව සම්බන්ධව පීඨ සභාවේ සහ සනාතන සභාවේ අනුමැතිය  ලබාගන්නා ලදී.

ගණිතය නොයෙකුත් ආකාර විෂය ක්ෂේත්‍ර සඳහා අන්තර් ක්ෂේත්‍ර විෂයයක් වන අතර ගණිත අධ්‍යයන ඒකකය (MU) ශාස්ත්‍ර පීඨ සිසුන් හට අධ්‍යයන පාඨමාලා තුනක් ඉදිරිපත් කර ඇත.

ජනමාධ්‍ය ඒකකය තම පාඨමාලා ඒකකයන් සන්නිවේදන හා ජනමාධ්‍ය අධ්‍යයන (CMS) යන නමින් නවීකරණයට ලක්කරන ලදී.

## ව්‍යාප්ති පාඨමාලා සහ ප්‍රජා සේවා පාඨමාලා ප්‍රදානයන්

2008 වසර තුලදී ශාස්ත්‍ර පීඨය විසින් ප්‍රජාව කෙරෙහි වෘත්තීමය දක්ෂතා වැඩි දියුණු කිරීම සඳහා බාහිර පාඨමාලා රැසක් ඉදිරිපත් කරන ලද අතර, පීඨය විශ්වවිද්‍යාලයීය සංවර්ධන අරමුදලෙහි විශාලතම දායකයා ලෙස තවදුරටත් රැඳී සිටීමට මග හෙළි කරන ලදී.  තම ජාතික මෙහෙවරෙහි හා ප්‍රජා සත්කාර දායකත්වයෙහි කොටසක් ලෙස නොයෙකුත් උපදේශක සේවා ද මෙම පීඨයෙහි අධ්‍යයනාංශ විසින් සිදුකරන ලදී.

SPSS භාවිතා කරමින් සංඛ්‍යා ‘ලේඛන පර්යේෂණ ක්‍රමවේද හා සංඛ්‍යාලේඛන දත්ත විශ්ලේෂණය’ සඳහා සහතික පත් පාඨමාලාවක් ජනගහන විද්‍යා අධ්‍යයනාංශය

විසින් පවත්වන ලද අතර සමාජ විද්‍යාවන්හි පර්යේෂණ ක්‍රමවේද යොදාගැනීම පිළිබඳව පුහුණු වැඩමුළුවක් ද පවත්වන ලදී.

ඉංග්‍රීසි බස හැදෑරීමේ පුහුණු ඒකකය විසින් ව්‍යාපාරික ඉංග්‍රීසි සඳහා ප්‍රාථමික සහ අන්තර්මධ්‍ය මට්ටම් වලින් සහතික පත් පාඨමාලා ද, ජාතික සමාජයීය සංවර්ධන ආයතනය සඳහා ඉංග්‍රීසි අභියෝග්‍යතා පාඨමාලාවක් ද ඉදිරිපත් කරන ලදී. ඒකකය විසින් භාර ගෙන ඇති ඉංග්‍රීසි බාහිර පාඨමාලා ද එසේම උපාදේශාත්මක සේවාවන් ද සුවිශේෂී අවශ්‍යතා සඳහා ඉංග්‍රීසි (ESP) යන මැය වෙත ඒකාග්‍ර කිරීමක් වශයෙන් අධ්‍යයන, රැකියා සම්බන්ධ හා වෘත්තීය අවශ්‍යතා සඳහා අවධානය යොමුකිරීම ද, ගාල්ලේ දක්ෂිණ කාර්මික විද්‍යාලයෙහි ඉංග්‍රීසි භාෂාව හා සාහිත්‍යය සඳහා විෂය නිර්දේශය සැදීම ද යන කරුණු සම්බන්ධව කටයුතු කරන ලදී. 2008 ජනවාරි මස ආරම්භ කරන ලද 2007/2008 අධ්‍යයන වසර සඳහා වන ඉංග්‍රීසි බාහිර පාඨමාලා 10 මසක කාලයක් තුල පවත්වන්නට යෙදුණි.

ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය විසින් ඩිප්ලෝමා පාඨමාලා දෙකක් ඉදිරිපත් කරන ලදී: සංචාරක හා හෝටල් කළමනාකරණය සහ සූක්ෂම මූල්‍යය වේ.

ඉංග්‍රීසි අධ්‍යයනාංශය ඉංග්‍රීසි බසින් බාහිර පාඨමාලා පැවැත්වූ අතර 5000 පමණ මහජනතාව වෙත සේවය සපයන ලදී. එසේම, නොයෙකුත් ආයතන වෙත උපදේශක සේවා සපයන ලදී. රැකියාවන්හි නියුතු අය වෙත ඉංග්‍රීසි (1 වන සහ 2 වන කොටස) නීතිය සඳහා ඉංග්‍රීසි භාෂාව (1 වන සහ 2 වන කොටස) යන සහතික පත් පාඨමාලා ද ඉදිරිපත් කරන ලදී. පරිපාලනමය හා වෘත්තීමය අවශ්‍යතා සඳහා උසස් මට්ටමේ ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලා ද, ඉංග්‍රීසි ගුරුවරුන් සඳහා ඉංග්‍රීසි (DETE) යන පාඨමාලාවද පවත්වන ලදී.

**V-02 වගුව: බාහිර පාඨමාලා සඳහා ශිෂ්‍ය ඇතුළත් වීම් - 2008**

| පාඨමාලාව | ශිෂ්‍ය සංඛ්‍යා |
|---|---|
| වෘත්තිකයන් සඳහා ඉංග්‍රීසි සහතික පත්‍රය - 1 කොටස | 861 |
| - 2 කොටස | 1101 |
| නීතිය සඳහා ඉංග්‍රීසි සහතික පත්‍රය - 1 කොටස | 22 |
| - 2 කොටස | 41 |
| පරිපාලනමය හා වෘත්තීය අවශ්‍යතා සඳහා ඉංග්‍රීසි ඩිප්ලෝමාව | |
| - ප්‍රාථමික මට්ටම | 548 |
| - අවසාන මට්ටම | 398 |
| ඉංග්‍රීසි ගුරුවරුන් සඳහා ඉංග්‍රීසි ඩිප්ලෝමාව (DETE) - I කොටස | 247 |
| - II කොටස | 173 |
| ජනමාධ්‍යවේදය සඳහා ඩිප්ලෝමාව | 152 |
| සූක්ෂම මූල්‍යය පිළිබඳ ඩිප්ලෝමාව | 24 |
| සංචාරක හා හෝටල් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව | 23 |
| **එකතුව** | **3590** |

## පශ්චාත් උපාධි පාඨමාලා

2008 වසරෙහිදී පීඨය විසින් බොහෝ පශ්චාත් උපාධි පාඨමාලා ඉදිරිපත් කරන ලදී. ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය විසින් ආර්ථික විද්‍යාව පිළිබඳ දර්ශනපති/දර්ශන ශූරී උපාධිය, ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, සහ ආර්ථික සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමා (DED) පාඨමාලාව යන පාඨමාලා ඉදිරිපත් කරන ලදී. ඉතිහාසය හා ජාත්‍යන්තර සබඳතා අධ්‍යයනාංශය විසින් ජාත්‍යන්තර සබඳතා සඳහා ශාස්ත්‍රපති උපාධියක් කරා ද දර්ශනපති/දර්ශන ශූරී පර්යේෂණ උපාධීන් කරාද පශ්චාත් උපාධි පාඨමාලා ඉදිරිපත් කරන ලදී. සමාජ විද්‍යා අධ්‍යයනාංශය විසින් ව්‍යවහාරික සමාජවිද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ද සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ද එසේම, දේශපාලන විද්‍යා හා රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ අධ්‍යයනාංශය විසින් 2008 වසරේ ජනවාරි මසදී ශාස්ත්‍රපති/දර්ශනපති හා දර්ශන ශූරී උපාධි සඳහා

පර්යේෂණ උපාධි පාඨමාලා ද පවත්වන්නට යෙදුණි. නෝර්වේ හි ඔස්ලෝ විශ්වවිද්‍යාලයෙහි සහභාගිත්වයෙන් යුක්ත ව දේශපාලන විද්‍යාව සඳහා ශාස්ත්‍රපති උපාධියක් සඳහා පාඨමාලා කාර්ය හා පර්යේෂණ උපාධි පාඨමාලාවක් දේශපාලන විද්‍යා හා රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ අධ්‍යයනාංශය විසින් ආරම්භ කරන ලදී. ඉංග්‍රීසි අධ්‍යයනාංශය විසින් ඉංග්‍රීසි පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය හා ඉංග්‍රීසි සඳහා දර්ශනපති (පර්යේෂණ) උපාධිය සඳහා පාඨමාලා පවත්වන ලදී. අධ්‍යයනාංශය විසින් පශ්චාත් උපාධි තුනක් ඉදිරිපත් කර තිබූ අතර ඒවා නම් ELT සඳහා පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, ELT සහ ඉංග්‍රීසි භාෂාව සඳහා ශාස්ත්‍රපති උපාධිය, හා ඉංග්‍රීසි භාෂාව සඳහා ශාස්ත්‍රපති උපාධිය වේ. **2008** වසර සඳහා සිංහල අධ්‍යයනාංශය විසින් ද ශාස්ත්‍රපති/දර්ශන පති/දර්ශන ශූරි උපාධි පාඨමාලා පවත්වන්නට යෙදුනි.

**2008** සැප්තැම්බර් මස 'ශනිදා පශ්චාත් උපාධි රුස්වීම' ආරම්භ කරන ලදී. මෙම රුස්වීමෙහිදී දේශපාලන විද්‍යා හා රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනාංශයෙහි පශ්චාත් උපාධි සිසුන් විසින් අධ්‍යයනාංශය විසින් අරඹා ඇති පශ්චාත් උපාධි අධ්‍යයන හා ශක්‍යතා ගොඩනැගීම් වැඩසටහනේ කොටසක් ලෙස තම මූලික පර්යේෂණ සැලැස්ම ඉදිරිපත් කරනු ලබයි.

**V-03 වගුව : පශ්චාත් උපාධි වැඩසටහන් වෙත ශිෂ්‍ය ලියාපදිංචි වීම්-2008**

| පාඨමාලාවේ නම | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|
| ව්‍යවහාරික සමාජවිද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 21 |
| ආර්ථික සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 23[1] |
| ඉතිහාසය පිළිබඳ පශ්චාත් උපාධි පර්යේෂණ (ශාස්ත්‍රපති හා දර්ශනපති) | 12 |
| ශාස්ත්‍රපති පර්යේෂණ | 30 |
| ශාස්ත්‍රපති පාඨමාලාව හා පර්යේෂණ උපාධිය | 22 |
| සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | 17 |
| ඉංග්‍රීසි පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (පර්යේෂණ) | 04 |
| ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | 40[1] |
| මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | 70[1] |
| ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | 47<br>73[2] |
| ඉංග්‍රීසි පිළිබඳ දර්ශනපති උපාධිය (පර්යේෂණ) | 01 |
| ආර්ථික විද්‍යාව පිළිබඳ දර්ශනපති/දර්ශනශූරි උපාධිය | 07 |
| දර්ශන පති/දර්ශන ශූරි උපාධිය (පර්යේෂණ) | 10 |
| ශාස්ත්‍රපති/දර්ශන පති/දර්ශනශූරි උපාධිය | 30 |
| **එකතුව** | **407** |

1 : 2007 අරඹන ලදී 2: 2009 වසර සඳහා තේරී ඇති

**V-04 වගුව : පශ්චාත් උපාධි අධ්‍යයනයන් හි නිරත කාර්ය මණ්ඩලය – 2008**

| අධ්‍යයනාංශය | දර්ශනශූරි උපාධිය හදාරමින් සිටින | ශාස්ත්‍රපති උපාධිය හදාරමින් සිටින | ශාස්ත්‍රපති උපාධිය සම්පූර්ණ කර ඇත |
|---|---|---|---|
| ජනගහන විද්‍යා | 04 | - | - |
| ඉංග්‍රීසි | 02 | - | - |
| භූගෝලවිද්‍යා | 06 | 01 | - |
| දේශපාලන විද්‍යාව හා රාජ්‍ය ප්‍රතිපත්ති | 05 | 01 | - |
| සමාජ විද්‍යා | 04 | - | - |
| ආර්ථික විද්‍යා | 02 | - | - |
| සිංහල | 02 | - | - |
| ඉතිහාසය හා ජාත්‍යන්තර සබඳතා | 03 | - | - |
| අයි. සී. ටී. ඒකකය | - | 02 | - |
| ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ ඒකකය | 01 | 12 | 01 |

## දේශීය හා ජාත්‍යන්තර මට්ටමින් අධ්‍යයන කාර්ය මණ්ඩලයෙහි දායකත්වය

| | | |
|---|---|---|
| ආචාර්ය ආර්.ඩබ්.ටී.බී. රංජිත් බණ්ඩාර | මහාචාර්ය ලක්සිරි ප්‍රනාන්දු | මහාචාර්ය එම්.ජී.ඒ. කුරේ |
| ආචාර්ය ටී.එල්. ගුණරුවන් | මහාචාර්ය ජයදේව උයන්ගොඩ | ආචාර්ය නෙලුකා සිල්වා |
| මහාචාර්ය අමල් ජයවර්ධන | මහාචාර්ය ජයන්ති ද සිල්වා | මහාචාර්ය දුෂ්‍යන්ති මැන්දිස් |
| මහාචාර්ය එස්. ටී. හෙට්ටිගේ | මහාචාර්ය ඩබ්. අයි. ද සිල්වා | කමල් වලේබොඩ මහතා |
| මහාචාර්ය රමණී ජයතිලක | මහාචාර්ය කේ. ඒ. පී. සිද්ධිසේන | ආචාර්ය අජන්ත හපුආරච්චි |
| ආචාර්ය එස්. එම්. කේ. හේරත් | මහාචාර්ය ශිරෝමි ප්‍රනාන්දු | එස්. මහේසන් මිය |
| මහාචාර්ය නයනි මෙලගොඩ | මහාචාර්ය නෙලූෆ ද මෙල් | එම්. එම්. එම්. සබීර් |
| ආචාර්ය ඩී. එන්. එන්. ආර් දේවසිරි | ජගත් වැල්ලවත්ත මහතා | |

### V-05 වගුව: ප්‍රකාශන හා ඉදිරිපත් කිරීම්

| අධ්‍යයනාංශය | ලේඛන හා ග්‍රන්ථ | ඉදිරිපත් කිරීම් |
|---|---|---|
| ජනගහන විද්‍යා | 07 | 03 |
| ආර්ථික විද්‍යා | 11 | - |
| ඉංග්‍රීසි | 05 | 06 |
| භූගෝලවිද්‍යා | 13 | 12 |
| ඉතිහාසය හා ජාත්‍යන්තර සබඳතා | - | 02 |
| දේශපාලන විද්‍යාව හා රාජ්‍ය ප්‍රතිපත්ති | 07 | - |
| සිංහල | 03 | - |
| සමාජ විද්‍යා | 08 | 01 |

## යටිතල පහසුකම් සංවර්ධනය

උපාධි අපේක්ෂකයින්ගේ අධ්‍යාපනයෙහි අදාලත්වය හා ගුණත්වය වර්ධනය කිරීමේ ව්‍යාපෘතියෙහි (IRQUE) සමාජ සහයෝගිතා වැඩසටහන යටතේ නව කලාගාරයෙහි (NAT) නව ආලෝකකරණ හා ශබ්ද වාහිනී යන්ත්‍ර සවි කරන ලදී.

## 02. අධ්‍යාපන පීඨය

### හැඳින්වීම

දශක තුනක කාලයක් මුළුල්ලේ රජයේ හා පෞද්ගලික පාසල් වල සේවයෙහි නියුතු උපාධිධාරී ගුරුවරුන් හට වෘත්තිය පුහුණුවක් ලබා දුන් එකම පීඨය අධ්‍යාපන පීඨය වේ. 2008 වසර තුල අධ්‍යාපනවේදී ප්‍රථම උපාධි පාඨමාලා පවත්වන අතරම ප්‍රජා සංවර්ධනය සහ උපදේශනය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමා ද ඇතුළුව අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාල තවත් පශ්චාත් උපාධි පාඨමාලා කිහිපයක් ම පීඨය විසින් පවත්වනු ලැබිය. මාධ්‍ය තුනෙන් ම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව පැවැත්වීම පීඨය විසින් තව දුරටත් කරන ලදී.

### කාර්ය මණ්ඩල තොරතුරු

සමාලෝචනය ට ලක් ව ඇති වසර තුල 2008.01.06 සිට 2008.08.30 දක්වා තෙමස තුල සප්තවාර්ෂික නිවාඩු ලබාගත් කාලය හැරුණු විට මහාචාර්ය එස්. සන්දරසේගරම් අඛණ්ඩව අධ්‍යාපන පීඨයෙහි පීඨාධිපති ලෙස කටයුතු කෙළේය. මෙම කාලය තුල මහාචාර්ය එම්. ඊ. එස්. පෙරේරා සහ ඩබ්. එම්. ප්‍රඥාදර්ශන මහතා පිළිවෙලින් 2008.06.01 සිට 2008.07.15 දක්වා ද 2008.07.16 දින සිට 2008.08.30 දක්වා වැඩ බලන පීඨාධිපති ලෙස කටයුතු කරන ලදී. 2008.10.09 දින සිට ඩී. නාගසිංහ මහතා ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී තනතුරට උසස් කරන ලදී.

අධ්‍යයන කාර්ය මණ්ඩලයෙහි සාමාජිකයන් 29 දෙනෙකු සිටි අතර ඊට මහාචාර්යවරුන් දෙදෙනෙක් (02) ද, සහාය මහාචාර්යවරුන් දෙදෙනෙක් (02) ද, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් එකොළොස් (11) දෙනෙක් ද, කථිකාචාර්යවරුන් දහහතර (14) දෙනෙක් ද වූහ. පීඨයෙහි අනෙකුත් කාර්ය මණ්ඩලය ට එක් (01) පරිපාලන නිලධාරියෙක් ද අධ්‍යයන සහයක කාර්ය මණ්ඩලයෙහි එක් (01) නිලධාරියෙක් ද අනධ්‍යයන කාර්ය මණ්ඩලයෙහි සාමාජිකයන් 17 දෙනෙකුද අයත් වේ.

විද්‍යා සහ තාක්ෂණ අධ්‍යාපනය පිළිබඳ අධ්‍යයනාංශය, සමාජ විද්‍යා අධ්‍යාපන අධ්‍යයනාංශය සහ අධ්‍යාපන මනෝ විද්‍යාව පිළිබඳ අධ්‍යයනාංශය යන අංශ වල අංශ ප්‍රධානීන් ලෙස ඩබ්. එම්. ප්‍රඥාදර්ශන මහතා, ආචාර්ය ඒ. ඒ. ජයවර්ධන හා ආචාර්ය ඩබ්. චන්ද්‍රදාස විසින් කටයුතු කරන ලදී. කාර්ය මණ්ඩල සංවර්ධන කේන්ද්‍රයෙහි අධ්‍යක්ෂ ධූරය භාර ගැනීම සඳහා 2008.08.15 වන දින මානව ශාස්ත්‍ර අධ්‍යාපන අංශයෙහි අංශ ප්‍රධානී ධූරයෙන් මහාචාර්ය එම්. ඊ. එස්. පෙරේරා මෙනෙවිය ඉල්ලා අස් විය. 2008.08.15 දින සිට ඩී. ආර්. අතුකෝරල මහතා එම අංශයේ අංශ ප්‍රධාන ලෙස පත් කරන ලදී.

සමාලෝචනයට ලක් කර ඇති වසර තුල, ජේ. හේරත් (සමාජීය විද්‍යා අධ්‍යාපන) සහ එස්. සෙනරත් (අධ්‍යාපන මනෝ විද්‍යා) යන කථිකාචාර්ය මහත්මීන් දර්ශනපති උපාධිය ඔස්සේ දර්ශන ශූරි උපාධිය දක්වා හැදෑරීම සඳහා අධ්‍යයන නිවාඩු ලබා සිටියහ.

ආචාර්ය එම්. කරුණානිධි ජාතික අධ්‍යාපන පර්යේෂණ සහ ඇගයීම් මධ්‍යස්ථානයෙහි අධ්‍යක්ෂක ලෙස තව දුරටත් කටයුතු කෙළේය.

2008.10..24 වන දින පැවති එක් දින අධ්‍යයන සැසියකට සියළු අධ්‍යයන කාර්ය මණ්ඩලය සහභාගි වූ අතර එහිදී පත්‍රිකා 15ක් ඉදිරිපත් වූ අතර සාකච්ඡාවට බඳුන් විය. අධ්‍යයන සැසි වල ප්‍රධාන අමුත්තා ලෙස කළමනාකරණ හා මූල්‍ය පීඨාධිපති ආචාර්ය පී.එස්.එම්. ගුණරත්න මහතා සහභාගී විය.

නව දිල්ලි නුවර ජාතික අධ්‍යාපන සැලසුම්කරණ විශ්වවිද්‍යාලයෙහි 2008.04.01 දින සිට 2008.04.30 දින දක්වා පැවැත් වූ පුහුණු පාඨමාලාවකට පීඨයෙහි

කථිකාචාර්යවරුන් අට දෙනෙක් ද සහභාගී වූහ. ලෝක බැංකුවෙහි ESDFP ප්‍රදානය මගින් මූල්‍ය දායකත්වය ලබා දෙන ලදී.

**V-06 වගුව : පත්වීම් සහ උසස් කිරීම්**

| අධ්‍යයනාංශය සහ නම | තනතුර | ක්‍රියාත්මක දිනය |
|---|---|---|
| **පත් කිරීම්** | | |
| **මානව ශාස්ත්‍ර අධ්‍යාපනය** | | |
| මහාචාර්ය එම්.ඊ.එස්. පෙරේරා | මහාචාර්ය | 2007.02.05 |
| | අධ්‍යක්ෂ (සේවක සංවර්ධන කේන්ද්‍රය) | 2008.09.15 |
| **සමාජ විද්‍යා අධ්‍යාපනය** | | |
| ආචාර්ය එල්.කේ. පුංචි වෙඩික්කාර | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | 2008.11.28 |

## රැස්වීම්

සමාලෝචිත වසර තුළ පීඨ සභාව නව වරක් රැස්වූහ. ඊට අමතරව අධ්‍යයන, පරිපාලනමය හා වෙනත් අදාල කරුණු සාකච්ඡා කිරීම සඳහා තවත් රැස්වීම් කිහිපයක් පවත්වන ලදී.

## ප්‍රථම උපාධි අධ්‍යයන පාඨමාලා

පීඨය සාර්ථක ලෙස අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව සිංහල, ඉංග්‍රීසි හා දෙමළ යන භාෂා මාධ්‍ය වලින් පැවැත්විය.

අවසන් වසර B.Ed සිසුන් සඳහා ඉංග්‍රීසි භාෂා දැනුම වැඩිදියුණු කිරීම සඳහා මානව ශාස්ත්‍ර අධ්‍යාපන අධ්‍යයනාංශය විසින් කෙටි පාඨමාලාවක් පවත්වන ලදී. මෙම වැඩසටහන එක දිගට පැවැත්වූ සිව් වන වසර මෙය වේ.

විද්‍යා හා තාක්ෂණ අධ්‍යාපන අංශය, සමාජ විද්‍යා අධ්‍යාපන අංශය හා අධ්‍යාපන මනෝ විද්‍යා අංශය විසින් නව දූරටත් අධ්‍යාපනවේදී ප්‍රථම උපාධි පාඨමාලාවට සඳහා ගුරු වෘත්තිය ට අදාල පාඨමාලා ඒකක ඉදිරිපත් කරන ලදී.

**V-07 වගුව : ප්‍රථම උපාධි අපේක්ෂකයින් බඳවා ගැනීම**

| පාඨමාලාව | | සිසුන් සංඛ්‍යාව | | එකතුව |
|---|---|---|---|---|
| | | පුරුෂ | ස්ත්‍රී | |
| අධ්‍යාපනවේදී I කොටස | සිංහල | 13 | 112 | **125** |
| | දෙමළ | 01 | 17 | **18** |
| | ඉංග්‍රීසි | 04 | 19 | **23** |
| අධ්‍යාපනවේදී II කොටස | සිංහල | 04 | 73 | **77** |
| | දෙමළ | 02 | 23 | **25** |
| | ඉංග්‍රීසි | 04 | 10 | **14** |
| අධ්‍යාපනවේදී III කොටස | සිංහල | 11 | 110 | **121** |
| | දෙමළ | 01 | 15 | **16** |
| | ඉංග්‍රීසි | 04 | 12 | **16** |
| **එකතුව** | | **04** | **391** | **435** |

## පශ්චාත් උපාධි වැඩසටහන්

මෙම වසරෙහිදීද සමාජ විද්‍යා අධ්‍යාපන, විද්‍යා හා තාක්ෂණ අධ්‍යාපන, සමාජ ශාස්ත්‍ර සහ අධ්‍යාපන මනෝවිද්‍යා යන අධ්‍යයනාංශ විසින් පශ්චාත් උපාධි පාඨමාලා පැවැත්වීම සඳහා දායක විය. දර්ශනපති හා දර්ශන ශුරි උපාධි අපේක්ෂක සිසුන්ගේ නිබන්ධන අධීක්ෂණය මෙම අධ්‍යයනාංශ වල ජ්‍යෙෂ්ඨ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් විසින් සිදුකරන ලදී.

සමාජ ශාස්ත්‍ර අධ්‍යාපන අධ්‍යයනාංශය විසින් පීඨයෙහි අනෙකුත් අධ්‍යයනාංශ වල කථිකාචාර්යවරුන්ගේ සහ සී. කාරියවසම් මහතා, එල්. කුමාරණතුංග මිය සහ කමලා විජේරත්න මිය වැනි වෘත්තිය නිපුණත්වයක් ඇති බාහිර පාර්ශ්වයන්හි සහාය ද ලබා ගනිමින් ඉංග්‍රීසි ද්විතියික භාෂාවක් ලෙස ඉගැන්වීම පිළිබඳ පූර්ණ කාලීන පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව (TESL) තවදුරටත් ඉදිරිපත් කරයි.

සමාජ විද්‍යා අධ්‍යාපන අධ්‍යයනාංශය දේශන පැවැත්වීම්, නිබන්ධන, වැඩමුළු, සම්මන්ත්‍රණ හා නිබන්ධන අධීක්ෂණ ඔස්සේ පීඨය විසින් ඉදිරිපත් කරන සියළු පාඨමාලා වෙත තම දායකත්වය ලබා දෙයි. ප්‍රජා සංවර්ධන පාඨමාලාව සඳහා **2009** වසරට ශිෂ්‍යයන් බඳවා ගැනීම සඳහා අධ්‍යයනාංශය විසින් පුවත්පත් දැන්වීමක් ද පළ කරන ලදී.

විද්‍යා හා තාක්ෂණ අධ්‍යාපන අධ්‍යයනාංශය සියළු පශ්චාත් උපාධි පාඨමාලා පවත්වාගෙන යාම සඳහා අනෙකුත් අධ්‍යයනාංශ සමග එක්වෙමින් සහය දක්වා ඇත.

පීඨයෙහි අනෙකුත් අධ්‍යයනාංශ විසින් ඉදිරිපත් කර ඇති පශ්චාත් උපාධි පාඨමාලා සඳහා සහය දෙන අතර, අධ්‍යාපන මනෝ විද්‍යා අධ්‍යයනාංශය විසින් උපදේශනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව සඳහා **2009** වසරට දැන්වීමක් පළ කර ඇත.

මෙම පාඨමාලා සාර්ථක ලෙස ලබා දීමට අනෙකුත් අධ්‍යයනාංශ වල අධ්‍යයන කාර්ය මණ්ඩලය ද එසේම අදාල ක්ෂේත්‍ර වලට සම්බන්ධ බාහිර වෘත්තීය නිපුණත්වයෙන් යුත් පාර්ශ්ව ද තව දුරටත් කටයුතු කළහ.

**V-08 වගුව : පශ්චාත් උපාධි ශිෂ්‍ය ඇතුළත්වීම්**

*(උපාධිය සහ ස්ත්‍රී පුරුෂ භාවය මත වර්ගීකරණය කර ඇත.)*

| පාඨමාලාව | ශිෂ්‍ය සංඛ්‍යාව | | එකතුව |
|---|---|---|---|
| | පුරුෂ | ස්ත්‍රී | |
| අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (පූර්ණ කාලීන) – සිංහල මාධ්‍ය | 48 | 113 | **161** |
| අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (පූර්ණ කාලීන) – දෙමළ මාධ්‍ය | 22 | 11 | **33** |
| ඉංග්‍රීසි ද්විතියික භාෂාවක් ලෙස ඉගැන්වීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (TESL) | 15 | 18 | **33** |
| දර්ශනශූරි | 08 | 04 | **12** |
| **එකතුව** | **93** | **145** | **238** |

## ව්‍යාප්ති පාඨමාලා/ප්‍රජා සේවා දායක පාඨමාලා වැඩසටහන්

පීඨය තවදුරටත් ව්‍යාප්ති පාඨමාලා ඉදිරිපත් කළ අතර අර්ධ කාලීන සිසුන් ලෙස ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව V-09 වගුවෙහි දැක්වේ.

**V-09 වගුව : ව්‍යාප්ති පාඨමාලා වෙත ශිෂ්‍ය ඇතුළත්වීම්**

| පාඨමාලාව | | ශිෂ්‍ය සංඛ්‍යාව | | එකතුව |
|---|---|---|---|---|
| | | පුරුෂ | ස්ත්‍රී | |
| අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව | සිංහල | 394 | 1026 | **1420** |
| | ඉංග්‍රීසි | 16 | 62 | **78** |

**V-10 වගුව : වැඩමුළු හා පුහුණු වැඩසටහන් වල කාර්ය මණ්ඩල සහභාගිත්වය**

*(කාර්ය මණ්ඩලය/අංශය, පුහුණු පාඨමාලාව අනුව වර්ගීකරණය කර ඇත)*

| **නම සහ අංශය** | **පුහුණු වැඩසටහන/වැඩ මුළුව** | **ස්ථානය** |
|---|---|---|
| **අධ්‍යාපන මනෝවිද්‍යාව** | | |
| ආචාර්ය ඩබ්. චන්ද්‍රදාස | අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ පුහුණු පාඨමාලාව | NUEPA, නව දිල්ලිය, ඉන්දියාව |

| | | |
|---|---|---|
| ආචාර්ය එම්. විතානපතිරණ | මනෝ විද්‍යාව හා උපදේශනය පිළිබඳ නවකයින් සඳහා වැඩසටහන් | මානසික පීඩා නැවත ස්ථාවර කිරීම හා මානසික සෞඛ්‍යය සඳහා සමුත්තාන සම්පත් කේන්ද්‍රය |
| ආර්. ඩී. සී. නිරෝපිණී මිය<br>වයි. සක්තිවේල් | උසස් අධ්‍යාපනය තුළ ඉගැන්වීම පිළිබඳ සහතිකය (CTHE) | කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය – කොළඹ විශ්වවිද්‍යාලය |
| **සමාජ විද්‍යා අධ්‍යාපනය** | | |
| මහාචාර්ය එස්. සන්දිරසේගරම් | දැනුම සම්බන්ධ ආර්ථිකය පිළිබඳ වැඩමුළුව | සියොල්, දකුණු කොරියාව |
| එස්. ගලගම මහතා<br>එල්. එන්. පී. වැලිකන්දගේ | අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන | NUEPA, නව දිල්ලිය, ඉන්දියාව |
| **මානව ශාස්ත්‍ර අධ්‍යාපනය** | | |
| මහාචාර්ය එම්. ඊ. එස්. පෙරේරා | ගුරු අධ්‍යාපනයෙහි තත්ත්ව සහතික කිරීම පිළිබඳ වැඩමුළුව | ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය හා කැනඩාවේ Commonwealth of Learning විසින් සංවිධානය කරන ලදී |
| එස්. එන්. රාජේන්ද්‍රම් | ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම සහ ICT | IPBA ක්වාලා ලම්පූර්, මැලේසියා |
| එල්. එම්. කේ. බණ්ඩාර මහතා<br>එස්. එස්. දහනායක | අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන | NUEPA, නව දිල්ලිය, ඉන්දියාව |
| ඊ. එස්. නෙරන්ජනී මිය | උසස් අධ්‍යාපනය තුළ ඉගැන්වීම පිළිබඳ සහතික (CTHE) පාඨමාලාව සම්පූර්ණ කරන ලදී | කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය – කොළඹ විශ්වවිද්‍යාලය |
| **විද්‍යා හා තාක්ෂණ අධ්‍යාපනය** | | |
| මහාචාර්ය ඩබ්. ජී. කරුණාරත්න | පාසල් විද්‍යා ව්‍යාපෘතිය පිළිබඳ වැඩමුළුව | NSF |
| පී. කේ. ජේ. ඊ. නෝනිස් | අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන | NUEPA, නව දිල්ලිය, ඉන්දියාව |
| ඩී. වී. කේ. පී. සෙනෙවිරත්න මිය | උසස් අධ්‍යාපනය තුළ ඉගැන්වීම පිළිබඳ සහතික (CTHE) පාඨමාලාව සම්පූර්ණ කරන ලදී | කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය – කොළඹ විශ්වවිද්‍යාලය |

### V-11 වගුව : පශ්චාත් උපාධි අධ්‍යාපනය ලබමින් සිටින අධ්‍යයන කාර්ය මණ්ඩල තොරතුරු

| අධ්‍යයනාංශය | දර්ශන ශූරී උපාධිය හදාරමින් සිටී | ශාස්ත්‍රපති උපාධිය හදාරමින් සිටී | ශාස්ත්‍රපති උපාධිය සම්පූර්ණ කර ඇත |
|---|---|---|---|
| අධ්‍යාපන මනෝ විද්‍යාව | 01 | 01 | - |
| සමාජ විද්‍යා අධ්‍යාපනය | 03 | 01 | - |
| සමාජ ශාස්ත්‍ර අධ්‍යාපනය | - | 03 | - |
| විද්‍යා හා තාක්ෂණ අධ්‍යාපනය | - | 02 | 01 |

### V -12 වගුව : ප්‍රථම උපාධි හා පශ්චාත් උපාධි පාඨමාලා සම්බන්ධීකාරකවරුන්

| පාඨමාලාව | නම සහ අධ්‍යයනාංශය |
|---|---|
| පදනම් පාඨමාලාව | එල්. එම්. කේ. බණ්ඩාර (මානව ශාස්ත්‍ර) |
| අධ්‍යාපනවේදී - I කොටස<br>II කොටස<br>III කොටස | එස්. ගලගම (සමාජ විද්‍යා)<br>ආචාර්ය ඒ. ඒ. ජයවර්ධන (සමාජ විද්‍යා)<br>ආචාර්ය ඩබ්. චන්ද්‍රදාස (අධ්‍යාපන මනෝ විද්‍යාව) |
| අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (පූර්ණ කාලීන) සිංහල මාධ්‍ය | සී. කස්තුරි ආරච්චි මහතා (සමාජ විද්‍යා) |
| අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (පූර්ණ කාලීන) දෙමළ මාධ්‍ය | ආචාර්ය එම්. කරුණානිධි (සමාජ විද්‍යා) |
| අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි | එස්. රාජේන්ද්‍රම් (මානව විද්‍යා) |

| | |
|---|---|
| ඩිප්ලෝමාව (පූර්ණ කාලීන) ඉංග්‍රීසි මාධ්‍ය | |
| අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (සති අන්ත) සිංහල මාධ්‍ය | ඩබ්. එම්. ප්‍රඥාදර්ශන මහතා (විද්‍යා හා තාක්ෂණ) සහ එස්. ගලගම (සමාජ විද්‍යා) |
| අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (අර්ධ කාලීන) සිංහල මාධ්‍ය | ආචාර්ය එම්. විතානපතිරණ (අධ්‍යාපනික මනෝවිද්‍යා) |
| ප්‍රජා සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | ආචාර්ය ඒ. ඒ. ජයවර්ධන (සමාජ විද්‍යා) |
| උපදේශනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | මහාචාර්ය ආර්. අබේපාල (අධ්‍යාපනික මනෝවිද්‍යාව) ආර්. ඩී. සී. නිරෝෂිණී |
| අධ්‍යාපනපති | එන්. වී. කරුණාසේන (විද්‍යා හා තාක්ෂණ) |
| දර්ශන පති | මහාචාර්ය ආර්. අබේපාල (අධ්‍යාපනික මනෝ විද්‍යාව) |
| දර්ශන ශූරි | මහාචාර්ය එස්. සන්දිරසේගරම් (සමාජ විද්‍යා) |

## දේශීය හා ජාත්‍යන්තර මට්ටමෙහි අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල දායකත්වය

ආචාර්ය එම්. ර්. එස්. පෙරේරා (මානව විද්‍යා අධ්‍යාපනය)
ඩී. ආර්. අතුකෝරල මහතා (මානව විද්‍යා අධ්‍යාපනය)
මහාචාර්ය එස්. සන්දිරසේගරම් (සමාජ විද්‍යා අධ්‍යාපනය)
ආචාර්ය ඒ. ඒ. ජයවර්ධන (සමාජ ශාස්ත්‍ර අධ්‍යාපනය)
ආචාර්ය එම්. කරුණානිධි (සමාජ ශාස්ත්‍ර අධ්‍යාපනය)
ආචාර්ය ඩබ්. චන්ද්‍රදාස (අධ්‍යාපනික මනෝ විද්‍යා)
ආචාර්ය එම්. විතානපතිරණ (අධ්‍යාපනික මනෝ විද්‍යා)
මහාචාර්ය ඩබ්. ජී. කරුණාරත්න (විද්‍යා හා තාක්ෂණ අධ්‍යාපනය)

**V-13 වගුව : ප්‍රකාශන හා ඉදිරිපත්කිරීම්**

| ප්‍රකාශන | අධ්‍යයනාංශය | | | |
|---|---|---|---|---|
| | මානව විද්‍යා අධ්‍යාපන | සමාජ විද්‍යා අධ්‍යාපන | අධ්‍යාපනික මනෝ විද්‍යා | විද්‍යා හා තාක්ෂණ අධ්‍යාපනය |
| ප්‍රකාශන | 04 | 03 | 02 | 02 |
| ග්‍රන්ථ | 05 | - | 02 | - |
| හඳුන්වාදීමේ වැඩසටහන්/ප්‍රධාන දෙසුම් | 02 | 01 | - | - |
| පර්යේෂණ | 02 | 06 | 02 | 02 |

## ශිෂ්‍ය කටයුතු

පීඨයෙහි ශිෂ්‍ය සංගමය සඳහා නිලධාරී මණ්ඩලය 2008.09.02 දින නිතරගයෙන් පත් විය.

## යටිතල පහසුකම් සංවර්ධනය

2008 වසර සඳහා පීඨය වෙත වෙන් කර ඇති ලෝක බැංකු ආධාර උපයෝගී කරමින් දේශන ශාලා අංක 1 අළුත්වැඩියා කර ප්‍රමාණයෙන් විශාල කරන ලදි.

## 03. නීති පීඨය

### හැඳින්වීම

නීති පීඨයෙහි පීඨාධිපති ලෙස එන්. සෙල්වක්කුමාරන් මහතා අඛණ්ඩව කටයුතු කළ අතර, ආචාර්ය ඩී. උඩගම නීති අධ්‍යයනාංශයෙහි අංශාධිපති ලෙස 2008.08.14 දින දක්වා කටයුතු කළාය. 2008.08.15 දින අයි. නානායක්කාර මිය අංශාධිපති ලෙස පත් කරන ලදී.

ඉන්දිරා නානායක්කාර මිය විභාග කටයුතු පිළිබඳ සම්බන්ධීකාරක ලෙස 2008.08.14 දින දක්වා කටයුතු කළ අතර 2008.09.01 දින සිට දෙවසරක කාලයක් සඳහා ආර්. විජේසේකර මිය එම තනතුරට පත් කරන ලදී. නීති පීඨයෙහි සහකාර ලේඛකාධිකාරී ලෙස එච්. කේ. එස්. ඩී. ගීගනගේ මිය වැඩ භාර ගත්තාය. 2008 ජනවාරි මස සිට මෙම විශ්වවිද්‍යාලයෙහි ක්‍රීඩා මණ්ඩලයෙහි සභාපති ලෙස එන්. සෙල්වක්කුමාරන් මහතා පත් කරන ලදී. 2008 අගෝස්තු මස සිට අතිගරු ජනාධිපතිතුමන් විසින් ඒ මහතා ශ්‍රී ලංකා රාජ්‍ය භාෂා කොමිෂන් සභාවෙහි සාමාජිකයෙකු ලෙසද පත් කරන ලදී.

**පීඨයෙහි 60 වන සංවත්සර උත්සවය**

පීඨයෙහි 60 වන සංවත්සර උත්සවය මෙම වසර තුළ සාර්ථක ලෙස පවත්වන ලදී. පීඨය විසින් මෙම සමරු වැඩසටහනෙහි දී අධ්‍යයන සැසි, ප්‍රදර්ශන, දේශන, ශිෂ්‍ය ඉදිරිපත් කිරීම්, නීති උපදෙස් සායන ආදිය පවත්වන ලදී. 2008 ඔක්තෝබර් මස 24 සහ 25 යන දෙදින මෙම අධ්‍යයන සැසි පවත්වන ලදී. නීති විශාරදයන් බොහෝ දෙනෙකු විසින් පත්‍රිකා ඉදිරිපත් කරමින් මෙම සැසි වලට සහභාගී වන ලදී.

**ජාතික නීති සතිය**

ශ්‍රී ලංකා නීතිඥ සංගමය පීඨය සමග සම්බන්ධව "ජාතික නීති සතිය" ක් නීති පීඨයෙහි පවත්වන ලදී. එහිදී ප්‍රජා දැනුවත් කිරීම් ප්‍රදර්ශන සහ නොමිලේ නීති උපදේශන වැඩසටහන් 2008 මාර්තු මස 15 සහ 16 යන දින වල පවත්වන ලදී.

### කාර්ය මණ්ඩල තොරතුරු

අධ්‍යයන කාර්ය මණ්ඩලයෙහි ස්ථිර සාමාජිකයින් විසිනව (29) දෙනෙකු වූ අතර ඊට එක් (01) සහාය මහාචාර්යවරියක ද ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් දහ හතර (14) දෙනෙක් ද කථිකාචාර්යවරුන් දෙදෙනෙකු ද (02) පරිවාස කථිකාචාර්යවරුන් දොළොස් (12) දෙනෙකු ද අයත් විය.

නිර්මලා පෙරේරා මිය තව දුරටත් සප්ත වාර්ෂික නිවාඩු ලබා සිටි අතර ආචාර්ය ඩී. උඩගම මිය වෙත ඔක්තෝබර් මස සිට සප්ත වාර්ෂික නිවාඩු ප්‍රදානය කරන ලදී. ආචාර්ය එන්. ඩයස් පියතුමා ද ශ්‍රී ලංකාවෙහි ගත කිරීමට නියමිත සප්ත වාර්ෂික නිවාඩු ලබා සිටියේය.

### රැස්වීම්

පීඨ සභාව වසර තුළ දී දහතුන් වතාවක් රැස් වූ අතර උසස් උපාධි කමිටුව දහතුන් වතාවක් රැස්වූහ.

**V-14 වගුව : පශ්චාත් උපාධි හදාරමින් සිටින අධ්‍යයන කාර්ය මණ්ඩලය**

| පීඨය | දර්ශනශූරී | නීතිපති |
|---|---|---|
| නීති | 02 | 03 |

## ප්‍රථම උපාධි වැඩසටහන

2007/08 අධ්‍යයන වර්ෂය 2007.10.01 දින ආරම්භ වූ අතර 2008 වසර මුළුල්ලෙහි පැවැත්විණ. වාර්ෂික විභාග 2008.06.09 දින ඇරඹී 2008.07.30 දින අවසන් විය. 2008 අගෝස්තු මස දී නැවත විභාගයට පෙනී සිටිය යුතු සිසුන්ගේ ඇතුළුව හතර වන වසරේ විභාග ප්‍රතිඵල නිකුත් කරන ලද්දේ 2008 ඔක්තෝබර් මස ශ්‍රී ලංකා නීති විද්‍යාලය මගින් පවත්වනු ලබන නීතිඥ වෘත්තිය සඳහා අධ්‍යයනය කිරීමේ පාඨමාලාවෙහි අවසන් විභාගය සඳහා පෙනී සිටීමට හැකි වන අයුරිනි.

2008.10.06 දින පීඨයෙහි 2008/09 අධ්‍යයන වසර ආරම්භ වුවද, නීති අධ්‍යයනය ඇරඹීමට පෙර මාස එක හමාරක් මුළුල්ලේ කඩිනම් ඉංග්‍රීසි පාඨමාලාවක් පවත්වන ලදී. නවකයින්හට පාසල් දිවියෙහි සිට උපාධි අපේක්ෂක දිවියට හැඩ ගැසීමට උපකාරී වීම සඳහා දිශානිමුඛකරණ පාඨමාලාව ද මෙම කාල සීමාවෙහිදීම පැවැත්වන ලදී. පළපුරුද්ද හා සුදුසුකම් සහිත බොහෝ සම්පත් දායකයින් විශ්වවිද්‍යාලය තුළින් හා බාහිරින් මෙම වැඩසටහනට සහභාගී වූහ.

**V-15 වගුව : ප්‍රථම උපාධි අපේක්ෂක ඇතුළත්වීම්**

| පාඨමාලාව | පුරුෂ | ස්ත්‍රී | එකතුව |
|---|---|---|---|
| LLB පළමු වසර | 39 | 162 | 228 * |
| දෙවන වසර | 39 | 172 | 211 |
| තෙවන වසර | 38 | 157 | 195 |
| සිවු වන වසර | 33 | 153 | 186 |

* යාපනය සරසවියෙන් මාරු කර එවන ලද සිසුන් 27 දෙනා ද ඇතුළුව

## පශ්චාත් උපාධි පාඨමාලා

2007 හිදී ආරම්භ කරන ලද නීතිපති පාඨමාලාව පීඨය තවදුරටත් පවත්වාගෙන යන ලදී. එහි අවසන් විභාගය 2008 ජූලි මස 5 වන දින පවත්වන ලදී.

ඉදිරිපත් කරනු ලබන විෂයයන් වනුයේ උසස් සමාගම් නීතිය, බැංකු හා මූල්‍ය ආයතන ආශ්‍රිත නීතිය, ජාත්‍යන්තර වාණිජ බේරුම්කරණය, ජාත්‍යන්තර වෙළඳ නීතිය, කම්කරු නීතිය, ව්‍යවස්ථා නීතිය, ජාත්‍යන්තර මානව ශාස්ත්‍ර නීතිය, සාගර නීතිය හා ළමා අයිතිවාසිකම් හා ස්ත්‍රී අයිතිවාසිකම් පිළිබඳ නීතිය වේ.

2007/08 වැඩසටහන සඳහා මුළු සිසුන් සංඛ්‍යාව වූයේ 116 ක් වන අතර ඉන් 56 දෙනෙකු පිරිමි ද 51 දෙනෙකු ගැහැණු ද වූහ.

මෙම ශිෂ්‍ය ප්‍රජාව අධිකරණ නිලධාරීන්, රජයේ සහ රජයේ නොවන පුද්ගලික නීතිඥවරුන්, වාණිජ හා බැංකු ක්ෂේත්‍ර වල සේවයේ නියුතු නීති නිලධාරීන්ගෙන් සමන්විත විය.

2008 ජූනි මාසයේදී 2005/06 නීතිපති පාඨමාලා විභාග ප්‍රතිඵල නිකුත් කරන ලදී. නීතිය පිළිබඳ දර්ශනපති හා දර්ශනශූරී පාඨමාලා සුපුරුදු ලෙස වසර මුළුල්ලේම පැවැත්විණ.

### ප්‍රජා සේවා සැපයීමේ පාඨමාලාව

ව්‍යවස්ථා කටයුතු හා ජාතික ඒකාග්‍රතාව පිළිබඳ අමාත්‍යාංශයෙහි අධිකරණයට සම අවස්ථා ව්‍යාපෘතිය (UNDP) මගින් අනුග්‍රහයෙන් නීති පීඨය මගින් නීති උපදෙස් හා සාක්ෂරතා වැඩසටහන් සංවිධානය කරන ලදී. මෙම වැඩසටහන් පීඨයෙහි 60 වන සංවත්සර උත්සවයෙහි අංග වශයෙන් පුත්තලම, ඇඹිලිපිටිය, හැටන් හා නාත්තණ්ඩිය යන ප්‍රදේශ වල දී පවත්වන ලදී.

### කේන්ද්‍රයන්හි ජයග්‍රහණ

මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය විසින් බාහිර අධ්‍යාපනික වැඩසටහන් රැසක්ද, සම්මන්ත්‍රණ, වැඩමුළු හා පුහුණු වැඩසටහන් සහ පුස්තකාල එකතුව වැඩිකිරීමද සිදු

කරන ලදී. නොයෙක් වැඩසටහන් ක්‍රියාත්මක කරමින් මානව හිමිකම් දිනය ද ඔවුන් විසින් සමරන ලදී.

**V-16 වගුව : ප්‍රකාශන හා ඉදිරිපත් කිරීම්**

| පීඨය | ප්‍රකාශන | පර්යේෂණ පත්‍රිකා හා ප්‍රධාන දේශන |
|---|---|---|
| නීති | 04 | 21 |

## යටිතල සංවර්ධනය

2008 වසරෙහිදී නව නීති දේශනශාලා ගොඩනැගිල්ලෙහි වහළයෙහි කොටසක් නැවත ගොඩනගන ලදී.

# 04. කළමනාකරණ හා මූල්‍ය පීඨය

## හැඳින්වීම

ප්‍රථම උපාධි මෙන්ම පශ්චාත් උපාධි මට්ටමෙන් ද තම පාඨමාලා සඳහා වැඩිවන ඉල්ලුමක් කළමනාකරණ හා මූල්‍ය පීඨය විසින් අත්දකිමින් පැවතිණ. පසුගිය වසර වල පීඨයට ඇතුලත් කර ගන්නා ලද සිසුන් ගේ ඉසෙඩ් අගය ඉහළයාම හා MBA පාඨමාලාවට බැඳෙන සිසුන්ගේ සංඛ්‍යාවෙහි වර්ධනය අනුව මෙය පැහැදිලි වේ. මීට පිළිතුරු වශයෙන්, විශේෂයෙන් ම ගොඩනැගිලිවල ඉඩකඩ මද කම ඇතුළුව සම්පත්වල නොයෙකුත් අඩුපාඩුකම් පැවතියද පීඨය විසින් වාර්ෂිකව බඳවා ගන්නා සිසුන් සංඛ්‍යාව මීලග ශිෂ්‍ය කණ්ඩායමේ සිට 425 දක්වා වැඩි කිරීමට එකගව ඇත. දැනට, සියළු ප්‍රධාන පාඨමාලා පීඨය විසින් කාණ්ඩ තුනකට සිදුකරන අතර වැඩි වන ශිෂ්‍ය ලියාපදිංචිය අනුව පවතින ගොඩනැගිලි ප්‍රමාණය උපරිම ලෙස භාවිතා කරනු ලබයි. පවතින ආරක්ෂක තත්ත්වය තුල කාර්යයන් අව ප්‍රමාණ කිරීමට පීඨය ට සිදුවී ඇත. මෙම අවහිරතා සියල්ල මධ්‍යයේ වුවද විශ්වවිද්‍යාලයෙන් ශිෂ්‍යයන් පිට කිරීමෙහි කිසිදු ප්‍රමාදයක් පීඨය විසින් සිදු නොකරන ලදි. 2008 වසර තුල අවසාන ද්විත්ව කණ්ඩායම උපාධි ලබා ගත්හ. පීඨය එහි ප්‍රථම උපාධිය තනි මාධ්‍යයකට ඒකාග්‍ර කිරීමෙන් එනම් ඉංග්‍රීසි බසින් පාඨමාලාවන් මෙහෙයවීමේ එල නෙලාගැනීම පීඨය අරඹා ඇත. පීඨය විසින් බිහිකරන උපාධිධාරීන් සේවා නියුක්තියට ඉතා සුදුසු බවක් පෙන්වයි.

### මට්ටම - ලොව හොඳම ව්‍යාපාර පාසල් 1000 අතරට.

අධ්‍යාපනික කටයුතු සම්බන්ධ ලෝක තොරතුරු සම්බන්ධීකරණ මං පෙත් ලෙස සැලකිය හැකි අවස්ථාවක් වූ පීඨය ලොව හොඳම ව්‍යාපාර පාසල් 1000 අතරට 2008 දී ***EDUNIVERSAL*** විසින් තෝරා ගැනීම කිසිවකට සම කළ නොහැකි ජයග්‍රහනයක් ලෙස ද පීඨයෙහි කෙටි ඉතිහාසය තුල එහි බරපැන දරන්නන් විසින් කළ සාමූහික උත්සාහයන් සඳහා අමිල ත්‍යාගයක් ලෙස ද පෙන්වා දිය හැක. අධ්‍යාපන මට්ටමෙහි උසස් බව හා ජාත්‍යන්තර මාන එනම් එම අධ්‍යයනායතනයන්හි ජාත්‍යන්තර බලපෑම ද සැලකිල්ලට ගෙන මෙම තේරීම සිදු කර ඇත. මෙම තේරීම ලොව භූගෝලීය ප්‍රදේශ 9කින් (අප්‍රිකාව, උතුරු ඇමරිකාව, ලතින් ඇමරිකාව, මධ්‍යම ඇමරිකාව, යුරේෂියාව සහ මැද පෙරදිග, පෙරදිග යුරෝපය, බටහිර යුරෝපය, ඈත පෙරදිග සහ ඕෂැනියාව) පැමිණි ජාත්‍යන්තර නිපුණත්වයෙන් යුතු වූවන් 9 දෙනෙකු සහ එක්සත් ජාතීන්ගේ පද්ධතියෙහි අධ්‍යයන පාලක සභාවෙහි නියෝජිතයන් විසින් ලෝකය මුළුල්ලෙහි සිදුකර ඇති පර්යේෂණ, සහ ක්‍රියාවන්ගෙන් පැන නැගි නිපුණත්වය ඔස්සේ සිදු කර ඇත.

ඇකඩමියාව තුල මෙම උච්ජතම අවස්ථාවට එළඹි ශ්‍රී ලංකාවේ එකම කළමණාකරණ පීඨය කොළඹ විශ්වවිද්‍යාලයීය කළමනාකරණ හා මූල්‍ය පීඨයයි. ***EDUNIVERSAL*** විසින් මෙම පාසල් 1000 තෝරා ගෙන ඇත්තේ ලෝක ජනගහනයෙන් 97% කට වඩා ජීවත් වන ගණනින් රටවල් 151කට අයත් වන අධ්‍යයන කලාප 9කිනි. ***EDUNIVERSAL*** කාර්යාලයීය නිවේදනයෙහි සඳහන් වන පරිදි කෝටා ක්‍රමයක් මත එනම් කාර්යාලයීය තේරීමෙහි අංගයක් වීම මගින් පාසල විසින් සහ අදාල රට විසින් එහි ජාතික කලාපීය හා අන්තර්ජාතික බලපෑම වෙනුවෙන් සියළු ආකාර උත්සාහයන් යොදා ඇති බව පෙන්වීම තුලින් වඩාත්ම වැදගත් පාසල් 1000 තෝරා තිබේ. වැඩි විස්තර සඳහා www.eduniversal.net බලන්න.

### කාර්ය මණ්ඩල තොරතුරු

2008.05.21 දින සිට ආචාර්ය පී.එස්.එම්. ගුණරත්න තවත් වරක් කළමනාකරණ හා මූල්‍ය පීඨයෙහි පීඨාධිපති ධුරයට පත් කරන ලදි. එස්. තම්බිරාසා මෙනෙවිය තව දුරටත් පීඨයෙහි ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරිණිය ලෙස කටයුතු කළාය.

2008.01.07 දින සිට එම්. ඒ. පී. පී. චන්ද්‍රදාස මිය ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරිණිය ලෙස තව දුරටත් කටයුතු කළාය.

ආචාර්ය ඒ. ඒ. අසීස් මහතාගේ සප්ත වාර්ෂික නිවාඩු ලබා ගැනීම සඳහා 2008.08.14 දින සිට ඩී. එම්. එස්. දසනායක මහතා වාණිජ හා මූල්‍ය අධ්‍යයනාංශයේ අංශාධිපති ලෙස පත් කරන ලදී. ජී. රණවීරගේ මහතා, ආචාර්ය කේ. දිසානායක මිය, ඩබ්. ජී. ප්‍රේමරත්න මහතා, ආචාර්ය එන්. එන්. ජේ. නවරත්න, ආචාර්ය එච්. එන්. පී. ජයසිංහ යන අය පිළිවෙලින් ගනකාධිකරණ, කළමනාකරණ හා සංවිධාන අධ්‍යයන, අලෙවිකරණ, මානව සම්පත් කළමනාකරණ, මූල්‍ය හා ව්‍යාපාර ආර්ථික විද්‍යා යන අධ්‍යයනාංශ වල අංශාධිපතීන් ලෙස තව දුරටත් කටයුතු කළහ. ඩබ්. ඒ. එස්. පී. වීරතුංග මහතා 2008.02.01 දින සිට අධ්‍යයන කටයුතු පිළිබඳ සම්බන්ධීකාරක ලෙස පත් කරන ලදී.

ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලයෙහි සාමාජිකයන් 50 දෙනෙකු සිටි අතර ඊට සහාය මහාචාර්ය වරුන් දෙදෙනෙකු (02) ද, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් තිස් දෙනෙකු (30) ද, කථිකාචාර්යවරුන් අට දෙනෙකු (08) ද, පරිවාස කථිකාචාර්යවරුන් අට දෙනෙකු (08) ද අයත් වූහ. ඊට අමතරව, පීඨයෙහි පරිගනක උපදේශකවරුන් දෙදෙනෙකු (02) ද වෙති.

**V-17 වගුව : පත්කිරීම් සහ උසස් කිරීම්**

| නම සහ අධ්‍යයනාංශය | තනතුර | ක්‍රියාත්මක දිනය |
|---|---|---|
| **උසස් වීම්** | | |
| **කළමනාකරණ හා ආයතන අධ්‍යයන** | | |
| බී. නිශාන්ත මහතා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II වන ශ්‍රේණිය | 2008.11.01 |
| ආචාර්ය පී.ඒ.ටී.ආර්. පෙරේරා | කථිකාචාර්ය | 2008.11.01 |
| **ගනකාධිකරණ** | | |
| ටී.එන්. ගුණරත්න | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II වන ශ්‍රේණිය | 2007.12.16 |

## රැස්වීම්

සමාලෝචනයට ලක් කර ඇති වර්ෂය තුළ පීඨ සභාව දස (10) වරක් රැස්වූහ. අධ්‍යයනාංශ රැස්වීම් වලට අමතරව, බද්ධ අන්තර් අධ්‍යයනාංශ කාර්ය මණ්ඩල රැස්වීම් නිතිපතා පැවැත්විණ. විෂය මාලා සංවර්ධන කමිටුව, පීඨ විභාග කමිටුව, උසස් උපාධි කමිටුව සහ පශ්චාත් උපාධි හා මධ්‍ය-රැකියා සංවර්ධන ඒකකයෙහි කළමනාකරණ සභාව විසින් අදාල නිත්‍ය රැස්වීම් පවත්වන ලදී.

## කාර්ය මණ්ඩල සංවර්ධනය

**V-18 වගුව : පශ්චාත් උපාධි පාඨමාලා වලදී අධ්‍යයන කාර්ය මණ්ඩල සහභාගිත්වය**

| පශ්චාත් උපාධි පාඨමාලාව | සම්පූර්ණ කර ඇත | හදාරමින් සිටී | ආරම්භ කර ඇත |
|---|---|---|---|
| දර්ශනශූරි | - | 15 | 01 |
| දර්ශනපති | - | 02 | - |
| ශාස්ත්‍රපති. ආර්ථිකවිද්‍යා | - | 01 | - |
| ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය (MBA) | 02 | 06 | 02 |
| **එකතුව** | **02** | **24** | **03** |

විශ්වවිද්‍යාලයෙහි අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල විසින් විශ්වවිද්‍යාලයෙහි කාර්ය මණ්ඩල සංවර්ධන ඒකකය විසින් සංවිධානය කරන ලද අඛණ්ඩ හා විශේෂ යන වැඩසටහන් දෙකොටසින්ම ප්‍රයෝජන ලබාගති. අධ්‍යයන කාර්ය මණ්ඩලය ද පුහුණු වැඩසටහන් කිහිපයකට මෙරටෙහිදීම සහභාගී වූහ.

**V-19 වගුව : කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන් වල සහභාගීත්වය**

| පාඨමාලාව | කාර්ය මණ්ඩල සංඛ්‍යාව | | එකතුව |
|---|---|---|---|
| | පුරුෂ | ස්ත්‍රී | |
| උසස් අධ්‍යාපනය සඳහා ඉගැන්වීම පිළිබඳ සහතික පත්‍රය (CTHE) | 03 | 02 | **05** |

## ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව

මෙම වසර තුළ, පීඨය තම දෙවන ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණය සාර්ථක ලෙස සංවිධානය කළ අතර මෙම ක්ෂේත්‍රයෙහි දේශීය සහ ජාත්‍යන්තර පර්යේෂකයන් ඊට සහභාගී වූහ. ආචාර්ය එච්. එන්. පී. ජයසිංහ සහ ආචාර්ය කේ. කපේන්ද්‍ර එම සමුළුවෙහි සම්බන්ධීකාරකවරුන් ලෙස කටයුතු කළහ. 2008.12.12 වන දින පවත්වන ලද වාර්ෂික පර්යේෂණ සැසියෙහි දී පීඨය විසින් කොළඹ ව්‍යාපාර වාර සඟරාවේ පළමු වෙළුමේ දෙවන කලාපය නිකුත් කරන ලදී.

## ප්‍රථම උපාධි වැඩසටහන්

2008.10.29 වන දින පීඨයට නව ශිෂ්‍ය කණ්ඩායමක් (2007 උසස් පෙළ) ඇතුළත් කර ගන්නා ලදී.

## පශ්චාත් උපාධි වැඩසටහන් හා ව්‍යාප්ති පාඨමාලා

ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාවේ හා ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විධායක ඩිප්ලෝමාවෙහි අධ්‍යයන කටයුතු පිළිබඳව පශ්චාත් උපාධි හා මධ්‍ය රැකියා සංවර්ධන ඒකකය වගකියයුතු ලැබේ. 2008 වසර තුළ ජේ. ඒ. එස්. කේ. ජයකොඩි මහතා ඒකකයෙහි සම්බන්ධීකාරක ලෙස තව දුරටත් කටයුතු කළේය.

මෙම වසර තුළ, කිසිදු බාධාවකින් තොරව සියළු වැඩසටහන් සාර්ථක ලෙස පවත්වන ලදී. MBA පාඨමාලාව (2008/10) සඳහා පූර්ණ වශයෙන් සිසුන් 175 දෙනෙක් ලියාපදිංචි කරන ලදී. (V-20 වගුව)

නිත්‍ය ඉගැන්වීම් හා පර්යේෂණ කටයුතු වලට අමතරව, නිති පතා සිදුකෙරෙන පාඨමාලා කාර්ය ඇගයීම්, මණ්ඩපයෙන් පිටත, ආයතන/කර්මාන්ත මූලික ඇගයීම් සහ අමතර ආරාධිත දේශන මෙම වැඩසටහන් වල ජනප්‍රිය අංග විය. පීඨය විසින් සංවිධානය කරන ලද නේවාසික වැඩමුළු සුවිශේෂී අත්දැකීමක් ලබා දුන්නේ MBA උපාධි අපේක්ෂකයින්ගේ ඉගෙනීමේ ප්‍රවණතාවන්හි වර්ධන අවස්ථාවක් පිළිබිඹු කරමිනි. කාර්මික ක්ෂේත්‍රයෙහි පළපුරුද්ද සහිත වෘත්තීය නිපුණත්වයෙන් යුතු වූ පුද්ගලයන් සැලකිය යුතු සංඛ්‍යාවක් සම්පත් දායකයන් හා බාහිර කථිකාචාර්යවරුන් ලෙස මෙම වැඩසටහන් වලට සහභාගී වූහ.

**V-20 වගුව : MBA, පශ්චාත් උපාධි හා අනෙකුත් අධ්‍යයන වැඩසටහන් සඳහා ශිෂ්‍ය ලියාපදිංචිය - 2008**

| වැඩසටහන | ශිෂ්‍ය සංඛ්‍යාව | |
|---|---|---|
| දර්ශනශූරි | 01 | |
| | **2007-2009** | **2008-2010** |
| MBA | 76 | 71 |
| MBA - මූල්‍යය | 54 | 55 |
| MBA - අලෙවිකරණය | 24 | 34 |
| MBA - මානව සම්පත් කළමනාකරණය | 12 | 15 |
| EDBA වැඩසටහන | 39 | |
| **එකතුව** | **381** | |

**V-21 වගුව : ප්‍රකාශන හා ඉදිරිපත් කිරීම්**

| අධ්‍යයනාංශය | ඉදිරිපත්කිරීම්/ ප්‍රකාශන/ සන්නිවේදන පර්යේෂණ/ සංක්ෂිප්ත/ වාර සඟරා | දේශීය හා ජාත්‍යන්තර සම්මන්ත්‍රණ වලදී ඉදිරිපත් කරන ලද ලේඛණ | ලිපි හා ග්‍රන්ථ | ආරාධිත දේශන |
|---|---|---|---|---|
| ගණකාධිකරණය | - | 04 | - | - |
| ව්‍යාපාර ආර්ථික විද්‍යාව | 02 | 04 | 01 | 02 |
| මූල්‍යය | - | 07 | 01 | 03 |
| මානව සම්පත් කළමනාකරණය | - | 02 | - | 01 |
| කළමනාකරණ හා සංවිධාන අධ්‍යයනය | 05 | 01 | 01 | - |
| අලෙවිකරණය | - | 06 | - | - |
| **එකතුව** | **07** | **25** | **03** | **06** |

## 05. වෛද්‍ය පීඨය

2008.08.07 වන දින දක්වා මහාචාර්ය දුලිතා එන්. ප්‍රනාන්දු පීඨාධිපති ලෙස කටයුතු කළ අතර, 2008.08.08 දින සිට මහාචාර්ය හර්ෂලාල් සෙනෙවිරත්න පීඨයෙහි නව පීඨාධිපති ලෙස තේරී පත් විය. වර්ෂය තුල පී. එස්. එම්. බණ්ඩාර මහතා නියෝජ්‍ය ලේඛකාධිකාරි ලෙස උසස් වීමක් ලද අතර එච්. පී. ඩී. ශ්‍රියානි මිය සහකාර ලේඛකාධිකාරිනිය ලෙස නව දූරටත් කටයුතු කළාය.

වසරේ විශේෂ අවස්ථා වූයේ වෛද්‍ය ප්‍රදර්ශනය (MEDEX) සහ ශිෂ්‍ය වෛද්‍ය වාර සගරාව ආරම්භ කිරීමයි.

2008.02.26 දින සිට 2008.03.01 දින දක්වා බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී ප්‍රදර්ශනය පවත්වනු ලැබීය. එය සාර්ථක ලෙස අවසන් වූ අතර මෙම අවස්ථාවෙන් රුපියල් මිලියන 8ක් උපයා ගන්නා ලදී. මෙම අවස්ථාවට 100,000කට අධික පිරිසක් සහභාගී වූහ. මෙම ආදායම ශිෂ්‍යයන් වෙත සැපයෙන පහසුකම් සංවර්ධනය සඳහා භාවිතා වනු ඇත.

තත් කාලීන වෛද්‍ය පර්යේෂණ, අදහස් හා චින්තනය අනෙකුත් ශිෂ්‍යයන්හට, අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්හට සහ බාහිර උපදේශකයන්හට සන්නිවේදනය කිරීම සඳහා පූර්ණ මාර්ගයක් ලබා දීමට යත්න දැරීමක් වන ප්‍රථම ශිෂ්‍ය වෛද්‍ය වාර සගරාවෙහි පළමු වෙළුම 2008 ජූලි මසදී ආරම්භ කරන ලදී.

කාය ව්‍යවච්ඡේද අංශයෙහි භූමි භාගයේ සැදීමට යෝජිත නව ගොඩනැගිල්ලෙහි පයිල් ගැසීමේ කටයුතු 2008.11.10 වන දින ආරම්භ කළ අතර දින 180 ක් ඇතුළත සිදුකර නිම කිරීමට නියමිතය. සායනික වෛද්‍යවිද්‍යා ගොඩනැගිල්ලෙහි මහල් දෙකක් සම්පූර්ණ කර ඇති අතර සම්පූර්ණ ගොඩනැගිල්ලම 2009 වසර වන විට නිම වනු ඇත.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිර්දේශ කර ඇති පරිදි සියළු විශ්වවිද්‍යාල සඳහා වන පොදු කාල සටහනකට සමගාමීව කටයුතු කිරීමට පීඨයද සැලසුම් කරමින් සිටී.

නව විෂය නිර්දේශය (2001 උසස් පෙළ කණ්ඩායම) හදාරන 9 වන වෛද්‍ය ශිෂ්‍ය කණ්ඩායම මෙම වර්ෂය තුලදී තම අධ්‍යයන කටයුතු සම්පූර්ණ කරන ලදී.

### මෙහෙවර සහ දර්ශනය

දකුණු ආසියාවේ දෙවන පැරණිතම වෛද්‍ය පීඨය මෙරටෙහි විශ්වවිද්‍යාලයීය අධ්‍යාපනයෙහි ප්‍රමුඛයා වන කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයයි. පීඨයෙහි මෙහෙවර වනුයේ; "නිපුණත්වයෙන්, දයාවෙන් හා සැලකිල්ලෙන් යුතුව පුද්ගල හා ප්‍රජා සෞඛ්‍ය අවශ්‍යතා සැපිරීම සඳහා දායකත්වය ලබා දෙන උපාධිධාරියෙකු බිහි කිරීම" වේ. වෛද්‍යවේදී උපාධියෙහි විෂය මාලා නිර්මාණය කර ඇත්තේ ද, පීඨයෙහි මෙහෙවර ඉටු කර ගැනීමට හැකි වන පරිදිය. පීඨයෙහි දර්ශනය වනුයේ "2010 වසර වන විට දකුණු ආසියාවේ හොඳම වෛද්‍ය විද්‍යාලය බවට සංවර්ධනය වීමයි." මෙකී දර්ශනය යථාර්තයක් කරලීම සඳහා සමාලෝචිත වර්ෂය තුල, පීඨය විසින්, පවත්නා භෞතික යටිතල පහසුකම් ද අධ්‍යයන පරිසරය ද එසේම වෛද්‍ය විද්‍යාව සම්බන්ධ ක්ෂේත්‍ර වෙත උසස් අධ්‍යාපනයෙහි විවිධාංගීකරණය ද වැනි මූලික කටයුතු කිහිපයක් සිදු කර ඇත..

මීට දේශීය හා විදේශීය විශ්වවිද්‍යාල සමග සම්බන්ධතා ඇතිකර ගැනීම, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) විසින් නිර්දේශ කර ඇති පරිදි පීඨය සඳහා විෂයමාලා ක්‍රියාත්මක කිරීමේ කමිටුවක් (CIC) ඇතිකිරීම, IRQUE ව්‍යාපෘතිය යටතේ පත්කර ඇති උපදේශකවරුන් විසින් පීඨයෙහි කළමනාකරණ රාමුව විධිමත්

කිරීම යන කරුණු ඇතුළත් වේ. CIC හි ප්‍රධාන කාර්යභාරය වනුයේ විෂයමාලා සංවර්ධන හා ඇගයීම් කමිටුව විසින් ගෙන ඇති තීරණ සලකා බලමින් විෂය මාලාවන් සුගම ලෙස හා කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීමත්, අධ්‍යයනාංශ සමග යහපත් සබඳතාවක් ඇති කර ගැනීමයි.

සමාලෝචිත වර්ෂය තුළ පීඨය විසින් කර්මාන්තයෙහි හා පද්ධතියෙහි ඇති අනෙකුත් පීඨ හා විශ්වවිද්‍යාලයන්ගේ සහාය සහ ඒකාබද්ධතාව ඇතිව ව්‍යාප්ති පාඨමාලා හඳුනාගැනීමේ ඇති හැකියාව සෙවීම සඳහා කමිටුවක් ද පත් කර ඇත.

## කාර්ය මණ්ඩලය

2008 වන විට, ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලයෙහි සාමාජිකයන් එක සිය තිස් එක් (131) දෙනෙකු සිටි අතර, එයට ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන් සතර (04) දෙනෙක් ද, මහාචාර්යවරුන් දහසය (16) දෙනෙක් ද, සහාය මහාචාර්ය වරුන් පස් (05) දෙනෙක්ද, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් පනස් හය (56) දෙනෙක්ද, කථිකාචාර්යවරුන් හතලිස් නව (49) දෙනෙක් ද, එසේම එක් (01) ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරියෙක් ද අයත් වෙති.

ව්‍යාප්ත පීඨය ට කොළඹ රෝහල් සමූහයෙහි ද, කොළඹ අධිකරණ වෛද්‍ය නිලධාරින්ද, මහරගම ජාතික පිළිකා ආයතනයෙහි වෛද්‍ය නිලධාරීන් හා උපදේශකයින් ද, දිස්ත්‍රික් රෝහල්, පර්යන්ත ඒකක, සහ මහනගර සභා බෙහෙත් ශාලාවන්හි වෛද්‍ය නිලධාරීන් ද, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් සහ පෞද්ගලික වෛද්‍ය වෘත්තිකයන් 14 දෙනෙකුගෙන් යුත් 90 දෙනෙකුට වැඩි උපදේශකවරුන් සංඛ්‍යාවක් අයත් වූහ.

**V-22 වගුව : නව පත්වීම්, උසස් වීම්, ඉල්ලා අස් වීම් හා විශ්‍රාම යෑම්**

| නම | තනතුර | අධ්‍යයනාංශය |
|---|---|---|
| **නව පත්වීම්** | | |
| වෛද්‍ය පී.එච්.අයි.යූ. වෛද්‍යතිලක | පරිවාස කථිකාචාර්ය | ජෛව රසායනවිද්‍යාව |
| වෛද්‍ය එම්.ආර්. හනීෆා | පරිවාස කථිකාචාර්ය | පීඨාධිපති කාර්යාලය |
| වෛද්‍ය එම්. එන්. ලූකස් | පරිවාස කථිකාචාර්ය | ළමා රෝග |
| **උසස් වීම්** | | |
| මහාචාර්ය ඩී. එන්. සමරසේකර | ශල්‍ය වෛද්‍ය මහාචාර්ය(මූලසුනෙහි) | ශල්‍ය වෛද්‍ය |
| වෛද්‍ය ඒ. කළුආරච්චි | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය | ප්‍රසව හා නාරි වේද |
| වෛද්‍ය සී ජේ ආර් කොලොන්නෙ | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය | ප්‍රසව හා නාරි වේද |
| වෛද්‍ය එච් ජේ එම් පෙරේරා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය | අධිකරණ වෛද්‍ය විද්‍යා |
| වෛද්‍ය එස් රාජපක්ෂ | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය | සායනික වෛද්‍යවිද්‍යා |
| වෛද්‍ය දීපිකා ප්‍රනාන්දු | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය | පරපෝෂිතවේදය |
| වෛද්‍ය ආර් අජන්තන් | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය | ළමා රෝග |
| වෛද්‍ය එස් වාසලතන්ත්‍රි | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය | භෞත චිකිත්සකවේද |
| වෛද්‍ය එම් ඩී ජේ විජයබන්ඩාර | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය | නිපුග්වේද |
| ඩබ් පතිරණ මයා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය | නිපග්වේද |
| වෛද්‍ය ඒ යූ අබේදීර | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය | ශල්‍ය වෛද්‍ය |
| වෛද්‍ය එන් ආර් පෙරේරා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය | ව්‍යාධිවේද |
| වෛද්‍ය පී ගලප්පත්ති | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය | නිපග්වේද |
| වෛද්‍ය එච් ඩබ් ඩබ් ගුනසේකර | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය | කාය ව්‍යවච්ඡේද |
| වෛද්‍ය මංගල ගුනතිලක | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය | භෞත චිකිත්සකවේද |
| වෛද්‍ය එස් ඒ ඒ පී කරුණානායක | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය | සායනික වෛද්‍ය විද්‍යා |
| වෛද්‍ය එල් ඩී ජේ යූ සෙනරත් | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය | ප්‍රජා වෛද්‍ය |
| වෛද්‍ය එම් සී වීරසිංහ | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය | ප්‍රජා වෛද්‍ය |
| වෛද්‍ය එන් එම් සී කේ අරඹේපොල | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය | ප්‍රජා වෛද්‍ය |
| වෛද්‍ය එන් ඩී එන් මෙන්ඩිස් | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය | අධිකරණ වෛද්‍ය විද්‍යා |
| වෛද්‍ය ජී ආර් කොන්ස්ටන්ටයින් | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය | සායනික වෛද්‍ය විද්‍යා |
| **විශ්‍රාම යෑම්** | | |

| | | |
|---|---|---|
| මහාචාර්ය එස්. පී. ලමාබදුසූරිය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | ළමා රෝග |
| **ඉල්ලා අස්වීම්** | | |
| මහාචාර්ය බී.ජේ.ජේ.එෆ් පෙරේරා | සහය මහාචාර්ය | කාය ව්‍යවච්ඡේද |
| වෛද්‍ය හිමානි කාරියවසම් | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | ගිහපග්වේද |
| වෛද්‍ය ඩී ජේ ආර් කොලොන්නෙ | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | ප්‍රසව හා නාරි වේද |

## රැස්වීම් සහ කමිටු

සමාලෝචිත වර්ෂය තුල පීඨ සභාව දහ හත් (17) වරක් රැස් වූහ. විෂයමාලා සංවර්ධන සහ ඇගයීම් කමිටුව, පර්යේෂණ හා උසස් උපාධි කමිටුව, සාරධර්ම සමාලෝචන කමිටුව, ප්‍රවේශ කමිටුව යන කමිටු නිතිපතා රැස්වීම් පවත්වන ලදී. මෙම කමිටු වල රැස්වීම් වාර්තා පීඨ සභාවේදී ඉදිරිපත් කරන ලද අතර සනාතන සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

## ප්‍රථම උපාධි අධ්‍යාපනය

2008 ජූලි සහ නොවැම්බර් යන මාස වලදී 2007 උසස් පෙළ ශිෂ්‍ය කණ්ඩායමෙහි පිළිවෙලින් වෛද්‍ය සිසුන් 193 දෙනෙක්ද භෞත චිකිත්සක සිසුන් 27 දෙනෙක්ද තම ප්‍රථම උපාධි අධ්‍යයන කටයුතු ආරම්භ කළහ. 2008 වසර අවසානය වන විට පීඨයෙහි සමස්ත ශිෂ්‍ය සංඛ්‍යාව වෛද්‍ය අංශයෙන් 1278ක් වූ අතර, භෞත චිකිත්සක අංශයෙන් 75 දෙනෙක් වූහ.

**ඖෂධවේදය පිළිබඳ විද්‍යාවේදී පාඨමාලාව** විද්‍යා පීඨය සමග අනුබද්ධව පවත්වාගෙන යනු ලබන අතර 2005/2006 උසස් පෙළ කණ්ඩායමෙන් සිසුන් දහතුන් (13) දෙනෙකු පීඨයෙහි තම අධ්‍යයන කටයුතු ආරම්භ කළහ. මෙම උපාධි පාඨමාලාව හදාරන 10 වන ශිෂ්‍ය කණ්ඩායම මෙය වේ.

### වරණීය ශිෂ්‍යයෝ

තෝරාගත් ක්ෂේත්‍ර තුල කෙටි කාලීන පුහුණු (වරණීය) වැඩසටහන් වල විශේෂයෙන්ම ජර්මනිය, එක්සත් රාජධානිය, ඕස්ට්‍රේලියාව, නෝර්වේ සහ නවසීලන්තය යන රටවල ශිෂ්‍යයන් සහභාගී වූහ.

## ව්‍යාප්ති පාඨමාලා

පීඨය තවදුරටත් ව්‍යාප්ති පාඨමාලා පහක් (5) පවත්වන්නට යෙදුනි.

**V-23 වගුව : ව්‍යාප්ති පාඨමාලාවන්හි ශිෂ්‍ය ප්‍රවේශ**

| පාඨමාලාව | ප්‍රවේශ වූ | සුදුසුකම් ලත් |
|---|---|---|
| ජෛව රසායන, අණුක ජීවවිද්‍යා හා ජාන තාක්ෂණය පිළිබඳ විද්‍යාපති පාඨමාලාව | 06 | 02 |
| ධූලකවේදය පිළිබඳ ඩිප්ලෝමාව | 50 | - |
| ගිහපග්වේද ඩිප්ලෝමාව | - | 02 |
| වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව | 19 | 11 |
| වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 08 | 05 |
| සෞඛ්‍ය සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව | 45 | - |
| ආපදා කළමනාකරණය හා ලිහිල් කිරීම පිළිබඳ සහතිකපත් පාඨමාලාව | 19 | 20* |

*නැවත පෙනී සිටිය යුතු කණ්ඩායමෙහි එක් ශිෂ්‍යයෙක් මීට අයත්ය.

## පශ්චාත් උපාධි අධ්‍යාපනය

ව්‍යාප්ති පාඨමාලා ලෙස ඉගැන්වීම් මගින් පැවැත්වෙනු ලබන පශ්චාත් උපාධි පාඨමාලා වලින් වෙනමම පීඨය විසින් පිරිනමනු ලබන අනෙකුත් පශ්චාත් උපාධි පාඨමාලා පර්යේෂණ උපාධි වලට සීමා වේ. සමාලෝචිත වර්ෂය තුල ශිෂ්‍යයන් තුන් (3) දෙනෙකු දර්ශන ශූරි (Ph.D) උපාධිය සම්පූර්ණ කළහ.

වර්ෂය තුල පීඨයෙහි ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් අධ්‍යයන මණ්ඩල සාමාජිකයන් ලෙස සේවා සපයමින් ද, වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙහි පුහුණු වැඩසටහන් වලට සම්බන්ධ සියළු අධ්‍යයන කටයුතු කෙරෙහි වගකීමකින් යුක්තව සැලකිය යුතු දායකත්වයක් ලබා දෙන ලදී. එවන් සේවා බහු ස්වරූපී වන අතර ඒවා නම් අධ්‍යයන මණ්ඩල වලට සහභාගී වීම්, දේශන පැවැත්වීම්, පුහුණුකරුවන්ගේ භූමිකාව ඉටු කිරීම් (සායනික ක්ෂේත්‍ර වලදී), සහ පර්යේෂණ උපදේශකත්වය හා විභාග පරීක්ෂකවරු ලෙස කටයුතු කිරීම් වේ.

## කාර්ය මණ්ඩල කාර්ය සාධනය සහ සංවර්ධනය

කාර්ය මණ්ඩල සාමාජිකයන් කාර්ය මණ්ඩල සංවර්ධන කේන්ද්‍රය විසින් සංවිධානය කරනු ලබන වැඩසටහන් වලින් තව දුරටත් ඵල නෙලා ගත්හ.

විදේශීය පුහුණු වැඩසටහන් සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩලයේ දහඅට (18) දෙනෙකු ද, ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සඳහා හැත්තෑ අට (78) දෙනෙකුද වර්ෂය තුලදී සහභාගී වූහ. කාර්ය මණ්ඩලයෙහි දස (10) දෙනෙකු (අධ්‍යයන හා අනධ්‍යයන) රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද දමිළ කතා කිරීමේ පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කළහ. එක් කාර්ය මණ්ඩල සාමාජිකයෙකු සිංහල පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කළේය.

**ශිෂ්‍ය ක්‍රියාකාරකම් 2008**

වර්ෂය තුල ශිෂ්‍යයන් විසින් සංවිධානය කරන ලද සංස්කෘතික/සාමාජීය ක්‍රියාකාරකම් කිහිපයක් පවත්වන ලද අතර, මෙම ඉසව් සංවිධානය කිරීමේ වගකීම විවිධ කණ්ඩායම් විසින් භාර ගන්නා ලදී. ක්‍රියාකාරකම් අතර, නවකයින් පිළිගැනීම, බ්ලොක් සැමරුම්, පීඨ විවිධප්‍රසංගය, නිති-වෛද්‍ය සැමරුම් සහ *නිත්නාද* යන ඒවා විය. ශිෂ්‍යයන්ගේ විද්‍යාත්මක සැසි පීඨයෙහි දී 2008 ඔක්තෝබර් මස 23 හා 24 යන දෙදින පවත්වන ලදී.

**පීඨයෙහි අමුත්තෝ**

තායිලන්තයේ ආචාර්ය ජෙෆ්රි මයිකල් ස්මිත්
එක්සත් රාජධානියේ ආචාර්ය බොබ් සිම්සන්

## බාධක

එක්දහස් තුන්සියයකට අධික ශිෂ්‍ය ප්‍රජාවක් සහ තුන්සිය අසූ දෙනෙකු පමණ වන අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයක් ද සහිත වූ පීඨය වෙත ඇති බරපතල බාධකයක් වනුයේ ඉඩකඩයි.

අයවැය සීමා හේතු කොට ගෙන, ක්‍රියාකාරකම් පුළුල් කිරීම අඩු කොට ඇත.

## දේශීය මට්ටමෙහිදී අධ්‍යයන කාර්ය මණ්ඩලයෙහි දායකත්වය

| | | |
|---|---|---|
| මහාචාර්ය ජයසේකර එම් එම් ආර් ඩබ්. | මහාචාර්ය ප්‍රනාන්දු ඩී එන් | මහාචාර්ය රාජපක්ෂ එල් |
| ආචාර්ය විජේසුන්දර ඩබ්. එස් එස් | ලංකාතිලක කේ මිය | වෛද්‍ය ගුණවර්ධන එන් එස් |
| මහාචාර්ය සෙනෙවිරත්න ආර් ද ඒ | වෛද්‍ය වීරසිංහ එම් සී | මහාචාර්ය රිස්වි පෙරිෆ් |
| වෛද්‍ය සෙනරත් එල් ඩී ජේ යූ | වෛද්‍ය කටුලන්ද පී | මහාචාර්ය ලමාබදුසූරිය එස් පී |

වෛද්‍ය ලැනරෝල් ආර් ඩී
මහාචාර්ය ප්‍රනාන්දු එස් එස් ඩී
මහාචාර්ය සේනානායක එම් පී
වෛද්‍ය අජන්තන් ආර්
වෛද්‍ය රුදිගු ඉපාති
වෛද්‍ය වික්‍රමසිංහ වී පී
වෛද්‍ය කොරයා ඊ
වෛද්‍ය සමරසේකර ඩී ඩී
වෛද්‍ය කළුආරච්චි ඒ
මහාචාර්ය විජේරත්න සී එන්
වෛද්‍ය දොඩම්පහල එස් එච්
මහාචාර්ය ජයකොඩි ආර් එල්
මහාචාර්ය ද ආබෲ කේ
මහාචාර්ය අගුනාවෙල පී
මහාචාර්ය සුනේත්‍රා අතුකෝරල

වෛද්‍ය කරුණානායක පී
වෛද්‍ය ද සිල්වා ශාමියා
මහාචාර්ය සෙනෙවිරත්න එච් ආර්
විජේරත්න එස් මිය
මහාචාර්ය කරුණාවීර එන් ඩී
ආචාර්ය පතිරණ එස්
මහාචාර්ය ප්‍රනාන්දුපුල්ලේ බී එම් ආර්
වෛද්‍ය ගලප්පත්ති පී
මහාචාර්ය මෙන්ඩිස් එන්
මහාචාර්ය සමරසිංහ ඩී
වෛද්‍ය ද සිල්වා වරුණි
වෛද්‍ය ඩයස් එම් එන් ජේ ආර්
මහාචාර්ය විජේරත්න එස් එම්
වෛද්‍ය පොන්නම්පෙරුම ජී ජී
මහාචාර්ය මැතිව් සී පී ඩී ඩබ්.

වෛද්‍ය ගුණතුංග ඩබ්.
මහාචාර්ය පෙරේරා ඒ ජේ
වෛද්‍ය සේනානායක සී පී
මහාචාර්ය රත්දෙනිය සී
වෛද්‍ය ප්‍රනාන්දු ඩී
වෛද්‍ය ශ්‍රී රංගනාදන් එස්
වෛද්‍ය අභයධීර ඒ යූ
වෛද්‍ය වීරසිංහ එම් සී
ආචාර්ය ද සොයිසා පී
මහාචාර්ය සමරසේකර ඩී එන්
වෛද්‍ය ගුණවර්ධන එන් එස්
වෛද්‍ය අරඹේපොළ සී
වෛද්‍ය ද සොයිසා එම් අයි එම්
වෛද්‍ය කරුණාතිලක අයි එම්

## ජාත්‍යන්තර මට්ටමෙහි දී අධ්‍යයන කාර්ය මණ්ඩල දායකත්වය

මහාචාර්ය ප්‍රනාන්දු ඩී එන්
මහාචාර්ය විජේරත්න සී එන්
මහාචාර්ය කරුණාවීර එන් ඩී
වෛද්‍ය කාරියවසම් එච්
මහාචාර්ය මෙන්ඩිස් එන්
වෛද්‍ය කරුණාතිලක අයි එම්

මහාචාර්ය පෙරේරා ඒ ජේ
වෛද්‍ය දොඩම්පහල එස් එච්
මහාචාර්ය ප්‍රනාන්දුපුල්ලේ බී එම් ආර්
පතිරන ඩබ් මහතා
මහාචාර්ය සමරසිංහ ඩී

මහාචාර්ය සෙනෙවිරත්න එච් ආර්
මහාචාර්ය ළමාබදුසූරිය එස් පී
මහාචාර්ය ද ආබෲ කේ
ආචාර්ය විජයබණ්ඩාර එම් ඩී ජේ
වෛද්‍ය කරුණාතිලක අයි එම්

## V-24 වගුව : ප්‍රකාශන හා ඉදිරිපත් කිරීම්

| අධ්‍යයනාංශය | ඉදිරිපත් කිරීම්/ ප්‍රකාශන/ සන්නිවේදන/ පර්යේෂණ/ සාරාංශ/ වාර සඟරා | සම්මන්ත්‍රණ පත්‍රිකා/ දේශීය හා ජාත්‍යන්තර | ආරාධිත දේශන | අමුත්තන්ගේ දේශන | සම්භාවනීය දේශන |
|---|---|---|---|---|---|
| කාය ව්‍යවච්ඡේද | 05 | 01 | - | - | - |
| සායනික වෛද්‍ය විද්‍යා | 12 | - | - | - | - |
| ප්‍රජා වෛද්‍ය විද්‍යා | 38 | 06 | 01 | - | 01 |
| අධිකරණ වෛද්‍ය විද්‍යා | 07 | - | - | - | - |
| නාරිවේද හා ප්‍රසවවේද | 67 | 33 | - | - | - |
| ශුද්‍ර ජීව විද්‍යා | 12 | - | - | - | - |
| ළමා රෝග | 36 | - | - | - | - |
| පරපෝපවේද සහ මැලේරියා පර්යේෂණ ඒකකය (MRU) | 17 | - | - | - | - |
| ව්‍යාධිවේද | 12 | - | - | 11 | - |
| භිෂග්වේද | 10 | 03 | - | - | - |
| කායික වෛද්‍ය විද්‍යා (භෞතවේද) | 10 | - | - | - | - |
| මනෝ වෛද්‍ය විද්‍යා | 27 | - | - | - | - |
| ශල්‍ය වෛද්‍ය | 35 | - | - | - | - |
| මානව ජාන ඒකකය | 44 | 05 | - | - | - |
| සත්වාගාරය | 04 | - | - | - | - |
| වෛද්‍ය අධ්‍යාපන සංවර්ධන හා පර්යේෂණ මධ්‍යස්ථානය (MEDARC) | 23 | - | - | - | - |
| සහායක සෞඛ්‍ය විද්‍යා ඒකකය | 01 | - | - | - | - |
| ප්‍රාරම්භක මූලික විද්‍යා විෂය ධාරාව | 02 | - | - | - | - |
| චර්යාමය විද්‍යා විෂය ධාරාව | 04 | - | - | - | - |
| **එකතුව** | **368** | **48** | **01** | **11** | **01** |

**වෛද්‍ය අධ්‍යාපන සංවර්ධන හා පර්යේෂණ මධ්‍යස්ථානය (MEDARC)**

**හැඳින්වීම**

2008 වසර සඳහා වෛද්‍ය අධ්‍යාපන සංවර්ධන හා පර්යේෂණ මධ්‍යස්ථානය (MEDARC) මගින් පහත දැක්වෙන වැඩසටහන් හා ක්‍රියාකාරකම් සැලසුම් කර තිබිණි.

1. විෂය මාලා ඇගයීමේ ක්‍රමවේදයන් කාර්ය මණ්ඩලය වෙත හඳුන්වා දීම හා විෂය මාලා ඇගයීම ආයතනීකරණය කිරීම
2. අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා කාර්යමණ්ඩල සංවර්ධන කටයුතු අඛණ්ඩව පවත්වාගන යාම
3. ගැටළු පාදක කරගත් අධ්‍යයනයෙහි පුහුණුවීම් හඳුන්වා දීම/අස්ථිර කාර්ය මණ්ඩලයට ඉගැන්වීම
4. ශිෂ්‍ය අධ්‍යයනයට සම්බන්ධ යටිතල පහසුකම් සංවර්ධනය
5. වෛද්‍ය අධ්‍යාපන ක්‍රියාකාරකම් කෙරෙහි පර්යේෂණ

**කාර්ය මණ්ඩල තොරතුරු**

වෛද්‍ය අයි. එම්. කරුණාතිලක වෛද්‍ය අධ්‍යාපන සංවර්ධන හා පර්යේෂණ මධ්‍යස්ථානයෙහි අධ්‍යක්ෂ ලෙස තවදුරටත් කටයුතු කළේය. වෛද්‍ය අධ්‍යාපනයට සම්බන්ධ එක් (01) උපදේශකයෙක් ද, එක් (01) කථිකාචාර්යවරයෙක් ද එක් (01) පරිවාස කථිකාචාර්යවරයෙක් ද වශයෙන් කාර්ය මණ්ඩලයෙහි තුන් (3) දෙනෙක් කේන්ද්‍රයට සම්බන්ධව සිටියහ.

**ප්‍රථම උපාධි වැඩසටහන්**

උසස් පෙළ 2003, 2004, 2005, 2006 සහ 2007 යන ශිෂ්‍ය කණ්ඩායම් සම්බන්ධව විෂය මාලා පිළිබඳ ප්‍රතිචාර ලබා ගැනීම සඳහා ශිෂ්‍ය අධ්‍යයන කමිටු රැස්වීම් පවත්වන ලදි.

"ශිෂ්‍ය අධ්‍යයන කමිටුවෙහි කාර්යක්ෂමතාව වැඩි කිරීම" සඳහා වැඩමුළුවක් උසස් පෙළ 2003, 2004, 2005, 2006 සහ 2007 ශිෂ්‍ය කණ්ඩායම් වෙනුවෙන් පැවැත්විණ.

"ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේද" යන මැයෙන් වැඩමුළුවක් වෛද්‍ය අයි. එම්. කරුණාතිලක සහ වෛද්‍ය ඒ. එම්. ඔළුපැලියාව විසින් අළුතින් බඳවා ගනු ලැබූ පර්යේෂණ සහකාරවරුන් සඳහා පවත්වන ලදි.

2007 උසස් පෙළ වෛද්‍ය ශිෂ්‍ය කණ්ඩායම හා 2006 උසස් පෙළ විද්‍යාවේදී BSc. භෞත චිකිත්සක ශිෂ්‍ය කණ්ඩායම සඳහා නවකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදි.

පීඨ දින දර්ශනයෙහි අධ්‍යයන ඒකක ඇගයීම් නැවත ස්ථාන ගත කිරීම් ගැන ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින් සමග සාකච්ඡා සහ ඇගයීම් ඒකාග්‍ර කිරීම සවිස්තරාත්මක ව පැවති අතර කාර්ය සැලැස්මක් ද ඇති කරන ලදි.

වෛද්‍ය අධ්‍යාපන සංවර්ධන හා පර්යේෂණ මධ්‍යස්ථානය (MEDARC) කාර්ය මණ්ඩලය ඉගෙනීම්/ඉගැන්වීම් කර්තව්‍යයන්, ඇගයීම් හා මැනබැලීම් වෙත සහය දැක්වීම සඳහා සියළු විෂය සංරචක කමිටු වෙත වෙන් කරන ලදි.

ව්‍යවහාරික විද්‍යා විෂයධාරාව තුල පාදක විෂය සංරචක සංවර්ධනය කිරීම සඳහා දායක වීම

වෛද්‍ය අධ්‍යාපන සංවර්ධන හා පර්යේෂණ මධ්‍යස්ථානය (MEDARC) කාර්ය මණ්ඩල සාමාජිකයන් විද්‍යාවේදී භෞත චිකිත්සවේදය හා වෘත්තීය චිකිත්සවේදය යන විෂය මාලා සංවර්ධන කමිටුවෙහි සාමාජිකයන් ලෙස ක්‍රියා කළහ.

අවසන් වසර අධ්‍යයන පරිසරය පිළිබඳ ප්‍රතිචාර දැන ගැනීම සඳහා මෑත කාලීන උපාධිධාරීන් සමග ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා පවත්වන ලදි.

නව සීමාවාසික වෛද්‍ය නිලධාරීන් සඳහා නවකයන් දැනුවත් කිරීමේ වැඩසටහන (නේවාසික වෛද්‍ය නිලධාරියෙකු ලෙස භූමිකාව හා වගකීම) 2008 ජූලි මස 3 වන දින ශ්‍රී ලංකා ජාතික රෝහලෙහි (NHSL) හා රිජ්වේ ආර්යා රෝහලෙහි (LRH) හි ජ්‍යෙෂ්ඨ උපදේශකයින් සමග පවත්වන ලදි.

**ව්‍යාප්ති පාඨමාලා**

අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා IRQUE ව්‍යාපෘතිය මගින් ප්‍රතිපාදන සපයනු ලබන කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහනක් වෛද්‍ය අධ්‍යාපන සංවර්ධන හා පර්යේෂණ මධ්‍යස්ථානය (MEDARC) කණ්ඩායම විසින් සංවර්ධනය කරන ලදී.

ව්‍යසන කළමණාකරනය සඳහා වන හර කණ්ඩායම විසින් ව්‍යසන කළමණාකරනය පිළිබඳ දෙවන සාර්ථක සහතික පත්‍ර පාඨමාලාව පවත්වන ලදී.

**පශ්චාත් උපාධි වැඩසටහන්**

වෛද්‍ය අයි. එම්. කරුණාතිලක විසින් IRQUE ව්‍යාපෘතියෙහි වෛද්‍ය අධ්‍යාපනයෙහි ක්‍රියාකාරකම් පුහුණු කිරීමේ වැඩසටහන් සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී. වෛද්‍ය අධ්‍යාපනයෙහි දූරස්ථ අධ්‍යයන පාඨමාලා (ඩන්ඩී විශ්වවිද්‍යාලය) හැදෑරූ පීඨ සාමාජිකයින් හත්දෙනා අතුරින් තිදෙනෙක් පාඨමාලාව සම්පූර්ණ කර ඇත. MEDARC කාර්ය මණ්ඩල සාමාජිකයන් දේශීය නිබන්ධකවරුන් ලෙස ක්‍රියා කළහ.

**කාර්ය මණ්ඩල සංවර්ධනය**

1. **"විවෘත දිනය – 2008"** ව්‍යාප්ති පීඨ කාර්ය මණ්ඩලය වෙනුවෙන් සායනික විද්‍යා විෂය ධාරාවන්හි අරමුණ සාකච්ඡා කිරීම සඳහා 2008 මැයි මස 14 වන දින පවත්වන ලද අතර යෝජනා සහ ප්‍රතිචාර ලබා ගන්නා ලදී.
2. හෞත චිකිත්සක පාඨමාලාව සඳහා පළමු **සායනික අදියරෙහි විෂයමාලා සංවර්ධන වැඩමුළුව** 2008 ජූලි මස 9 වන දින පවත්වන ලදී.
3. හෞත චිකිත්සක පාඨමාලාව සඳහා දෙවන **සායනික අදියරෙහි විෂයමාලා සංවර්ධන වැඩමුළුව** 2008 සැප්තැම්බර් මස 18 වන දින පවත්වන ලදී.
4. අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා "දිවා ආහාර අතර සම්භාෂන" පවත්වන ලදී. (V-26 වගුව).

**V-25 වගුව : අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා දිවා ආහාර අතර සම්භාෂන**

| නම | මාතෘකාව | දිනය |
|---|---|---|
| වෛද්‍ය තිලූක්ෂි අබේසිංහ | සම කණ්ඩායම් තුලින් අධ්‍යයනය | 2008.02.29 |
| වෛද්‍ය ජී ආර් කොන්ස්ටන්ටයින් හා වෛද්‍ය ආර් හනීෆා | සායනික ඉගැන්වීම් තුල නිවාසිගත ප්‍රතිකාර (Ambulatory Care in Clinical Teaching) | 2008.08.08 |
| මහාචාර්ය ජෙනිෆ පෙරේරා | සිසුන් හට කාර්යක්ෂම ප්‍රතිචාර ලබා දීම | 2008.10.17 |

**V-26 වගුව : වැඩමුළු හා පුහුණු වැඩසටහන් හිදී කාර්ය මණ්ඩල සහභාගිත්වය**

| නම | මාතෘකාව | දිනය |
|---|---|---|
| මහාචාර්ය කොල්වින් ගුණරත්න<br>වෛද්‍ය ඉන්දික කරුණාතිලක<br>වෛද්‍ය ගෝමින්ද පොන්නම්පෙරුම | "Best Response MCQs – Clarifying your Concerns" යන මැයෙන් ප්‍රථම වැඩමුළුව | 2008.03.24 |
| වෛද්‍ය අයි. එම්. කරුණාතිලක<br>වෛද්‍ය ඒ එම් ඔළුපැලියාව | "How to be an Effective PBL/SGD Facilitator" යන මැයෙන් පුහුණු වැඩමුළුව | 2008.08.11 |
| | "Trends in Health Profession Education" පිළිබඳ වැඩමුළුව | 2008.09.23 |
| | "Essential of Curriculum Rivision" වැඩමුළුව | 2008.09.26 |
| මහාචාර්ය කොල්වින් ගුණරත්න<br>මහාචාර්ය ලලිතා මැන්ඩිස්<br>වෛද්‍ය ඉන්දික කරුණාතිලක | "Best Response MCQs – Clarifying your Concerns" යන මැයෙන් දෙවන වැඩමුළුව | 2008.09.10 |
| වෛද්‍ය අයි එම් කරුණාතිලක | "Curriculum Development" පිළිබඳ වැඩමුළුව | 2008.09.04,05 |
| මහාචාර්ය ලලිතා මැන්ඩිස්<br>වෛද්‍ය අයි එම් කරුණාතිලක | "Task Based Learning" පිළිබඳ වැඩමුළුව | 2008.11.19 |

V-27 වගුව: ප්‍රකාශන හා ඉදිරිපත් කිරීම්

| ප්‍රකාශන හා ඉදිරිපත් කිරීම් | ප්‍රකාශන සංඛ්‍යාව |
|---|---|
| ප්‍රකාශන පර්යේෂණ වාර සඟරා | 01 |
| විපයානුබද්ධ ලිපි, වාර්තා, කතෘ වාක්‍ය සහ වෙනත් ලේඛන | 05 |
| සංක්ෂේප සහ ඉදිරිපත් කිරීම් | 12 |

## Virtual Learning කේන්ද්‍රය

### හැඳින්වීම

කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයෙහි (UCFM) **Virtual Learning කේන්ද්‍රය** දැනට ක්‍රියාත්මක වනුයේ එහි ප්‍රධානී වන සායනික වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වෛද්‍ය සේනක රාජපක්ෂ මහතාගේ අධීක්ෂණය යටතේය. මෙහි පරිගනක **69**ක් සහිත මධ්‍යම විද්‍යාගාරයෙහි මධ්‍යගත බෙදාහැරීම් පහසුකම් ද (Central Server) වේ.

මෙම විද්‍යාගාරයෙහි කොටසක් සමහර වේලාවන්හිදී භාෂා පිළිබඳ පාඨමාලා පැවැත්වීම සඳහා භාෂා මධ්‍යස්ථානය විසින් හවුලේ භාවිතා කෙරේ.

මෙම වසර තුළ ස්ථිර කාර්ය මණ්ඩලය දෙදෙනෙක් ද (02) එක් (01) ජාල පරිපාලකවරයෙක් ද එක් (01) පරිගනක යෙදවුම් සහකාරවරයෙක් ද කටයුතු කරන ලදී.

පීඨයෙහි එක් එක් අධ්‍යයනාංශයන්ට ද, ඒකකයන්ට ද , විෂය ධාරා හා සංරචක වලටද සම්බන්ධ නියෝජිතයන් කේන්ද්‍රයෙහි VLC කමිටුවෙහි වේ. කේන්ද්‍රය සඳහා උපදේශකත්වය දෙමින් මෙම කමිටුව ක්‍රියා කරයි. VLC කමිටු කැඳවුම්කරු ලෙස ආචාර්ය දීපිකා ප්‍රනාන්දු ක්‍රියා කළාය.

### ප්‍රථම උපාධි වැඩසටහන්

ඉගෙනුම් කළමණාකරණ පද්ධතියක් වන මූඩ්ල් (moodle) නමින් හැඳින්වෙන වෙබ් ද්වාරය මෙම VLC සම්පත් වෙත ළඟා වීම සඳහා සංවර්ධනය කර ඇත. මෙම LMS විශේෂය කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක පාසැල ඇතුළු නොයෙක් විශ්වවිද්‍යාලයන්හි බොහෝ සෙයින් භාවිතයට ගැනෙන අතර මෙය බල පත්‍ර අවශ්‍ය නොවන විවෘත මූලාශ්‍ර පද්ධතියක් වේ. මෙම LMS විශේෂයෙන් සිසුනට භාවිත නාමයක් (username) සහිතව ලියාපදිංචි වීමේ හැකියාව ලබා දෙන අතර කාර්ය මණ්ඩලය විසින් සම්පාදිත ඉගෙනුම් සම්පත් වෙත ළඟාවීමට ඒ ඔස්සේ ඉඩ කඩ සැපයේ. එක් එක් අයගේ භාවිතය පිළිබඳවද අගැයීම් සැසි වලදී ශිෂ්‍යයන් විසින් ලබා ගන්නා ලද ලකුණු ප්‍රමාණ පිළිබඳවද සොයා ගැනීමට මෙම පද්ධතිය භාවිතා කළ හැක.

VLC මගින් ලබා දී ඇති පහසුකම් භාවිතා කර පහත දැක්වෙන ඉලක්ක වෙත ළඟා වන ලදී.

- VLC සංදර්ශකයන් විසින් කථිකාචාර්යවරුන් කිහිපදෙනෙකු හට තම දේශන සැපයීම සඳහා උපකාරී වී තිබේ. ඒ වෙත ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන් විසින් ළඟා විය හැක.
- **2008** වසරේදී වෛද්‍ය පීඨයට ඇතුළත් වූ **2007** උසස් පෙළ ශිෂ්‍ය කණ්ඩායමට ඉංග්‍රීසි ඉගැන්වීම සඳහා පරිගණක භාවිතය
- සරල ඉංග්‍රීසි බසින් අන්තර්ක්‍රියාකාරී සංරචක සම්පාදනය

මේවාට අමතරව, පර්යේෂණ වාර්තා සැකසීම, පර්යේෂණ ව්‍යාපෘති සඳහා ලේඛන සෝදිසි කිරීමට අන්තර්ජාලය වෙත එළඹීම, SPSS භාවිතයෙන් කෙරෙන ප්‍රජා පර්යේෂණ ව්‍යාපෘති වල දත්ත විශ්ලේෂණය වැනි කාර්ය සඳහා ශිෂ්‍යයන් VLC වෙත පැමිණේ.

**කාර්ය මණ්ඩල වැඩසටහන්**

"Virtual Learning" කේන්ද්‍රය තම ඉලක්කය සපුරා ගැනීමට තම් අන්තර්ක්‍රියාකාරී ඉගෙනුම් සම්පත් සංවර්ධනය කිරීම වෙත කාර්ය මණ්ඩලය පුහුණු කිරීම ඉතාම වැදගත් කරුණකි. පිළියල කර ඇති Moodle වෙබ් ද්වාර ඔස්සේ ශිෂ්‍යයන් අවශ්‍ය සම්පත් වෙත ළඟා වනු ඇත. පවර් පොයින්ට් සහ ආටිකියුලේට් භාවිතා කරමින් කාර්ය මණ්ඩලය විසින් නිශ්පාදනය කර ඇති අන්තර්ක්‍රියාකාරී බහුමාධ්‍ය ඉගෙනුම් සම්පත් ශිෂ්‍යයන්ගේ ප්‍රයෝජනය සඳහා ලබා දී ඇත. මෙම ඉගෙනුම් සම්පත් මගින් වර්තමානයෙහි පවත්නා ඉගෙනුම් ක්‍රමවේද වැඩිදියුණු කර ඒක රාශී කිරීමක් සිදු වනු ඇතැයි බලාපොරොත්තු වේ.

පීඨයෙහි කාර්යමණ්ඩලය අන්තර්ක්‍රියාකාරී ඉගෙනුම් සම්පත් නිර්මාණය පිළිබඳ වැඩමුළු වලට සහභාගී වූ අතර කේන්ද්‍රය විසින් සම්බන්ධීකරණය කරන ලද SPSS සම්බන්ධ වැඩමුළුවකටද සහභාගී වූහ.

කොළඹ විශ්වවිද්‍යාලයෙහි වෛද්‍ය පීඨයත් මොරටුව විශ්වවිද්‍යාලයෙහි ඉංජිනේරු පීඨයත් අතර සම්බන්ධතා ඇති කර ගන්නා ලදී.

**යටිතල සම්බන්ධතා සහ සංවර්ධන අවස්ථා**

මෙම කේන්ද්‍රය (VLC) අනෙකුත් විශ්වවිද්‍යාල වෙත හා පෞද්ගලික භාවිතා කරන්නන් වෙත අලෙවියෙන් පීඨයට හා එක් එක් කාර්ය මණ්ඩල සාමාජිකයන් හට ආදායම් ජනනය කර ගත හැක. CAL විද්‍යාගාරයෙහි ඇති සම්පත් ද ආයතන හා සංගම් වෙත පරිගනක පහසුකම් අවශ්‍ය කරන වැඩමුළු හා විද්‍යාත්මක සැසි සඳහා කුලී පදනමින් ලබා දිය හැක. ඖෂධ වර්ග සම්බන්ධ වෙළඳ ආයතන වැනි පුද්ගලික ආයතන වලින් අනුග්‍රහ ලැබ ගැනීමේ හැකියාව ද සලකා බැලිය හැකි අතර, විශ්වවිද්‍යාල රෙගුලාසි ඇතුළත එවැනි අනුග්‍රහයන් ලබාගැනීමට ඇති ඉඩකඩ ද සොයා බැලේ. ඊට අමතරව මෙහි (VLC) කැපවීමෙන් කටයුතු කරන කාර්ය මණ්ඩලය විසින් අනෙකුත් විශ්වවිද්‍යාල හා ආයතන වෙත වෙබ් පිටු සැකසුම් වැනි සේවා සැපයීම් මගින් සැහෙන ප්‍රමාණයක අරමුදල් රැස් කළ හැකි වනු ඇත.

**සත්වාගාරය**

**හැඳින්වීම**

සත්වාගාරය විසින් වඳුරු, ගෘහස්ත මීයන් හික්මීයන් හා රට හාවුන් ගහණ (කොලනි) පවත්වාගෙන යනු ලබන අතර එයින් කොළඹ විශ්වවිද්‍යාලයීය අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් භාරගෙන ඇති පර්යේෂණ වැඩසටහන් සඳහා ද එසේම ප්‍රථම උපාධි ඉගැන්වීම්, පශ්චාත් උපාධි සහ ප්‍රථම උපාධි පර්යේෂණ වැඩසටහන් සඳහාද සතුන් හා කාර්මික සහය ලබා දේ.

අපගේ දැක්ම වනුයේ මෙම සත්ව නිවස්න නව්‍යතම පහසුකම් සහිත සත්ව පර්යේෂනයන් හා සම්බන්ධ උත්කෘෂ්ට කේන්ද්‍රයක් බවට පත් කිරීමයි.

**කාර්ය මණ්ඩලය**

සත්වාරයෙහි ප්‍රධානී ලෙස ජෛව රසායන විද්‍යා අධ්‍යයනාංශයෙහි ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය එස්. ජීවදයාපරන් පත් කරන ලදී. අනධ්‍යයන කාර්ය මණ්ඩලයෙහි කාර්මික නිලධාරීන් දෙදෙනෙක් ද (02) නුපුහුණු කම්කරු නිලධාරීන් සතර දෙනෙක් ද (04) වූහ.

**ප්‍රථම උපාධි වැඩසටහන්**
වෛද්‍ය පීඨය හා විද්‍යා පීඨය එක්ව පවත්වනු ලබන විද්‍යාවේදී ඖෂධවේදය පිළිබඳ වැඩසටහන හදාරන ප්‍රථම උපාධි අපේක්ෂකයින් විසින් තම ශිෂ්‍ය පර්යේෂණ කටයුතු සඳහා සත්වාගාරයෙහි පහසුකම් භාවිතා කරනු ලැබේ. ප්‍රථම උපාධි ප්‍රායෝගික වැඩසටහන් සඳහා සත්ත්ව විද්‍යා අධ්‍යයනාංශය ද මෙම පහසුකම් වලින් ප්‍රයෝජන ලබයි.

**පශ්චාත් උපාධි වැඩසටහන්**
සත්වාගාරයෙහි පහසුකම් කොළඹ විශ්වවිද්‍යාලයෙහි ජෛව රසායන සහ අණුක ජීව විද්‍යා, පරපෝෂිතවේද, ඖෂධවේද, භෞත චිකිත්සා, යන අධ්‍යයනාංශ වල සහ ජෛව රසායන අණුක ජීව විද්‍යා හා ජෛව තාක්ෂණ අධ්‍යයනායතනයේ කාර්ය මණ්ඩලයෙහි හා පශ්චාත් උපාධි අපේක්ෂක සිසුන්ගේ පර්යේෂණ කටයුතු සඳහා භාවිතා වේ. පහසුකම් සැපයෙන පශ්චාත් උපාධි පාඨමාලා අතර දර්ශනපති, දර්ශනශූරි සහ දර්ශන විශාරද යන පශ්චාත් උපාධි පාඨමාලා ද වේ.

**පර්යේෂණ**

**සිම්යන් මැලේරියා ව්‍යාපෘතිය**
මෙය පරපෝෂිතවේද අධ්‍යයනාංශයෙහි මැලේරියා පර්යේෂණ ඒකකය මගින් පවත්වනු ලබන ප්‍රධාන පර්යේෂණ ව්‍යාපෘතියකි. මේ සඳහා සත්ව නිවස්න මගින් 1984 සිට මැලේරියාව පිළිබඳ පර්යේෂණ සඳහා වඳුරන් 30ත් 40ත් අතර සංඛ්‍යාවක් නඩත්තු කෙරේ. මෙම වැඩසටහන මැලේරියාවට අදාල නොඉදුල් පර්යේෂණාත්මක සොයා ගැනීම් කිහිපයකට එනම් ප්‍රතිශක්තියට බාධාවන විපරිවර්තනය, ලිංගික නොවන රුධිර අවස්ථාවලට එරෙහි ප්‍රතිශක්තිය සහ ආසාදන මගහැරවීම යනාදියට මග පෑදිය.

සත්වාගාරය තම සේවා පර්යේෂණ ව්‍යාපෘති නවයකට (9) සැපයූ අතර පර්යේෂණ ප්‍රකාශන හා සන්නිවේදන තුනකට (3) දායක විය.

## IRQUE-QEF, MBBS අධ්‍යයන වැඩසටහන්

**ව්‍යාපෘති පසුබිම හා මූලකාරණය**
දශකයකට ප්‍රථම, කොළඹ විශ්වවිද්‍යාලයෙහි වෛද්‍ය පීඨය (UCFM) විසින් තම ප්‍රථම උපාධි වෛද්‍ය විද්‍යා විෂය මාලාව සංශෝධනය ආරම්භ කරන ලදී. එබැවින්, එහි ශිෂ්‍යයන් හා කාර්ය මණ්ඩලය විසින් IRQUE QEF වෙතින් සැපයෙන අරමුදල් ලැබෙන තුරු ඉතා ඕනෑකමින් බලා සිටි අතර, රටෙහි පැරණිතම වෛද්‍ය විද්‍යා පාසල ද ශ්‍රී ලංකාවෙහි වෛද්‍ය අධ්‍යාපනයෙහි ආරම්භකයාද වූ පීඨයෙහි වැඩිදුර සංවර්ධනය සඳහා එම අරමුදල් අත්‍යවශ්‍ය යැයි සලකන ලදී.

**ව්‍යාපෘතියෙහි පරමාර්ථ**
UCFM හි දර්ශනය හා මෙහෙවර ට ද කොළඹ විශ්වවිද්‍යාලයෙහි සංයුක්ත සැලැස්මටද අනුකූලව අධ්‍යයන වැඩසටහනෙහි පුළුල් පරමාර්ථ ඉටුවන පරිදි මුල් යෝජනාවලියේ විශේෂයෙන් එළි දක්වා තිබූ සවිස්තරාත්මක ශුඳුඅත (SWOT) විශ්ලේෂණයක් මත හිඳ හඳුනාගත් ගැටළු සැලකිල්ලට ගනිමින් මෙම යෝජනාවලිය සකසන ලදී. ව්‍යාපෘතියෙහි පරමාර්ථ වනුයේ: රටෙහි දේශීය, සමාජයීය හා ආර්ථික අවශ්‍යතා වලට සරිලන සේ විවිධ වූ අවස්ථා වලදී කාර්යක්ෂම සෞඛ්‍ය ආරක්ෂණ සේවාවක් ලබාදීමට හැකියාව ඇති වෛද්‍ය උපාධිධාරියෙකු නිෂ්පාදනය කිරීම; කිසිදු භේදයකින් තොරව සෞඛ්‍ය පද්ධතියක් තුල ක්‍රියාකාරී වීමට හැකියාවැති, විවිධ කණ්ඩායම් අතර සුහදත්වය වර්ධනය කරමින්, පරිසරයේ හා ප්‍රජාවගේ අවශ්‍යතා කෙරෙහි ප්‍රතිචාර සහිත වූද වගකීමෙන් යුතු වූද ලෙසින් කටයුතු කරන, උපාධිධාරියෙකු නිෂ්පාදනය කිරීම; රාජ්‍ය සෞඛ්‍ය සේවාව ට පරහාහිරව රැකියා

ලබා ගැනීමේ හැකියාවෙන් උපාධිධාරියා බලසම්පන්න කළ හැකි නිපුණතාවන් ඇති කිරීමත් කාර්යක්ෂම කළමණාකරනයක් සඳහා UCFM හි පරාසය හා ආයතනික සැකිල්ල සංවර්ධනය කිරීම හා ඒ මගින් නිෂ්පාදනය පුළුල් කිරීම යනාදිය වේ.

**කාර්ය මණ්ඩල තොරතුරු**

IRQUE-QEF-MBBS අධ්‍යයන වැඩසටහන් කාර්යාලයෙහි සම්බන්ධීකාරක. මහාචාර්ය චන්ද්‍රිකා විජේරත්න ද නියෝජ්‍ය සම්බන්ධීකාරක ආචාර්ය සිසිර එල් පතිරණ ද එක් ව්‍යාපෘති කාර්ය මණ්ඩල සාමාජිකයෙකුගේ සහාය ඇතිව කටයුතු කරති.

**ප්‍රථම උපාධි වැඩසටහන**

මෙම ව්‍යාපෘතියෙහි අවසාන ප්‍රතිඵලය හා ප්‍රතිලාභය වනුයේ සෞඛ්‍ය සේවා වෘත්තිකයන් ලෙස ශ්‍රී ලංකාවට අදාල වෙනස් වන සමාජීය හා ආර්ථික සංවර්ධන අවශ්‍යතා වෙත දායකවන වඩා හොඳ තත්ත්වයේ වෛද්‍ය උපාධිධාරීන් බිහි කිරීම යි. එබැවින්, තම ක්‍රියාකාරකම් ඔස්සේ ව්‍යාපෘතිය උපාධිධාරීන්ගේ තත්ත්වය වැඩි දියුණු කිරීමට උපකාරී වේ.

**ව්‍යාප්ති පාඨමාලා/ප්‍රජා සේවා සත්කාර වැඩසටහන්**

ව්‍යාපෘතියෙහි කිසිදු ඍජු ප්‍රජා සේවා වැඩසටහන් නොමැති වුවද, C1A1 ක්‍රියාකාරකම් මගින් ප්‍රජා ඉගැන්වීම් වැඩසටහන් වල තත්ත්වය උසස් කිරීම සහාය දේ. මෙහි අවසන් ප්‍රතිඵලය වනුයේ උපාධි අපේක්ෂකයන් හා බිහිවන උපාධිධාරීන් වෙතින් ප්‍රජාවට වඩා යහපත් සේවාවක් ලබා ගැනීමයි.

**පර්යේෂණ**

ව්‍යාපෘතිය ස්වයං පර්යේෂණයන්හි නිරත නොවේ. කෙසේවෙතත්, **2005** දී ව්‍යාපෘතිය පර්යේෂණ ව්‍යාපෘති **10**ක් සඳහා ද **2006** දී පර්යේෂණ ව්‍යාපෘති **9**ක් සඳහා ද **2008** දී ව්‍යාපෘති **8**ක්ද සඳහා ද මූල්‍යමය දායකත්වය ලබා දුනි. **2009** දී මූල්‍ය ආධාර මත තවත් පර්යේෂණ ව්‍යාපෘති **12**ක් සඳහා ව්‍යාපෘති සැලසුම් සඳහා ඇරයුම් කර තිබේ. මෙම පර්යේෂණ ව්‍යාපෘති ශිෂ්‍ය සහභාගිත්වය සහිතව අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් සිදුකරන ලදී. ශිෂ්‍යන්ගේ පර්යේෂණ වැඩිදියුණු කිරීම සඳහා ශිෂ්‍යයන් හටද ජාත්‍යන්තර සම්මන්ත්‍රණ වලදී තම පර්යේෂණාත්මක සොයාගැනීම් ඉදිරිපත් කිරීමට ඉඩදෙනු වස් ප්‍රවාහන දීමනා ලබා දෙන ලදී.

**යටිතල පහසුකම් හා සම්පත්**

ව්‍යාපෘතිය විසින් ලෝක බැංකු ණය පහසුකම් යටතේ USD 998,944 ක් භාවිතා කරමින් **5** අවුරුදු කාල සීමාවක් සඳහා යටිතල පහසුකම් සම්පාදනය හා අනෙකුත් ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය සිදු කරනු ලබයි.. මෙයින් රුපියල් මිලියන **70**ක මුදලක් මේ වන විට වියදම් කර ඇත.

## විද්‍යා පීඨය

### හැඳින්වීම

2008 වසරෙහිදී මහාචාර්ය ටී. ආර්. ආරියරත්න මහතා විද්‍යා පීඨයේ නව පීඨාධිපති ධූරයට නිතරගයෙන් 2008.01.10 දින සිට තේරී පත් විය. මහාචාර්ය ආර් එල් සී විජේසුන්දර 2007.12.31 දින පීඨාධිපති ලෙස තම ධූරකාලය අවසන් කළේය. මහාචාර්ය ටී. ආර්. ආරියරත්න පීඨයෙහි පීඨාධිපති ලෙස 2008.01.10 දින වැඩ භාර ගන්නා තෙක් 2008.01.01 දින සිට 2008.01.10 දක්වා වූ කෙටි කාලය මහාචාර්ය ආර් හේවාමාන්න වැඩ බලන පීඨාධිපති ලෙස සේවය කළාය.

2007 අ.පො.ස. උසස් පෙළ නව ශිෂ්‍ය කණ්ඩායම පීඨයට ඇතුලත් කර ගන්නා ලද්දේ 2008.08.06 වන දිනදීය. භෞතික විද්‍යා අධ්‍යයනාංශයට හා ජෛව විද්‍යා අධ්‍යයනාංශයට ඇතුලත් කර ගන්නා ලද ශිෂ්‍ය සංඛ්‍යා පිළිවෙලින් 242 හා 121කි. අමතරව සෘජු ඇතුලත් කරගැනීම් දෙකක් ලෙස සිසුන් 53 දෙනෙක් හා 57 දෙනෙක් පිළිවෙලින් ජෛව රසායන හා අනුක ජීව විද්‍යා අධ්‍යයනාංශය සහ කාර්මික සංඛ්‍යානය හා මූල්‍ය ගණිත අධ්‍යයනාංශය වෙත ඇතුලත් කර ගැණිනි. කාල සටහන ප්‍රකාර පීඨය තම අධ්‍යයන වැඩසටහන් සාර්ථක ව පවත්වන්නට යෙදුණි.

පීඨය විසින් කොළඹ විශ්වවිද්‍යාලයත් ඔස්ට්‍රේලියාවේ ලා ට්‍රෝබ් විශ්වවිද්‍යාලයත් අතර ලගා කර ගත් ගිවිසුමකට අනුව සීමාවාසික වැඩසටහනකට යැවීම සඳහා සිසුවකු තෝරා ගෙන ඇත. විද්‍යා පීඨයත් ඇමරිකා එක්සත් ජනපදයේ ජෝර්ජියානු ජනපද විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර හා විද්‍යා කොලීජියත් අතර තවත් ගිවිසුමකට එළඹ ඇත්තේ 3 + 2 විද්‍යාවේදී (භෞතික විද්‍යා) ලෙස නම් කර ඇති බද්ධ ප්‍රථම උපාධි පාඨමාලාවක් ඇති කර ගැනීම සඳහා ය.

මහාචාර්ය ඩබ්. ඩී. රත්නසූරිය වෙත පේරාදෙනිය විශ්වවිද්‍යාලය විසින් විද්‍යාව පිළිබඳ අධ්‍යයන දර්ශන ශූරි උපාධියක් (D.Sc.) පිරිනමා ඇත.

විද්‍යා පීඨය තම වාර්ෂික අධ්‍යයන සැසි සාර්ථක ලෙස 2008.10.24 දින කොළඹ විශ්වවිද්‍යාලයීය අධ්‍යාන සැසි හා සමගාමීව පවත්වන ලදි.

විද්‍යාවේ ඉදිරි ගමන සඳහා ශ්‍රී ලංකා සංගමයෙහි (SLAAS) වාර්ෂික සැසි, විද්‍යා පීඨයෙහි දී 2008 දෙසැම්බර් 3 - 6 අතර කාලය තුල පැවැත්විණ.

විද්‍යා පීඨයෙහි ශිෂ්‍යයන් සමාලෝචිත වර්ෂය තුල ක්‍රීඩා දිනය, නවකයින් පිළිගැනීම, දහඅටපාළිය හා මහසෝන් සමයම, අවුරුදු උත්සවය සහ ගී පැදුර, ශීල ව්‍යාපාරය, සහ වෙසක් භක්ති ගීත, සෙත් පිරිත් සජ්ඣායනය සහ ශ්‍රමදාන ව්‍යාපාරය වැනි සංස්කෘතික හා වෙනත් ක්‍රියාකාරකම් කිහිපයක් ද ලේ දන්දීමේ ව්‍යාපාරයක් ද සිදු කළහ. සය සාමාජික සැහැල්ලු පන්දු ක්‍රිකට් තරගාවලියක් ද විද්‍යා පීඨ සිසුන් විසින් සංවිධානය කරනු ලැබූ අතර එය මූල්‍යමය දුෂ්කරතා සහිත ග්‍රාමීය ප්‍රදේශ වලින් පැමිණි සිසුන් හට නේවාසික පහසුකම් ඇති කිරීම සඳහා මුදල් රැස් කිරීම වෙනුවෙන් සිදු කරන ලද්දකි.

### කාර්ය මණ්ඩල තොරතුරු

වසර තුල මතු දැක්වෙන කාර්ය මණ්ඩල සාමාජිකයන් වරහන් තුල දක්වා ඇති අධ්‍යයනාංශයන්හි අංශාධිපතීන් ලෙස කටයුතු කළහ.. මහාචාර්ය ටී ආර් ආරියරත්න 2008.01.09 දක්වා ද මහාචාර්ය ජේ කේ ඩී එස් ජයනෙත්ති 2008.01.10 සිට (භෞතික විද්‍යා) ; සී ජේ විජේරත්න 2008.06.11 දක්වා සහ ආචාර්ය ආර් ටී සමරතුංග 2008.06.12 සිට (ගණිතය); මහාචාර්ය ආර් හේවාමාන්න 2008.03.11 දක්වා ද ආචාර්ය එස් කුලතුංග 2008.03.12 සිට (න්‍යෂ්ටික විද්‍යාව) ආචාර්ය ටී. ඩී. සිල්වා (ශාක විද්‍යා); ආචාර්ය ඩී ආර් වීරසේකර 2008.01.08 දක්වා සහ ආචාර්ය

ඩබ්. එන් වික්‍රමසිංහ 2008.01.09 සිට (සංඛ්‍යාන); ඩී එන් ද සිල්වා මිය 2008.08.14 දක්වා සහ මහාචාර්ය ඩබ් එස් ප්‍රේමවංස 2008.18.15 සිට (ජීව විද්‍යා).

**V-28 වගුව : පත්වීම්, උසස් වීම්, විශ්‍රාම යෑම් සහ ඉල්ලා අස්වීම්**

| නම | අධ්‍යයනාංශය | තනතුර | ක්‍රියාත්මක දිනය |
|---|---|---|---|
| **උසස් වීම්** | | | |
| මහාචාර්ය ඊ. ඩී. ද සිල්වා | රසායන විද්‍යා | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | 2005.12.01 |
| මහාචාර්ය කේ. ආර්. ආර්. මහානාම | එම | මහාචාර්ය | 2007.09.06 |
| ආචාර්ය ඩබ්. ආර්. එම්. ද සිල්වා | එම | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය | 27.04.2007 |
| ආචාර්ය එස්. රත්වල | ශාක විද්‍යා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය | 2007.07.23 |
| ආචාර්ය පී. සපුතන්ත්‍රී | එම | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය | 2006.12.10 |
| ඊ. එස්. කරුණාරත්න මෙනෙවිය | එම | කාර්මික නිලධාරී I ශ්‍රේණිය | 2006.01.01 |
| ආචාර්ය සී. ඩී. දන්ගල්ල | ජීව විද්‍යා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය | 2008.01.01 |
| ආචාර්ය එම්. ආර්. විජේසිංහ | එම | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය | 2007.11.05 |
| ආචාර්ය සී. ඩී. තිලකරත්න | සංඛ්‍යානය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය | 2008.05.05 |
| **ඉල්ලා අස්වීම්** | | | |
| ආචාර්ය ජී. කේ. කේ. ප්‍රේමදාස | ගණිතය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය | 2008.03.01 |
| **විශ්‍රාම යාම්** | | | |
| මහාචාර්ය කේ. අබේනායක | ශාක විද්‍යා | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | 2008.09.30 |

## පීඨ පත්වීම්

ආචාර්ය සී. එම්. එදිරිසිංහ විශ්වවිද්‍යාලයීය තොරතුරු තාක්ෂණ කමිටුවෙහි ද, පීඨ තොරතුරු තාක්ෂණ හා ජාල කමිටුවෙහි ද පීඨ නියෝජිත ලෙස හා පීඨයෙහි වෙබ් ප්‍රධානී ලෙස ක්‍රියා කළේය. මහාචාර්ය ඩී. යූ. ජේ. සොන්නාදර හා ආචාර්ය ටී. ඩී. සිල්වා ප්‍රථම උපාධි හා පශ්චාත් උපාධි අධ්‍යයන අධ්‍යක්ෂකවරු වශයෙන් තවදුරටත් කටයුතු කළහ.

ආචාර්ය එස් වීරසිංහ හා ආචාර්ය ඩබ්. බී. යාපා වැඩිදියුණු කිරීමේ පාඨමාලාවල පීඨ සම්බන්ධීකාරකවරු ලෙස තවදුරටත් කටයුතු කළහ. ඊට අමතරව තත්ත්ව සහතික. විද්‍යා හා තාක්ෂණ මැදිරිය, වෙබ් ආදී වූ වෙනත් කමිටු කිහිපයක් පත් කරන ලදී.

**V-29 වගුව : ත්‍යාග හා දිනා ගැනීම් -2008**

| ලැබූ අය | ත්‍යාග/ ජයග්‍රහණ | ත්‍යාග ප්‍රදානය කරන නියෝජනය |
|---|---|---|
| මහාචාර්ය ඩබ්. ඩී. රත්නසූරිය | D.Sc. | පේරාදෙණිය විශ්වවිද්‍යාලය |
| මහාචාර්ය ඩබ්. ඩී. රත්නසූරිය | කොළඹ විශ්වවිද්‍යාලයෙහි හොඳම පර්යේෂණ විද්‍යාඥ | කොළඹ විශ්වවිද්‍යාලය |
| මහාචාර්ය ඩබ්. ඩී. රත්නසූරිය | ජනාධිපති පර්යේෂණ ත්‍යාගය - 2002 | ජනාධිපති ලේකම් කාර්යාලය |
| මහාචාර්ය ඊ. ඩී. ද සිල්වා | ජනාධිපති පර්යේෂණ ත්‍යාගය - 2002 | ජනාධිපති ලේකම් කාර්යාලය |
| මහාචාර්ය එම්. ආර්. සූරියාරච්චි | ජනාධිපති පර්යේෂණ ත්‍යාගය - 2002 | ජනාධිපති ලේකම් කාර්යාලය |
| මහාචාර්ය ආර්. එල්. සී. විජේසුන්දර | ජනාධිපති පර්යේෂණ ත්‍යාගය - 2002 | ජනාධිපති ලේකම් කාර්යාලය |

**නිවාඩු**
පීඨයෙහි අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 7 දෙනෙකු තම සප්ත වාර්ෂික නිවාඩු ලබා ගන්නා ලද අතර සාමාජිකයන් 8 දෙනෙකු සමාලෝචිත වසර තුල අධ්‍යයන නිවාඩු ලබා ගත්හ.

## ප්‍රථම උපාධි වැඩසටහන්

කාර්මික සහ මූල්‍ය පද්ධති ආයතනය (IFS) විසින් පරිගණක විද්‍යා පාඨමාලා හදාරන ප්‍රථම උපාධි අපේක්ෂකයන් සඳහා නොමිලේ තොරතුරු තාක්ෂණ 3001- කළමනාකරණ තොරතුරු පද්ධති හා තොරතුරු තාක්ෂණ 3002 – දත්ත පාදක පද්ධති යන නව පාඨමාලා දෙකක් පවත්වන ලදී. ප්‍රථම උපාධි අපේක්ෂකයන් හට ඉගැන්වීම සඳහා භෞතික විද්‍යා අධ්‍යයනාංශයෙහි පරිගණක විද්‍යාගාරයක්ද ඉදිකරන ලදී.

EC 2010-වෘත්තීය සංවර්ධනය සහ EC 3010- වෘත්තීය සංවර්ධනය යන පාඨමාලා ඒකක EC 3015- වෘත්තීය සංවර්ධනය නමින් හැඳින්වෙන එක් පාඨමාලා ඒකකයක් නිර්මාණය කිරීම සඳහා එක් කරන ලදී. එය තෙවන වසර සිසුන් හට ඉදිරිපත් කර ඇති පැය **30**ක සම්මාන **2**ක පාඨමාලා ඒකකයකි. මෙය EC 4006- සීමාවාසිකය සඳහා පූර්ව අවශ්‍යතාවක් වේ. තවද පාඨමාලාව සඳහා 80% පැමිණීම අනිවාර්ය කර ඇත. එයට අමතරව මෙම 80% පැමිණීමේ අවශ්‍යතාව විශේෂ උපාධි අපේක්ෂකයින් හටද අනිවාර්ය කරන ලදී.

සංඛ්‍යාන අධ්‍යයනාංශය විසින් තම සාමාන්‍ය හා විශේෂ උපාධි වැඩසටහන් වල සැලකිය යුතු වෙනස්කම් සිදු කරන ලදී.

නව ශිෂ්‍ය කණ්ඩායම හට ජීව විද්‍යා උපාධියෙහි තෙවන වසරෙහිදී පාරිසරික විද්‍යාව විශේෂීකරණය සඳහා තේරීමක් ලබා දෙන ලදී.

**V-30 වගුව : පශ්චාත් උපාධි හා ව්‍යාප්ති පාඨමාලාවන් වෙත ශිෂ්‍ය ඇතුළත් කිරීම්**
*(උපාධිය හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව වර්ගීකරණය කර ඇත)*

| පාඨමාලාව | ශිෂ්‍ය සංඛ්‍යාව | | එකතුව |
|---|---|---|---|
| | පුරුෂ | ස්ත්‍රී | |
| ජෛව විවිධත්ව කළමනාකරණ ඩිප්ලෝමාව | 18 | 04 | **22** |
| විකිරණශීලි ආරක්ෂණ ඩිප්ලෝමාව | 05 | 03 | **08** |
| විශ්ලේෂී රසායනවිද්‍යාව පිළිබඳ විද්‍යාපති පාඨමාලාව | 13 | 20 | **33** |
| ව්‍යවහාරික සංඛ්‍යානය පිළිබඳ විද්‍යාපති පාඨමාලාව | 11 | 14 | **25** |
| රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාපති පාඨමාලාව | 05 | 07 | **12** |
| පාරිසරික විද්‍යාව පිළිබඳ විද්‍යාපති පාඨමාලාව | 04 | 12 | **16** |
| භෞතික විද්‍යා අධ්‍යාපනය පිළිබඳ විද්‍යාපති පාඨමාලාව | 10 | 08 | **18** |
| විද්‍යාව පිළිබඳ දර්ශනපති පාඨමාලාව | 03 | 04 | **07** |
| දර්ශනශූරි - විද්‍යා | 01 | 02 | **03** |
| **එකතුව** | **70** | **74** | **144** |

**V-31 වගුව : පශ්චාත් උපාධි වැඩසටහන් වල සම්බන්ධීකාරකවරු**

| අධ්‍යයනාංශ | පාඨමාලාව | තත්ත්වය | සම්බන්ධීකාරක |
|---|---|---|---|
| රසායන විද්‍යා | 24 වන විශ්ලේෂී රසායන විද්‍යා විද්‍යාපති පාඨමාලාව | ආරම්භ විය | ආචාර්ය කේ. ආර්. ආර්. මහානාම |
| රසායන විද්‍යා | ව්‍යවහාරික කාබනික රසායනවිද්‍යාව දෙවන විද්‍යාපති පාඨමාලාව | ආරම්භ විය | ආචාර්ය ඩී. ටී. යූ. අබේතුංග |
| රසායන විද්‍යා | රසායන විද්‍යා අධ්‍යාපනය පිළිබඳ විද්‍යාපති පාඨමාලාව | ආරම්භ විය | මහාචාර්ය එස්. හේවගේ |
| ශාක විද්‍යා | පස්වන ශාක සෛල හා පටක රෝපන විද්‍යාපති පාඨමාලාව | කරමින් පවතී | ආචාර්ය ටී. ඩී. සිල්වා |

| | | | |
|---|---|---|---|
| ශාක විද්‍යා | හයවන ශාක සෛල හා පටක රෝපන විද්‍යාපති පාඨමාලාව | කරමින් පවතී | ආචාර්ය එච්. කත්‍රිආරච්චි |
| ශාක විද්‍යා | පළවන කෘෂිකාර්මික ශුද්‍රජීව විද්‍යා විද්‍යාපති පාඨමාලාව | කරමින් පවතී | ආචාර්ය සී. එම්. නානායක්කාර |
| භෞතික විද්‍යා | භෞතික විද්‍යා අධ්‍යාපනයෙහි පළමු වන විද්‍යාපති පාඨමාලාව | කරමින් පවතී | ආචාර්ය ඩී. ඩී. එන්. බී. දයා |
| භෞතික විද්‍යා | භෞතික විද්‍යා අධ්‍යාපනයෙහි දෙවන විද්‍යාපති පාඨමාලාව | ආරම්භ විය | ආචාර්ය ආර්. එම්. ඩී. කුරේ |
| භෞතික විද්‍යා | ව්‍යාවහාරික ඉලෙක්ට්‍රොනික විද්‍යාව පිළිබඳ දෙවන විද්‍යාපති පාඨමාලාව | කරමින් පවතී | මහාචාර්ය ඩී. යූ. ජේ. සොන්නාදර |
| භෞතික විද්‍යා | ව්‍යාවහාරික ඉලෙක්ට්‍රොනික විද්‍යාව පිළිබඳ තෙවන විද්‍යාපති පාඨමාලාව | කරමින් පවතී | ආචාර්ය සී. එම්. එදිරිසිංහ |
| භෞතික විද්‍යා | ව්‍යාවහාරික ඉලෙක්ට්‍රොනික විද්‍යාව පිළිබඳ හතරවන විද්‍යාපති පාඨමාලාව | ආරම්භ විය | මහාචාර්ය ඩී. යූ. ජේ. සොන්නාදර |
| භෞතික විද්‍යා | වායුගෝලීය භෞතික විද්‍යාව. ගතික කාලගුණවිද්‍යාව සහ ස්වභාවික ව්‍යසන වෙත සැරසී සිටීම පිළිබඳ පළමු විද්‍යාපති උපාධිය | කරමින් පවතී | ආචාර්ය කේ. පී. එස්. සී. ජයරත්න |
| සංඛ්‍යානය | ව්‍යවහාරික සංඛ්‍යානය පිළිබඳ හත් වන විද්‍යාපති පාඨමාලාව | ආරම්භ විය | ආචාර්ය ඩී. ආටිගල |
| ජීව විද්‍යා | පාරිසරික විද්‍යාව පිළිබඳ දොලොස්වන විද්‍යාපති පාඨමාලාව | ආරම්භ විය | ආචාර්ය ඩී. වීරකෝන් |

ඊට අමතරව මෙම වසර තුල දර්ශනශූරි උපාධි 6ක්ද දර්ශන පති උපාධි 8ක්ද ප්‍රදානය කරන ලදී.

## ව්‍යාප්ති පාඨමාලා/ ප්‍රජා සේවා දායක වැඩසටහන්

වැඩමුළු සඳහා ද පුහුණු වැඩසටහන් සඳහා ද කාර්ය මණ්ඩල සාමාජිකයන් කිහිප දෙනෙක් සම්පත් දායකයන් ලෙස ක්‍රියා කළහ. ඒවා නම් නැනෝ විද්‍යා හා නැනෝ තාක්ෂණය පිළිබඳ (මහාචාර්ය කේ එම් එන් ද සිල්වා සහ ආචාර්ය ඩබ් ආර් එම් ද සිල්වා); න්‍යෂ්ටික අවි තොර කිරීම - එහි හැකිකම සහ හැකියාවන් ද එසේම න්‍යෂ්ටික යුද කටයුතු පිළිබඳ න්‍යාය සහ එයින් ලොවට වන බලපෑම (මහාචාර්ය ආර්. හේවාමාන්න); අභ්‍යවකාශ විද්‍යාව (ආචාර්ය කේ. පී. එස්. සී. ජයරත්න); ආලෝක ආරක්ෂනය ( ආචාර්ය කේ. පී. එස්. සී. ජයරත්න); පශ්චාත් උපාධි සිසුන් සඳහා GRC වැඩමුළුව (මහාචාර්ය ටී. ආර්. ආරියරත්න. මහාචාර්ය ඩී. යූ. ජේ. සොන්නාදර. මහාචාර්ය එස්. ඩබ්. කොටගම, මහාචාර්ය ඩබ්. ඩී. රත්නසූරිය සහ ආචාර්ය පී. වී. රන්දෙනිය); දත්ත විශ්ලේෂනය සඳහා SPSS මෘදුකාංග භාවිතය (ආචාර්ය ඩී. ආටිගල, ඊ. ආර්. ඒ. ඩී. බණ්ඩාර මහතා, ජේ. එච්. ඩී. එස්. පී. තිසේරා මෙනෙවිය) SPSS භාවිතයෙන් දත්ත විශ්ලේෂණය (ආචාර්ය ඩී ආටිගල, ඊ ආර් ඒ ඩී බණ්ඩාර මහතා, එස්. ජී. ධර්මරත්න මයා); (අපොස) උසස් පෙළ ජීව විද්‍යා ගුරුවරු (මහාචාර්ය ඩබ්. ඩී. රත්නසූරිය. උසස් පෙළ ගුරුවරු සඳහා පාසල් පර්යේෂණ ව්‍යාපෘති පැවැත්වීම (ආචාර්ය එම්. ආර්. විජේසිංහ). ඊට අමතරව කාර්ය මණ්ඩල සාමාජිකයන් විසින් ද ක්ෂුද්‍ර පාලක වැඩසටහන්කරණය සහ එහි යෙදීම් (ආචාර්ය ආර්. ලේල්වල) ; ව්‍යවහාරික ඉලෙක්ට්‍රොනික විද්‍යාව හා ස්වයංක්‍රීයකරණ තාක්ෂණය (එච්. එච්. ඊ. ජයවීර); උසස් පෙළ භෞතික විද්‍යා ගුරුවරුන් සඳහා වැඩමුළුව (ආචාර්ය ඩී. ඩී. එන්. බී. දයා); පාරිසරිකයෝ මෙහෙයවූ ස්වභාව ධර්ම කඳවුර (ආචාර්ය ඩී. එන්. දයාවංස - කාර්ය මණ්ඩල උපදේශක) වැනි පුහුණු වැඩසටහන් සහ වැඩමුළු සම්බන්ධීකරණය කරන ලදී..

## කාර්ය මණ්ඩල සංවර්ධනය

අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් විසි දෙනෙක්ද (20) එක් අධ්‍යයන සහයක කාර්ය මණ්ඩල සේවකයෙක් ද (01) සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල යෙහි දෙදෙනෙක්ද (02) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව, ජාතික විද්‍යා හා

තාක්‍ෂණ කොමිසම (NSTEC), පාරිසරික අමාත්‍යාංශය, කාර්ය මණ්ඩල සංවර්ධන කේන්ද්‍රය., SLAAS සහ IRQUE ව්‍යාපෘති මගින් පවත්වන ලද ජාතික වැඩමුළු සහ පුහුණු වැඩසටහන් වල සහභාගී වූහ. ඒ අතර අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් හය (06) දෙනෙක්ද එක් පරිපාලන නිලධාරියෙක් ද (01) ජාත්‍යන්තර වැඩමුළු සහ පුහුණු වැඩසටහන් වලට සහභාගී වූහ (V-33 වගුව). කාර්ය මණ්ඩලය සහභාගී වූ ජාතික හා ජාත්‍යන්තර වැඩමුළු හා පුහුණු වැඩසටහන් වල මුළු ගණන වනුයේ **26**කි.

### V-32 වගුව : ජාතික හා ජාත්‍යන්තර වැඩමුළු හා පුහුණු වැඩසටහන් වල කාර්ය මණ්ඩල සහභාගීත්වය

| නම සහ අධ්‍යයනාංශය | පුහුනු වැඩසටහන/වැඩමුළු |
|---|---|
| භෞතික විද්‍යාව | |
| මහාචාර්ය ටී ආර් ආරියරත්න (භෞතික විද්‍යා) | SAARC – ජපන් සීමාවාසික වැඩසටහන, ජපානය |
| මහාචාර්ය ඩී යූ ජේ සොන්නාදර (භෞතික විද්‍යාව) | ගුණාත්මක අධ්‍යාපනය පිලිබඳ කලාපීය සම්මන්ත්‍රනය, නව දිල්ලිය. ඉන්දියාව |
| ආචාර්ය ඩී ඩී වික්‍රමසිංහ (ජීව විද්‍යාව) | පරිසර පද්ධති මාදිරි පිලිබඳ පුහුණුව - නොවැම්බර් 2007 සංවිධානය කලේ පරිසරාත්මක මාදිරිසැකසුම් පිලිබඳ යුරෝපීය සංගමය, තුන් වන ලෝකයේ විද්‍යා ඇකඩමිය, ට්‍රීස්ට්, ඉතාලිය |
| | ජලය හා ස්වස්ථතාව, ලිංගභේදය හා පවත්නා සංවර්ධනයක් පිලිබඳ කලාපීය ක්‍රියාකාරී සම්මන්ත්‍රණය - පෙබරවාරි 2008 දකුණු අප්‍රිකාවේ ස්ත්‍රියගේ භූමිය හා ජලය පිලිබඳ අයිතිය (WLWRSA) නම් වූ ජලය, ස්වස්ථතාව, ලිංග භේදය හා සංවර්ධනය පිලිබඳ කලාපීය ක්‍රියාකාරී සම්මන්ත්‍රණය 2008 පෙබරවාරි සංවිධානය කලේ ජලය සඳහා එකමුතුව සඳහා ස්ත්‍රිය (WfWfW), ගැබරෝන් බොට්ස්වානා |
| | උරගයින් පිලිබඳ විද්‍යාව සම්බන්ධ දෙවන පාසල - 2008 සැප්තැම්බර් ඉන්දිය රජයේ සහ ඉන්දිය වනජීවී ආයතනය, දෙහරාදූන්. ඉන්දියා |
| ආචාර්ය ආර් පී පෙරේරා (රසායන විද්‍යාව) | රසායන අවි වලට එරෙහි ආරක්‍ෂණය පිලිබඳ පුහණු වැඩසටහන සඳහා සහභාගිත්වය (2008), චීනය |
| ආර් එම් ගුණරත්න මිය (විද්‍යා) | මානව සම්පත් සංවර්ධනය පිලිබඳ උසස් ඩිප්ලෝමා වැඩසටහන, කළමනාකරණ හා තාක්‍ෂණය පිලිබඳ ඉන්දිය අධ්‍යයනායතනය |

## ජාතික සංවර්ධනය ජාලය වෙත පුද්ගලික අංශ ඔස්සේ දායකත්වය

මහාචාර්ය එච්. ඩී. ගුණවර්ධන
මහාචාර්ය කේ. එම්. එන්. ද සිල්වා
මහාචාර්ය කේ. ආර්. ආර්. මහානාම
ආචාර්ය ආර්. ඩී. විජේසේකර
ආචාර්ය ඩී. ආර්. ජයවර්ධන
සී. ජේ. විජේරත්න මයා
ආචාර්ය ජේ. කේ. විජේරත්න
මහාචාර්ය ආර්. හේවාමාන්න
ආචාර්ය ටී. ඩී. සිල්වා
ආචාර්ය ජී. ඒ. යූ. ජයසේකර

ආචාර්ය එස්. රංවල
ආචාර්ය එච්. එස්. කත්‍රිආරච්චි
ආචාර්ය සී. එම්. නානායක්කාර
මහාචාර්ය ටී. ආර්. ආරියරත්න
මහාචාර්ය ඩී. යූ. ජේ. සොන්නාදර
මහාචාර්ය ජේ. කේ. ඩී. එස් ජයනෙත්ති
ආචාර්ය එස්. ආර්. ඩී. රෝසා
ආචාර්ය කේ. පී. එස්. සී. ජයරත්න
ආචාර්ය ආර්. වී. කුරේ

ආචාර්ය ඩබ්. එන්. වික්‍රමසිංහ
මහාචාර්ය එම්. ආර්. සූරියාරච්චි
ඊ. ආර්. ඒ. ඩී. බණ්ඩාර මයා
මහාචාර්ය ඩබ්. ඩී. රත්නසූරිය
මහාචාර්ය වයි. එන්. ඒ. ජයතුංග
මහාචාර්ය ඩබ්. එස්. ප්‍රේමවන්ස
ආචාර්ය ඩබ්. ඩී. යාපා
ආචාර්ය එම්. ආර්. විජේසිංහ
ආචාර්ය ඩී. ඩී. වික්‍රමසිංහ

### V-33 වගුව : ප්‍රකාශන හා ඉදිරිපත් කිරීම්

| අධ්‍යයනාංශය / පර්යේෂණ | ශාක විද්‍යා | රසායන විද්‍යා | ගණිතය | ජීව විද්‍යා | සංඛ්‍යානය | භෞතික විද්‍යා | න්‍යෂ්ටික විද්‍යා |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රකාශන | 03 | 14 | 02 | 20 | 05 | 09 | - |
| ප්‍රකාශයට පිලිගත් | - | 01 | - | 05 | 02 | - | - |
| සන්නිවේදන | 13 | 20 | - | 27 | 09 | 18 | - |
| ඉදිරිපත් කිරීම් | - | 03 | | - | - | - | - |
| ඉදිරිපත් කිරීමට පිලිගත් | - | - | - | - | - | - | 02 |
| ග්‍රන්ථ/ විපය කේන්ද්‍රිය ලිපි | - | 02 | - | - | - | - | - |
| දේශන/ ප්‍රධාන දේශන | - | 02 | - | - | - | - | - |
| **එකතුව** | **16** | **42** | **02** | **52** | **16** | **27** | **02** |

## යටිතල පහසුකම්, සම්පත් හා ආධාර

රසායන විද්‍යා ආයතනය යටතේ ඖෂධීය ද්‍රව්‍ය විශ්ලේෂණය කිරීම සඳහා ස්වාධීන ඖෂධ විශ්ලේෂණ විද්‍යාගාරයක් ස්ථාපනය කිරීම සඳහා අවබෝධාත්මක ගිවිසුමක් (MOU) කොළඹ විශ්වවිද්‍යාලය හා කාර්මික සංවර්ධන අමාත්‍යාංශය අතර හා ශ්‍රී ලංකා ඖෂධ නිෂ්පාදකයන්ගේ සංගමය අතර අත්සන් තැබිණ. ව්‍යාපෘතියෙහි ඇස්තමේන්තුගත පිරිවැය **5** වසරක් සඳහා රුපියල් මිලියන **71**කි.

තොරතුරු තාක්ෂණ ආයතනය (IFS) මගින් පීඨයෙහි පවත්වනු ලබන තොරතුරු තාක්ෂණ පාඨමාලා හදාරන ශිෂ්‍යයන් සඳහා එම ආයතනය විසින් රුපියල් 426,760.00 ක් වටිනා පරිගනක විද්‍යාගාරයක් පරිත්‍යාග කරන ලදී.

වායුගෝලීය හා අකුණු පිළිබඳ භෞතික විද්‍යාව සහ මාස් ස්පෙක්ට්‍රොමෙට්‍රි (Mass Spectrometry) යන ක්ෂේත්‍රයන්හි පර්යේෂන සංවර්ධනය සඳහා භෞතික විද්‍යා අධ්‍යයනාංශය ස්විඩනයේ උප්සලා විශ්වවිද්‍යාලයෙහි ජාත්‍යන්තර විද්‍යා වැඩසටහන් (ISP) වෙතින් ආධාර නව දුරටත් ලැබීය. ISP විසින් උපකරණ සංවර්ධන කේන්ද්‍රය (CID) ශක්තිමත් කිරීම සඳහා ද ආධාර සපයන ලදී.

කාර්මික සංඛ්‍යානය හා මූල්‍ය ගණිතය සඳහා සෘජු ප්‍රවේශ කණ්ඩායම් දෙකක් සඳහා **2008** මැයි මස තෙමහල් ගොඩනැගිල්ලක් සෑදීම අරඹන ලද අතර **2009** වසර මුල වන විට සමාප්ත වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

විද්‍යා ශිෂ්‍යයන් සඳහා නව භෝජනාගාර සංකීර්ණයක් සෑදීම ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති අතර අමාත්‍ය මණ්ඩල අනුමැතිය අපේක්ෂා කරමින් සිටී. විද්‍යා පීඨ පුස්තකාලය සඳහා නව පුස්තකාල ගොඩනැගිල්ල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව විසින් අනුමත කර ඇති අතර ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය අපේක්ෂාවෙන් සිටී. ජීව විද්‍යා අධ්‍යයනාංශය සඳහා ජීව විද්‍යා සංකීර්ණය II සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අවධියෙහි වේ.

### බාධක

නිසියාකාර දේශන හා නිබන්ධන කුටි මද කම සහ නිසි පරිගණක කේන්ද්‍රයක අඩුව පීඨයෙහි අධ්‍යයන කටයුතු වැඩි දියුණු කිරීම කෙරෙහි බලපෑමට පටන් ගෙන ඇත. නව උපාධි වැඩසටහන් වලට සම්බන්ධ ක්‍රියාකාරකම් කෙරෙහි අරමුදල් හිගකම තදින් බලපා ඇත. ගණිත හා රසායන විද්‍යා අධ්‍යයනාංශයන්හි නව ඒකක තැනීමේ කටයුතු කරගැනීමට නොහැකි විය.

ශිෂ්‍යයන්ගේ පරිගණක පහසුකම් වැඩිදියුණු කිරීම පීඨයෙහි අත්‍යවශ්‍යතාවකි. කියවීමේ ඉඩකඩ. විභාග ශාලා. ආදි පොදු පහසුකම්, වැඩිවන ඇතුළත්වීම් සමග දරා ගැනීමට ප්‍රමාණවත් නොවේ.

## 07. උපාධි අධ්‍යයන පීඨය

### හැඳින්වීම

උපාධි අධ්‍යයන පීඨය (FGS) 1987 හිදි ස්ථාපනය කරන ලද්දේ කොළඹ විශ්වවිද්‍යාලය තුල සිදුකෙරෙන පශ්චාත් උපාධි අධ්‍යාපන කටයුතු සහ විශේෂ හෝ බහුවිධ පර්යේෂණ කටයුතු සඳහා අනුග්‍රහය දැක්වීම, සම්බන්ධීකරණය සහ විධිමත් කිරීම සඳහා වගවීමක් සහිතවයි. එහි මෙහෙවර සිත්හි දරාගෙන තම බරදරන්නන්ගේ අපේක්ෂාවනට අනුකූලව තම ක්‍රියාකාරකම් සිදුකළ අතර වසර තුල ඉලක්ක කිහිපයක් ලගා කර ගන්නා ලදි.

### කාර්ය මණ්ඩල සැකසුම

මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක 2008.08.24 දක්වා පීඨයෙහි පීඨාධිපති ලෙස කටයුතු කළ අතර 2008.08.25 දින සිට මහාචාර්ය කේ. සුනිල් චන්ද්‍රසිරි වැඩබලන පීඨාධිපති ලෙස කටයුතු කලේය. සමන් උයන්ගොඩ මහතා වසර පුරා ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි ලෙස කටයුතු කළ අතර 2008.08.10 දක්වා එස් එම් එස් එස් නාගහපිටිය මහතා ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරි ලෙස කටයුතු කලේය. එස් පී පී එන් සිල්වා මිය 2008.08.11 දින සිට පීඨයෙහි සහකාර මූල්‍යාධිකාරි ලෙස පත් කරන ලදි. සරත් එස් විදානගම මහතා වසර පුරාම අධ්‍යයන අධ්‍යක්ෂ ලෙස කටයුතු කලේය.

පීඨාධිපතිට අමතරව, කොන්ත්‍රාත් පදනම මත ජ්‍යෙෂ්ඨ අධ්‍යයන සාමාජිකයන් දෙදෙනෙක් නිත්‍ය අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් මෙන් දේශන පැවැත්වූ අතර වසර තුළ අධ්‍යයන වැඩසටහන් කිහිපයක් සම්බන්ධීකරණය කළහ. වැඩසටහන් අධීක්ෂණය අධ්‍යයන අධ්‍යක්ෂ යටතේ සිදුවූ අතර එය පසුගිය වසරේ ඇතිකරගත් සම්බන්ධීකාරකවරුන්ගේ කමිටුව මගින් මෙම අධීක්ෂණය සිදුවිය.

උපාධි අධ්‍යයන පීඨය ස්ථිර සේවකයින් අටදෙනෙකුගෙන්ද කොන්ත්‍රාත් පදනමින් සේවය කරන්නන් දහතුන් දෙනෙකුගෙන් ද යුතුවේ.

වසර තුල පීඨ සභාවෙහි සංයුතිය මෙසේ විය.

| | |
|---|---|
| පීඨාධිපති/FGS (සභාපති) | - මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක - 2008 අගෝස්තු දක්වා<br>- මහාචාර්ය කේ. සුනිල් චන්ද්‍රසිරි - 2008 සැප්තැම්බර් සිට |
| අනෙක් පීඨවල පීඨාධිපතිවරුන් | |
| පීඨාධිපති/ ශාස්ත්‍ර | - මහාචාර්ය අමල් ජයවර්ධන |
| පීඨාධිපති/ අධ්‍යාපන | - මහාචාර්ය එස්. සන්ද්‍රසේගරම් |
| පීඨාධිපති/ නීති | - එන්. සෙල්වක්කුමාරන් මහතා |
| පීඨාධිපති/ කළමනාකරණ හා මූල්‍ය | - ආචාර්ය පී. එස්. එම්. ගුණරත්න |
| පීඨාධිපති/ වෛද්‍ය | - මහාචාර්ය දූලිතා ප්‍රනාන්දු - 2008 ජූලි දක්වා<br>- මහාචාර්ය එච්. ආර්. සෙනෙවිරත්න - 2008 අගෝස්තු සිට |
| පීඨාධිපති/ විද්‍යා | - මහාචාර්ය ටී. ආර්. ආරියරත්න |
| අධ්‍යක්ෂ/ වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය | - මහාචාර්ය එම්. එච්. ආර්. ෂෙරිෆ් |

| | |
|---|---|
| පාලක සභාවෙන් | - මහාචාර්ය ඒ. එච්. එම්. හුසේන් – 2008.06.30 දක්වා |
| | - නලින් ආටිගල මහතා-2008.06.30 දක්වා |
| | - ආචාර්ය කිංස්ලි වික්‍රමසූරිය } |
| | - විද්‍යානිධි ආචාර්ය එන්. ආර්. ද සිල්වා } 2008 ජූලි මස සිට |
| | - තිලක් කරුණාරත්න මහතා } |
| සනාතන සභාවෙන් | - මහාචාර්ය බී. එල්. පන්ඩිතරත්න |
| | - මහාචාර්ය සිසිර පින්නවෙල |
| | - මහාචාර්ය නිමල් කේ. දංගල්ල - 2008 අගෝස්තු සිට |
| අධ්‍යයන මණ්ඩල වලින් | - මහාචාර්ය ජයන්ති ද සිල්වා |

පීඨ සභා වලට පහත අයද ආරාධනා මත සහභාගී වූහ.

| | |
|---|---|
| සභාපතිනි/ BSDS | - මහාචාර්ය ජී. අයි. සී. ගුණවර්ධන |
| අධ්‍යයන අධ්‍යක්ෂකවරු | - සරත් එස්. විදානගම මහතා |
| ජ්‍යෙෂ්ඨ අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයින් FGS | |
| | - ආචාර්ය කේ. සර්වේස්වරන් |
| | - අනුරුද්ධිකා සෙනෙවිරත්න මිය |

පීඨය පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා දහහතරක් (14) පවත්වන අතර ශාස්ත්‍රපති පාඨමාලා එකොළහක් (11) සමාලෝචිත වසර තුල පැවැත්විය. පීඨය තව දුරටත් බහුවිධ පර්යේෂණ මත තම දර්ශනපති හා දර්ශන ශූරි උපාධි වැඩසටහන් පැවැත්විය.

අනාගතයේදී වැඩසටහන් කිහිපයක් ඇරඹීමට පීඨය සැලසුම් කොට තිබේ.

ව්‍යාපාර ක්ෂේත්‍රයෙන් මෙන්ම විශ්වවිද්‍යාලයෙන්ද ඉගැන්වීමේ කාර්යමණ්ඩලය උපාධි අධ්‍යයන පීඨය ලබා ගති. මෙයින් ඉගැන්වීමෙහි දී මෙන්ම පර්යේෂණයෙහිදී ද විශ්වවිද්‍යාල-පෞද්ගලික ක්ෂේත්‍රය අතර සම්බන්ධතාව වැඩි දියුණු විය. විවිධ වැඩසටහන් වල සම්බන්ධීකාරකවරුන් ලෙස අනෙකුත් පීඨ වලින් හා කර්මාන්ත ක්ෂේත්‍රයෙන් ලබා ගත් පහත කාර්ය මණ්ඩලය කටයුතු කළහ.

**V-34 වගුව : පශ්චාත් උපාධි වැඩසටහන් වල සම්බන්ධීකාරකවරු**

| වැඩසටහන | සම්බන්ධීකාරක |
|---|---|
| දර්ශනපති/දර්ශනශූරි | ආචාර්ය කේ සර්වේස්වරන් |
| සායනික මනෝවිද්‍යාව සඳහා දර්ශනපති උපාධිය | ආචාර්ය පියංජලී ද සොයිසා |
| පුස්තකාල හා තොරතුරු විද්‍යා ශාස්ත්‍රපති උපාධිය | සී සී ජයසුන්දර (2008.11.09 දක්වා) සුමනා ජයසූරිය මිය |
| ව්‍යාපාර අධ්‍යයනය සඳහා ශාස්ත්‍රපති උපාධිය | ආචාර්ය රන්ජිත් බණ්ඩාර මහාචාර්ය එච් ඩී කරුණාරත්න (2008.11.01) |
| කාන්තා අධ්‍යාපනය පිලිබඳ පශ්චාත් උපාධිය/ ඩිප්ලෝමාව | ආචාර්ය චාන්දනී ලියනගේ |
| මානව හිමිකම් පිලිබඳ පශ්චාත් උපාධිය/ඩිප්ලෝමාව | ආචාර්ය කේ සර්වේස්වරන් අනුරුද්ධිකා සෙනෙවිරත්න මිය (2008.10.20 සිට) |

| | |
|---|---|
| ගැටුම් නිරාකරණය පිලිබඳ පශ්චාත් උපාධිය/ඩිප්ලෝමාව | ආචාර්ය කේ සර්වේස්වරන් |
| ශ්‍රම අධ්‍යාපනය පිලිබඳ පශ්චාත් උපාධිය/ඩිප්ලෝමාව | ආචාර්ය සී ජේ සී සිල්වා |
| ජපන් අධ්‍යයන පිලිබඳ පශ්චාත් උපාධිය/ඩිප්ලෝමාව | මහාචාර්ය ජයන්ති ද සිල්වා |
| තොරතුරු පද්ධති කලමනාකරණය පිලිබඳ පශ්චාත් උපාධිය/ඩිප්ලෝමාව | සී සී ජයසුන්දර මහතා |
| සංවර්ධන අධ්‍යයනය පිලිබඳ පශ්චාත් උපාධිය/ඩිප්ලෝමාව | ආචාර්ය පූජ්‍ය ඩබ් විමලරතන |
| ඇමරිකානු අධ්‍යයන පිලිබඳ පශ්චාත් උපාධිය/ඩිප්ලෝමාව | මහාචාර්ය නෙලුකා සිල්වා |
| උපදේශනය හා මනෝ සමාජයීය කාර්ය පිලිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | ආචාර්ය වරුනි ගනේපොල |
| ව්‍යාපාර කලමනාකරණය පිලිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | ආචාර්ය රංජිත් බණ්ඩාර |
| අලෙවිකරණය පිලිබඳ විධායක ඩිප්ලෝමාව [1] | ආචාර්ය රංජිත් බණ්ඩාර |
| අලෙවිකරණය පිලිබඳ විධායක ඩිප්ලෝමාව - m-ඉගෙනුම් ක්‍රමය | සරත් විදානගම මහතා |

1. ඇතුළු වීමේ සුදුසුකම වනුයේ උසස් පෙළ විභාගයයි

### V-35 වගුව : පශ්චාත් උපාධි ශිෂ්‍ය ඇතුලත්වීම් හා උපාධි ලැබීම්

*(උපාධිය, ඇතුලත් වීම් හා උපාධිලාභීත්වය මත වර්ගීකරණය කර ඇත)*

| වැඩසටහන | ඇතුලත් වීම් | උපාධිය ලැබීය/ තත්ත්වය |
|---|---|---|
| සායනික මනෝ විද්‍යාව පිලිබඳ දර්ශනපති | 06 | * |
| බහු ක්ෂේත්‍ර අධ්‍යයන සඳහා දර්ශනපති | 05 | 01 |
| මානව හිමිකම් පිලිබඳ පශ්චාත් උපාධිය | 11 | * |
| ගැටුම් නිරාකරණය පිලිබඳ පශ්චාත් උපාධිය | 13 | 01 |
| නිෂ්පාදන කලමනාකරණය පිලිබඳ පශ්චාත් උපාධිය | 16 | 03 |
| ජපාන අධ්‍යයන පිලිබඳ පශ්චාත් උපාධිය | 07 | 01 |
| ශ්‍රම අධ්‍යාපනය පිලිබඳ පශ්චාත් උපාධිය | 08 | 02 |
| කාන්තා අධ්‍යාපනය පිලිබඳ පශ්චාත් උපාධිය | 04 | 02 |
| සංවර්ධන අධ්‍යාපනය පිලිබඳ පශ්චාත් උපාධිය | 48 | * |
| ව්‍යාපාර අධ්‍යයනය පිලිබඳ පශ්චාත් උපාධිය | 203 | * |
| පුස්තකාල හා තොරතුරු විද්‍යාව පිලිබඳ පශ්චාත් උපාධිය | - | 01 |
| ව්‍යවහාරික මනෝවිද්‍යාව පිලිබඳ පශ්චාත් උපාධිය | - | 01 |
| මානව හිමිකම් පිලිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 30 | * |
| ගැටුම් නිරාකරණය පිලිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 22 | * |
| නිශ්පාදන කලමනාකරණය පිලිබඳ පශ්චාත් උපාධිය ඩිප්ලෝමාව | 35 | 06 |
| උපදේශනය පිලිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 22 | 17 |
| ජපන් අධ්‍යයන පිලිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 13 | * |
| ශ්‍රම අධ්‍යාපනය පිලිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 25 | 02 |
| කාන්තා අධ්‍යයන පිලිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 05 | 03 |
| සංවර්ධන අධ්‍යාපනය පිලිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 125 | 12 |
| ව්‍යාපාර කලමනාකරණය පිලිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (PgD.BM) | 116 | 77 |
| ඇමරිකානු අධ්‍යාපනය පිලිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 13 | 05 (06*) |
| තොරතුරු පද්ධති කලමනාකරණය පිලිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 76 | * |
| ගැටුම් හා සාම අධ්‍යයනය පිලිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 32 | * |
| අලෙවිකරණය පිලිබඳ විධායක ඩිප්ලෝමාව | 42 | * |
| **එකතුව** | **877** | **129** |

* ශාස්ත්‍රපති උපාධි දක්වා ඉදිරියට යන

වසර පුරාම අදාල අධ්‍යයන මණ්ඩල රැස්වීම් නිතිපතා පැවැත්වුණ අතර පීඨය විසින් පවත්වනු ලබන අධ්‍යයන වැඩසටහන් ද යථා පරිදි සිදුවිය. ව්‍යාපාර අධ්‍යයනය පිලිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා ව (PgD.BM), ව්‍යාපාර අධ්‍යයනය

පිලිබඳ පශ්චාත් උපාධිය (MBS) සහ සංවර්ධන අධ්‍යයනය පිලිබඳ පශ්චාත් උපාධිය (PgD.DS) යන වැඩසටහන් වෙත ඇති වැඩි වන ඉල්ලුම අනුව මෙම වසර තුළදී කණ්ඩායම් දෙකක් (සතියේ දින හා සති අන්ත) බඳවා ගැනිමට පීඨය කටයුතු කලේය.

**නව අධ්‍යයන වැඩසටහන්**

ව්‍යාපාර කෙරෙහි නැඹුරු පාඨමාලා වෙත ඇති ඉල්ලුම නිසා නව අවස්ථා සඳහා සොයා බැලීමට පීඨයට සිදු විය. එහි ප්‍රතිඵලයක් ලෙස m ඉගෙනුම් ක්‍රමය (m-learning) මගින් ශ්‍රී ලංකා ටෙලිකොම්-මොබිටෙල් ආධාර ද ඇතිව දුරස්ථ ඉගෙනීම් අධ්‍යාපනය වෙත ලගාවීමට කටයුතු කිරීමෙන් 2007 ජූලි මස හඳුන්වා දුන් අලෙවිකරණය පිලිබඳ විධායක ඩිප්ලෝමාව තවත් ශක්තිමත් විය. 2008.09.10 දින එම් ඉගෙනුම් වැඩසටහන ආරම්භ කරන ලදී. උපාධි අධ්‍යයන පීඨයෙහි විද්‍යුත් ඉගෙනුම් (e-learning) හා m ඉගෙනුම් (m-learning) පහසුකම් ලබාදීමට කොළඹ විශ්වවිද්‍යාල හා ශ්‍රී ලංකා ටෙලිකොම් - මොබිටෙල් අතර අවබෝධාත්මක ගිවිසුමක් අත්සන් කරන ලදී. මයික්‍රොසොෆ්ට් විසින් මෘදුකාංග පසුබිම සපයන අතර වැඩසටහන සඳහා කාර්මික සහාය මොබිටෙල් විසින් ලබා දේ. වැඩසටහනෙහි ආරම්භක කටයුතු සංවිධානය කිරීම සඳහා කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක පාසල විසින් ද වටිනා සහායක් ලබා දෙන ලදී. අධ්‍යයන දායකවීම් ලබාදීමට ද වැඩසටහනෙහි පූර්ණ කළමනාකරණය ද උපාධි අධ්‍යයන පීඨය විසින් සිදු කරනු ලබයි. m අධ්‍යාපනය (m-learning) හා ඉලෙක්ට්‍රොනික ඉගෙනුම් පහසුකම් දියුණු කිරීම භාරව ශ්‍රී ලංකා ටෙලිකොම් - මොබිටෙල් විසින් ලබා දී ඇති පූර්ණ කාලීන සේවකයෙකු පීඨයෙහි එම්. අධ්‍යාපනාගාරයෙහි (m-learning studio) සිටී.

2008 පෙබරවාරි මසදී සෞඛ්‍ය අමාත්‍ය ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සායනික මනෝවිද්‍යාව පිලිබඳ ප්‍රථම ශාස්ත්‍රපති උපාධිය ආරම්භ විය. ලන්ඩන් විශ්වවිද්‍යාලයේ කිංස් කොලීජියෙහි ක්ෂතිය පිලිබඳ කටයුතු කරන ශ්‍රී ලංකා කණ්ඩායමෙහි සහය ඇතිව දෙවසරක වැඩසටහනට ඉගෙනුම්, සායනික කටයුතු, පර්යේෂණ අයත් විය.

FGS විසින් අරඹන ලද තවත් නව වැඩසටහනක් වනුයේ 2008 ජූලි මස ආරම්භ කල තොරතුරු පද්ධති කලමනාකරණය පිලිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවයි.

ගැටුම් නිරාකරණය පිලිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව කොස්ටරිකාවේ එක්සත් ජාතීන්ගේ සාම විශ්වවිද්‍යාලයේ සහයෝගය ඇතිව යලි සකස්කරන ලද අතර ගැටුම් හා සාම අධ්‍යයන පිලිබඳ පශ්චාත් උපාධිය හා ඩිප්ලෝමාව ලෙස වෙනස් කර නම් කරන ලද අතර අධ්‍යයන වැඩසටහන ආරම්භ වූයේ 2008.10.15 දිනදීය. කොස්ටරිකා හි එක්සත් ජාතීන්ගේ සාම විශ්වවිද්‍යාලයේ මහාචාර්ය බාබරා ටින්ට් වැඩසටහන් ආරම්භක උත්සවයේදී ගෞරවනීය ආරාධිත අමුත්තා ලෙස සපැමිණියාය. එසේම ප්‍රථම පාඨමාලාවෙහි බහු සංස්කෘතියත්වය හා සාමය යන සංරචකය සඳහා දේශකයකු ලෙස ද ඇය කටයුතු කලාය.

**2009 හිදී පැවැත්වීමට නියමිත අධ්‍යයන වැඩසටහන්**

FGS විසින් මතු දැක්වෙන නව වැඩසටහන් දෙක ඉදිරිපත් කිරීමට සැලසුම් කර ඇත.

අ) කලාපීය සංවර්ධන සැලසුම්කරණය පිලිබඳ ශාස්ත්‍රපති උපාධිය

ආ) දකුණු ආසියානු අධ්‍යයන පිලිබඳ පශ්චාත් උපාධිය හා ඩිප්ලෝමාව

ප්‍රථම වැඩසටහන දැනටමත් තීරණය කර ඇති අතර නුදුරු අනාගතයේදී ම ආරම්භ කිරීමට අපේක්ෂිතයි.

දකුණු ආසියානු අධ්‍යයන වල ශාස්ත්‍රපති උපාධිය දක්වා යොමු වන පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ඇති කිරීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙහි අනුමැතිය සඳහා සනාතන සභාව විසින් නිර්දේශ කරන ලදී.

### ශිෂ්‍යත්ව

කොස්ටරිකාවේ එක්සත් ජාතීන්ගේ සාම විශ්වවිද්‍යාලය විසින් එක් අවුරුදු ජාත්‍යන්තර සාම අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් සඳහා ශිෂ්‍යත්වයක් ප්‍රදානය කරන ලදී. එය කොස්ටරිකාවෙහි සාම විශ්වවිද්‍යාලයෙහි ඉගෙනීමට වලංගුතාවය ලබා දේ. මෙයට නීති පීඨයෙහි ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ඒ. සර්වේස්වරන් මහතා තේරුණු අතර ඒ සඳහා ඔහු කොස්ටරිකාව වෙත පිටත් විය.

ජපාන රජයෙන් 2008 සාර්ක් ජපන් නායකත්ව සංවර්ධන සංචාරය යටතේ උපාධි අධ්‍යයන පීඨය වෙත තවත් 12 දින අධ්‍යයන චාරිකාවකට ආරාධනා ලැබිණ. ජපන් අධ්‍යයන පිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සිසුවියක වන සුචේන්ද්‍රනී මැණික් ජයරත්න මිය මෙම සංචාරයෙහිදී ශ්‍රී ලංකාව නියෝජනය කිරීම සඳහා තේරිණ. වාර්ෂිකව පැවැත්වෙන නාසායි විශ්වවිද්‍යාලයීය භාෂා වැඩසටහන සඳහා පීඨය විසින් තවත් ශිෂ්‍යයන් දෙදෙනෙකු නිර්දේශ කර තිබුණි.

### පීඨ අධ්‍යයන සැසි

පීඨයෙහි වාර්ෂික අධ්‍යයන සැසිය දේශනාගාරයෙහිදී 2008.10.24 දින පැවැත්විණ. වැඩබලන පීඨාධිපති මහාචාර්ය සුනිල් චන්ද්‍රසිරි විසින් පිළිගැනීමේ කතාව පවත්වන ලදී. ගෞරව ප්‍රධාන අමුත්තා ලෙස උප කුලපතිනි මහාචාර්ය ක්ෂනිකා හිරිඹුරේගම මහත්මිය විසින් මෙම අවස්ථාවට සහභාගී විය. ප්‍රධාන දේශක මහාචාර්ය ජේ ඩී වී ද එස් ඉන්ද්‍රරත්න විසින් නව දැනුම් ආර්ථිකය තුල පශ්චාත් උපාධි අධ්‍යයනයෙහි භූමිකාව යන මැයෙන් දේශනයක් පවත්වන ලදී.

ලද සාරාංශ වලින් 12ක් ප්‍රකාශනය සඳහා තෝරා ගන්නා ලදී.

### අනාගත ප්‍රවණතා

දර්ශනපති හා දර්ශන ශූරි වැඩසටහන් නැවත සැකසීමට පීඨය අදහස් කර සිටින අතර ලකුණු පදනම් වූ ඇගයීම් ක්‍රමයක් හඳුන්වා දීමටද පාඨමාලා හා විෂය මාලා ශිෂ්‍ය ඇගයීම් ද නව නිලධාරී තනතුරු අවස්ථා සොයා බැලීමද අදහස් කරයි.

### වැඩසටහන් සම්බන්ධීකරණය

පීඨය විසින් දෛනික ප්‍රශ්න FGS විසින් පවත්වාගෙන යන වැඩසටහන් වලට අදාල දෑ විසඳීම සඳහා සම්බන්ධීකාරක රුස්වීම් පවත්වන ලදී. මෙම රුස්වීම් ප්‍රධාන ප්‍රශ්න හඳුනාගැනීම සඳහා උපකාරී විය. එමගින් පාඨමාලාවල තත්ත්වය උසස් කිරීමට ද අධ්‍යයන සම්බන්ධීකරණය සහ පරිපාලනයට ද පහසු විය.

### සාරධර්ම කමිටුව

පීඨය විසින් සියළු පර්යේෂණ යෝජනාවන්හි සාරධර්ම සම්බන්ධ කරුණු පිළිබඳ සොයාබැලීමට මෙම සාරධර්ම කමිටුව නැවත පණගැන්වීමට කටයුතු කරන ලදී. නව සාමාජිකයන් ලෙස ස්ටීපන් කොපිල්, මහාචාර්ය අමල් ජයවර්ධන, සරත් විදානගම, හා ආචාර්ය කුමුදු දිසානායක යන අය පත් කරන ලදී.

### කාරක පත්‍රිකා හා පීඨ වාර සඟරාව

අධ්‍යයන අධ්‍යක්‍ෂ විසින් කරන ලද යෝජනාවක් මත පීඨය විසින් කාරක පත්‍ර මාලාවක් ආරම්භ කිරීමට තීරණය කර ඇත. මෙම පත්‍රිකා යෝජිත වාරසගරාවේ පළ වනු ඇත.

# VI කොටස

# ශ්‍රී පාලි මණ්ඩපය

## හැඳින්වීම

1996 දී බටහිර මණ්ඩපය ලෙසින් ස්ථාපනය කරන ලද ශ්‍රී පාලි මණ්ඩපය පසුකාලීනව ශ්‍රී පාලි මණ්ඩපය ලෙස 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය ප්‍රකාර කොළඹ විශ්වවිද්‍යාලය සමග අනුබද්ධ කර නම් කරන ලදී.

මණ්ඩපය අධ්‍යයනාංශ දෙකක් සමග එනම් ජන සන්නිවේදන අධ්‍යයනාංශය හා ප්‍රසාංගික කලා අධ්‍යයනාංශය සමග තවදුරටත් ක්‍රියාත්මක විය. ජ්‍යෙෂ්ඨ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ මද කම හේතුවෙන් මෙම අධ්‍යයනාංශ දෙක පීඨ බවට පත් කිරීමට බාධාවක්ව පවතී. සමාලෝචිත වසර තුල භාෂා ඒකකයත් පරිගණක ඒකකයත් ඒකක දෙකක් ලෙස තවදුරටත් ක්‍රියාත්මක විය. අනාගතයේදී වෙන් වෙන් වූ අධ්‍යයනාංශ බවට මේ ඒකක ද පත් කිරීමට අපේක්ෂිතය.

සිව් අවුරුදු අධ්‍යයන වැඩසටහන තුළ පාඨමාලා ඒකක 43ක් සිසුන් විසින් සම්පූර්ණ කළයුතු වන අතර ජන සන්නිවේදන විශේෂ උපාධිය ජන සන්නිවේදන අධ්‍යයනාංශය විසින් පිරිනමනු ලැබේ. මෙයින් 26ක් ප්‍රධාන පාඨමාලා ඒකක වන අතර 11ක් වරණීය වේ. එසේම, 6ක් පදනම් පාඨමාලා ඒකකයි. සිසුන්ගේ ක්‍රියාකාරී දර්ශකය මැනීම සඳහා විෂය  වලට අදාල න්‍යායාත්මක මෙන්ම ප්‍රායෝගික කරුණු ද නිර්ණායක ලෙස භාවිතා කෙරේ. සාර්ථක ලෙස උපාධි පාඨමාලාව සම්පූර්ණ කිරීම සඳහා සතර වන වසරේදී නිබන්ධනයක් ඉදිරිපත් කිරිම අනිවාර්ය වේ.

ශ්‍රී ලංකාවේ ප්‍රසාංගික කලාව සඳහා පාඨමාලාවක් ඉදිරිපත් කරන එකම ප්‍රසාංගික කලා අධ්‍යයනාංශය වනුයේ මෙම ප්‍රසාංගික කලා අධ්‍යයනාංශයයි. වසර 2008 හිදී ප්‍රධාන වර්ගීකරණ තුනක් යටතේ සිසුන් 23 දෙනෙක් උපාධිලාභී වූ අතර, ඒවා නම් සංගීතය, නර්තනය හා නාට්‍ය හා රංගකලාව වේ.  කලාව හා මෝස්තර, සිනමාව, රූපවාහිනිය, ආදී වූ වෙනත් අංශ වලට මනා දැනුමක් ප්‍රසාංගික කලා සිසුන් විසින් ග්‍රහණය කර ගන්නා ලදී. වසර තුළ මෙම අධ්‍යයනාංශය යටතේ නව උපාධි අපේක්ෂකයන් 51 දෙනෙකු ලියාපදිංචිය ලැබූහ. අධ්‍යයනාංශය විසින් තම විෂය මාලා යථාවත් කරගන්නා ලද අතර දැනට පාඨමාලා ඒකක 43ක් ඉදිරිපත් කරයි (129 credit) පිළිගත් විශ්වවිද්‍යාල වල හා වෘත්තීය අධ්‍යයනායතන වල මනා පළපුරුද්දක් ඇති අධ්‍යයන කාර්ය මණ්ඩලය හා නිපුණ කලාකරුවන්ගේ සේවය අධ්‍යයනාංශය විසින් ලබා ගන්නා ලදී.

මණ්ඩපයෙහි මණ්ඩපාධිපති ලෙස ඩබ්. එන්. විල්සන් මහතා 2008.03.13 දක්වා කටයුතු කළ අතර 2008.03.14 දින සිට ආචාර්ය ටියුඩර් වීරසිංහ වැඩබලන මණ්ඩපාධිපති ලෙස වැඩ භාර ගත්තේය.

මණ්ඩප සභාව විමසා සියළු අධ්‍යයන හා පරිපාලන තීරණ ගන්නා ලද අතර, මෙම වසර සඳහා එහි සංයුතිය පහත පරිදි විය.

| | |
|---|---|
| **මණ්ඩපාධිපති** | - ඩබ් එන් විල්සන් මහතා – 2008.03.13 දක්වා |
| | - ආචාර්ය ටී වීරසිංහ (වැඩ බලන) - 2008.03.14 සිට |
| **පාලක සභාවෙන්** | - රමණී අමරසූරිය මිය – 2008 සැප්තැම්බර් දක්වා |
| | - ආචාර්ය පණ්ඩිත් ඩබ් ඩී අමරදේව - 2008 සැප්තැම්බර් දක්වා |
| | - රෝහණ වීරසිංහ මහතා – 2008 ඔක්තෝබර් සිට |
| | - ජනදාස පීරිස් මහතා - 2008 ඔක්තෝබර් සිට |
| **සනාතන සභාවෙන්** | - මහාචාර්ය අමල් ජයවර්ධන – 2008 සැප්තැම්බර් දක්වා |

- මහාචාර්ය එම් ඊ එස් පෙරේරා – **2008** ඔක්තෝබර් සිට

**අංශාධිපතීන්**

ජන සන්නිවේදනය - ආචාර්ය ආර් හෙට්ටිආරච්චි (වැඩබලන)
ප්‍රසාංගික කලාව - එම් ඩී කුමුදිනී මිය

## කාර්ය මණ්ඩල තොරතුරු

මණ්ඩපයෙහි වැඩබලන මණ්ඩපාධිපති ලෙස තව දුරටත් ආචාර්ය ටියුඩර් වීරසිංහ කටයුතු කළ අතර, ඒ. එච්. ලියනගේ මිය ජ්‍යෝෂ්ඨ සහකාර ලේඛකාධිකාරි ලෙස කටයුතු කළාය. සමාලෝචනයට ලක් කර ඇති වසර තුළ ආචාර්ය ආර් හෙට්ටිආරච්චි හා එම් ඩී කුමුදිනී (වැඩබලන) තව දුරටත් පිළිවෙලින් ජන සන්නිවේදන හා ප්‍රසාංගික කලා යන අධ්‍යයනාංශ ප්‍රධානීන් ලෙස කටයුතු කළහ.

මුළු සේවක සංඛ්‍යාව **2008** වසර තුළදී හැත්තෑ තුනක් **(73)** විය. මෙහි මණ්ඩපාධිපති ද, පරිපාලන සේවා සාමාජිකයින් තුන් දෙනෙක් ද **(03)** අධ්‍යයන සේවක මණ්ඩල සාමාජිකයන් දහ හතර **(14)** දෙනෙකුද අධ්‍යයන සහායක සාමාජිකයින් දෙදෙනෙකු **(02)** ද කාර්මික සේවකයින් දෙදෙනෙකුද **(02)** අනධ්‍යයන කාර්ය මණ්ඩල ශ්‍රේණි වලට අයත් වූ සේවකයින් පනස් දෙදෙනෙකු **(52)** ද සිටියහ.

පිළිවෙලින් **2006.08.02** සහ **2006.11.03** දින සිට ජයන්ත වන්නිසිංහ මහතා (ජන සන්නිවේදන) හා උපේක්ඛා ගංගොඩවිල මිය (ප්‍රසාංගික කලා) දෙවන ශ්‍රේණියේ ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය තනතුරට උසස් කරන ලදී.

ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලයට අමතරව කර්මාන්තයෙහි නිපුණයන් ද වෙනත් විශ්වවිද්‍යාලවල ගුරුවරුන්ද බාහිර කාර්ය මණ්ඩල ලෙස ලබා ගැනිණි.

**VI-01 වගුව : අධ්‍යයන කාර්ය මණ්ඩලය**

| අධ්‍යයන / අධ්‍යයනාංශය | එකතුව | ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය | කථිකාචාර්ය | පරිවාස කථිකාචාර්ය | උපදේශකවරු | සහකාර පුස්තකාලයාධිපති | අධ්‍යයන නිවාඩු ලද කථිකාචාර්යවරුන් | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | විදේශගත | රට තුළ |
| ජන සන්නිවේදන | **08** | 04 | - | 03 | 01 | - | 04 | - |
| ප්‍රසාංගික කලා | **05** | 02 | 01 | 02 | - | - | 01 | - |
| පුස්තකාල | **01** | - | - | - | - | 01 | - | - |
| **එකතුව** | **14** | **06** | **01** | **05** | **01** | **01** | **05** | - |

## කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන්

ජන සන්නිවේදන අංශයෙහි සාමාජිකයන් හතර දෙනෙක් තම දර්ශන ශූරි උපාධි හදාරති. එච් එම් එච් සිරිවර්ධන මිය (එක්සත් රාජධානිය), එස් එම් සෙනරත් මහතා (චීනය) ඩී ශ්‍රී රංජන් මහතා (චීනය) හා පී නිශාන්ත මහතා (චීනය)

## පශ්චාත් උපාධි වැඩසටහන්

එක් එක් උපාධි වැඩසටහන් සඳහා වාර්ෂික ව ඇතුළත් කර ගැනීම් (ජන සන්නිවේදනය සඳහා ශාස්ත්‍රවේදී උපාධිය හා ප්‍රසාංගික කලාව සඳහා ශාස්ත්‍රවේදී උපාධිය) දළ වශයෙන් **60**කි. ජන සන්නිවේදනයෙහි හා ප්‍රසාංගික කලාවෙහි උප විශේෂීකරණ කිහිපයකට අදාල විෂය ක්ෂේත්‍රයන් මෙම ප්‍රථම උපාධි පාඨමාලාවන්හි විෂයමාලාවන් විසින් ආවරණය කෙරේ. ඉගැන්වීමටත් විභාග කටයුතු වලටත් පීඨයෙහි සිටින කථිකාචාර්යවරුන් සංඛ්‍යාව ප්‍රමාණවත් නැත. මණ්ඩපය බාහිර කාර්ය මණ්ඩලයෙහි සේවා මත තදින් යැපේ. සාමාන්‍යයෙන්, වසරක් පාසා **75** දෙනෙකු පමණ බාහිර කාර්ය මණ්ඩලයක් මණ්ඩපයට සම්බන්ධ වෙති.

**VI-02 වගුව: ප්‍රථම උපාධි අපේක්ෂක ශිෂ්‍ය ප්‍රවේශ, මහපොළ හා ශිෂ්‍යාධාර**

| අධ්‍යයන වර්ෂය | ශිෂ්‍ය ප්‍රවේශ | | | ශිෂ්‍යාධාර ලබන්නන් | මහපොළ ශිෂ්‍යත්ව |
|---|---|---|---|---|---|
| | ජන සන්නිවේදන | ප්‍රසාංගික කලාව | එකතුව | | |
| 2002/2003(ඒ) | 27 | 27 | **54** | 31 | 09 |
| 2003/2004 | 26 | 24 | **50** | 03 | 38 |
| 2004/2005 | 32 | 27 | **59** | 21 | 32 |
| 2006/2007 | 11 | 97 | **108** | 66 | 13 |
| **එකතුව** | **102** | **174** | **276** | **120** | **97** |

**VI-03 වගුව: අවසන් විභාගයේදී උපාධි අපේක්ෂකයන්ගේ ක්‍රියාකාරකම් - 2008**

| ක්‍රියාකාරිත්වය උපාධිය | ප්‍රථම පන්ති | දෙවන පංතිය ඉහළ පෙළ | දෙවන පංතිය පහළ පෙළ | සාමාන්‍ය සාමාර්ථ | උපාධිලාභී මුළු ගණන |
|---|---|---|---|---|---|
| BA (ජන සන්නිවේදන) | - | 04 | 15 | 07 | **26** |
| BA (ප්‍රසාංගික කලා) | 01 | 12 | 07 | 03 | **23** |

2008 වසර තුළ මණ්ඩපයෙන් පස් වන උපාධිධාරින් කණ්ඩායම උපාධිලාභී වූහ.

### ව්‍යාප්ති වැඩසටහන්

**භාෂා ඒකකය** ජන සන්නිවේදන අධ්‍යයනාංශය යටතේ පවතින අතර ජන සන්නිවේදනය හා ප්‍රසාංගික කලාව සඳහා සිව් අවුරුදු විශේෂ උපාධිය හදාරන උපාධි අපේක්ෂකයන් හට සේවා සපයයි. මෙම සේවා පාඨමාලාවන්ට ඉංග්‍රීසි, දෙමළ හා හින්දි භාෂා අයත්වේ. සියළු පළමු හා දෙවන වසර වල උපාධි අපේක්ෂකයින්හට ඉංග්‍රීසි භාෂාව අනිවාර්ය වේ. ඔවුන්හට වරණීය ඉංග්‍රීසි පාඨමාලාවද හැදෑරීමේ අවස්ථාවක් ලබා දී ඇත. මෙම ඒකකය විසින් සති අන්තවලදී ව්‍යාප්ති පාඨමාලා දෙකක් ද දැනටමත් ඉදිරිපත් කර ඇත.

**පරිගණක අධ්‍යයන ඒකකය** – 1999 දී තොරතුරු තාක්ෂණ ඒකකය ආරම්භ කරන ලද අතර එය ජන සන්නිවේදන අධ්‍යයනාංශය යටතේ ක්‍රියාත්මක වේ. සියළු උපාධි අපේක්ෂකයන්හට පරිගණක පාඨමාලා ඒකකය සේවා පාඨමාලාවකි.

2008 වසරෙහිදී පහත දැක්වෙන ව්‍යාප්ති වැඩසටහන් මණ්ඩපය විසින් ආරම්භ කරන ලද්දේ මණ්ඩපයෙන් බාහිර ප්‍රජාව වෙත සේවය සැළසීමටයි.

**VI-04 වගුව : ව්‍යාප්ති පාඨමාලාවන්හි ශිෂ්‍ය ප්‍රවේශ - 2008**

| පාඨමාලාව | ශිෂ්‍යයන් |
|---|---|
| රැකියා සඳහා ඉංග්‍රීසි සහතික පත්‍රය (CEFE) | 44 |
| රැකියා සඳහා සහ උසස් අධ්‍යාපනය සඳහා ඉංග්‍රීසි සහතික පත්‍රය (CEHEE) | 136 |
| කාර්යාල යෙදවුම් සඳහා සහතික පත්‍රය – තොරතුරු තාක්ෂණය (COA – IT- 2008) (ප්‍රථම කණ්ඩායම) | 06 |
| (දෙවන කණ්ඩායම) | 29 |
| **එකතුව** | **215** |

**ජන සන්නිවේදනය**

ජන සන්නිවේදන උපාධිය හදාරන සිසුන් වාර්තා චිත්‍රපට, ජන සන්නිවේදනය හා කැමරා වැඩමුළු සහ සති පතා සාකච්ඡා වට වැනි කර්තව්‍යයන්හි නියැලුනහ.

**ප්‍රසාංගික කලා**
අධ්‍යයනාංශය විසින් පාඨමාලා ඒකක **43**ක් ඉදිරිපත් කෙරේ. එයට ප්‍රධාන අධ්‍යයන ක්ෂේත්‍ර **26**ක් ද (78 credit) වරණීය ක්ෂේත්‍ර 11ක් (**33** credit) සහ පදනම් පාඨමාලා **6**ක් අයත් වේ. සතර වන වසරේදී විශේෂීකරණය තුළ න්‍යාය හා ප්‍රායෝගික කරුණු වල නියැලීමට ඉඩ දී තිබේ.

ප්‍රසාංගික කලා උපාධිය හදාරන සිසුන්, නාට්‍ය හා චිත්‍රපටවල රගපෑම හා අධ්‍යක්ෂණය, ප්‍රසාංගික කලා නිෂ්පාදන, කෙටි චිත්‍රපට නිශ්පාදන සහ කෙටි චිත්‍රපට උළෙල හා නාට්‍ය දර්ශන වැනි කටයුතුවල නියැලුනහ.

**VI-05 වගුව : ජාතික වැඩසටහන් කෙරෙහි දායකත්වය**

| රාජ්‍ය අංශය | පුද්ගලික අංශය |
|---|---|
| ආචාර්ය එල් ටී වීරසිංහ | උපේක්ඛා ගංගොඩවිල මිය |
| ආචාර්ය රන්ජන් සි කේ හෙට්ටිආරච්චි | එම්. ඩී. කුමුදිනී මිය |
| ජේ එම් ආර් සී බණ්ඩාර මහතා | |
| එස් එල් පී ෆොන්සේකා මහතා | |
| උපේක්ඛා ගංගොඩවිල මිය | |
| එම් ඩී කුමුදිනී මිය | |

**VI-06 වගුව : ප්‍රකාශන හා ඉදිරිපත්කිරීම්**

| අධ්‍යයනාංශය | ලිපි | පර්යේෂණ |
|---|---|---|
| ජන සන්නිවේදනය | 09 | - |
| ප්‍රසාංගික කලා | - | 01 |

## යටිතල පහසුකම්, සම්පත් හා ප්‍රදාන

IRQUE ව්‍යාපෘතිය යටතේ මණ්ඩපය වෙත රුපියල් මිලියන **15**ක් ලැබී තිබේ. ඒ න්‍යාය ප්‍රායෝගික වැඩ හා එක්තැන් කරමින් ඉගෙනීම් ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහායි. වසර තුළ අමතරව, රුපියල් මිලියන **2**ක මුදලක් ජාලගත කිරීම් සවිකිරීම සඳහා මණ්ඩපය වෙත ලැබිණ.

## පුස්තකාලය

ශ්‍රී පාලි මණ්ඩපයෙහි පුස්තකාලය 16,000 කට අධික පොත් සංඛ්‍යාවක් ඇති අතර DVD සහ VHS කැසට් පට **387**ක් විය. සමාලෝචිත වසර තුළ රුපියල් 1,153,648.17 ක් වටිනා පොත් සහ වාර සගරා ලබා ගත් අතර පුස්තකාලය සතු කර ගෙන තිබේ. ඊට අමතරව, පොත් **16**ක් ආධාර ලෙස ලැබී තිබේ. 2008 වසර තුළ පුස්තකාලය දෛනික හා සති අග පුවත්පත් **15**කට ද වාර සගරා **2**කටද දායක ව ඇත. මුළුමනින්ම උපාධි අපේක්ෂකයන් **292**ක් අධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩලය **19** දෙනෙක් ඇතුළුව පාඨකයන් **363** දෙනෙකු ද මෙම පුස්තකාලයෙහි ලියාපදිංචිව සිටියහ.

# VII කොටස

# මධ්‍යස්ථාන

## 01. වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය (CGU)

වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය විසින් සේවානියුක්තිය කෙරෙහි විශ්වවිද්‍යාලයීය උපාධි අපේක්ෂකයන්ගේ දක්ෂතා වැඩිදියුණු කිරීම සඳහා වැඩමුළු සම්මන්ත්‍රණ හා කෙටි පාඨමාලා මාලාවක් පවත්වන ලදි.

## අලෙවිකරණය හා මානව සම්පත් කළමණාකරණය හා සංවර්ධනය පිළිබඳ සහතික පත් පාඨමාලාව

වඩාම ජනප්‍රිය වැඩසටහන් වූයේ මෙම වසර අග අවසන් වූ අලෙවිකරණය, මානව සම්පත් කළමනාකරණය හා සංවර්ධනය යන වැඩසටහන් දෙකය. **2007** දී ආරම්භක ව්‍යාපෘතියක් ලෙස කළමනාකරණ හා මූල්‍ය පීඨයේ සහභාගිත්වයෙන් යුතුව අරඹන ලදි. පාඨමාලා පවත්වනු ලැබුයේ සති අන්තයේ වන අතර පුද්ගලික ක්ෂේත්‍රයෙන් හා කළමනාකරණ හා මූල්‍ය පීඨයෙන් ලබා ගත් සම්පත් දායකයන් විසින් විෂයමාලා සැලසුම් කොට ලබා දෙන ලදී. පන්ති කාමර පාඩම් සති අගදී පවත්වන ලද අතර පාඨමාලාවේ කොටසක් ලෙස ශිෂ්‍යයන්හට මාස **3**ත් **6**ත් අතර පූර්ණ කාලීන සීමාවාසික පුහුණුවක් ලබා දෙන ලදී. ඒ අතර ශාස්ත්‍ර, විද්‍යා, අධ්‍යාපන හා නීති පීඨ වල සිසුන් වූ අතර වැඩි දෙනා ශාස්ත්‍ර පීඨ සිසුන් වූහ. නැවත සංශෝධිත විෂයමාලාවක් සමග දෙවන කණ්ඩායමකට ද මෙම පාඨමාලාව පැවැත්වීමට සැලසුම්කර තිබේ.

### විශේෂ සීමාවාසික වැඩසටහන

යුනිලිවර් පුද්ගලික සමාගම විසින් **2008** ජූනි මස **23** වන දින විශ්වවිද්‍යාලයෙහිදී වැඩමුළුවක් පවත්වන ලදි. වැඩසටහනෙහි අරමුණ වූයේ විශේෂ සීමාවාසිකයන් ලෙස කළමනාකරණ හා මූල්‍ය පීඨයේ සිසුන් ආකර්ශණය කර ගැනීමයි. වැඩමුළුවට සහභාගි වූ මුළු සිසුන් සංඛ්‍යාව **110**කි. දේශීය විශ්වවිද්‍යාල අතුරින් සිසුන් **5** දෙනෙකු සීමාවාසික සිසුන් ලෙස යුනිලිවර් සමාගම විසින් තෝරා ගන්නා ලදී. මෙම විශේෂ සීමාවාසික වැඩසටහන සඳහා කොළඹ විශ්වවිද්‍යාලයෙන් සිසුන් දෙදෙනෙකු තෝරා ගැනිණි.

### දක්ෂතා ඇතිකරගැනීමේ කඩිනම් ව්‍යාපෘතිය (ASAP)

Accelerated Skills Acquisition Project (ASAP) නමින් ව්‍යාපෘතියක් USAID සමග සම්බන්ධව පවත්වන ලදි. වැඩසටහන සඳහා ශාස්ත්‍ර පීඨයෙන් ශිෂ්‍යයන් **36** දෙනෙකු තෝරා ගත් අතර එය **2008** ජූලි **12** සිට **20** වන දා දක්වා පූර්ණ වශයෙන් දින **5**ක් මුළුල්ලේ පවත්වන ලදි. USAID විසින් මුද්‍රිත අත් පොත් හා අනෙකුත් සම්පත් සපයන ලදි. මෙම වැඩසටහනේදි ආවරණය කරන ලද දේ යටතට කණ්ඩායම් වැඩ, සම්මුඛ සාකච්ඡාවලට මුහුණ දීම සහ පුද්ගල සංවර්ධනය යන දෑ විය.

## "*Standing on Your Feet*" වැඩසටහන

"Standing on your Own Feet" යන මැයෙන් සිදු කළ වැඩසටහන **2008.07.12** දින සිට අරඹා සෙනසුරාදා සතරකදී පවත්වන ලදි. ශාස්ත්‍ර පීඨයෙහි සිසුන් **51** දෙනෙක් මෙම වැඩසටහනට සහභාගි වූහ. මෙම වැඩසටහනට අන්තර්ගත වූ කරුණු අතර ව්‍යවසායකත්ව දක්ෂතා සහ පුද්ගල සංවර්ධනය ඇතුළත් වේ. බී. ඩී. එස්. කන්සල්ටන්ට්ස් පුද්ගලික සමාගම විසින් පවත්වන ලද මෙම වැඩසටහනට එළිමහන් හා අන්තර් නේවාසික ක්‍රියාකාරකම් ඇතුළත් විය.

**ජාතික ප්‍රථම උපාධි අපේක්ෂක රැස්වීම**

උපාධි අපේක්ෂකයන් හැත්තෑ පස්දෙනෙක් කාසන්ස් පුද්ගලික සමාගම විසින් සංවිධානය කළ ජාතික ප්‍රථම උපාධි අපේක්ෂක රැස්වීමෙහිදී සහභාගි වූහ. දිනක් පුරා බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවෙහිදී 2008 සැප්තැම්බර් මස 5 වන දා මෙම වැඩසටහන පැවැත්විණි. මෙම අවස්ථාවට සියළු විශ්වවිද්‍යාල වල සිසුන් සහභාගී වූහ.

**'*Opening Doors - Path to Success*' ශාස්ත්‍ර පීඨයේ අවසන් වසර සිසුන් සඳහා පැවැත්වූ රැකියා මාර්ගෝපදේශක සම්මන්ත්‍රණය**

වෘත්තිය මාර්ගෝපදේශ සම්මන්ත්‍රණයක් ශාස්ත්‍ර පීඨ අවසන් වසර සිසුන් සඳහා පවැත්විණි. වෘත්තිය මාර්ගෝපදේශ ඒකකය හා ආදි විද්‍යාර්ථීන්ගේ සංගමය එක්ව මෙම වැඩසටහන සම්පාදනය කරන ලදි. සීමාසහිත ඩොයිෂ් බැන්ක් පුද්ගලික සමාගම අනුග්‍රහය හා සහාය ලබා දුනි. ඉංග්‍රීසි, රැකියා හැකියා වැනි දක්ෂතා ආවරණය වන ලෙස සැලසුම් කළ වසරක් පුරා දිවෙන වැඩසටහන් මාලාවක් කිරීමට වෘත්තිය මාර්ගෝපදේශක ඒකකය වෙත සහාය වීමට ආදි විද්‍යාර්ථීන්ගේ සංගමය තවදුරටත් සැලසුම් කර ඇත. කර්මාන්ත අංශයේ සම්පත් දායකයන් කිහිප දෙනෙක් විසින් තම හැකියාවන් කෙරෙහි ආකර්ශනීයත්වයක් ගොඩනැගීම තුලින් අලෙවිවීම, පුද්ගලික අංශය කෙරෙහි ආකල්ප, පුද්ගල සංවර්ධනය වැනි අංග ඇතුලත් දේශන සිදු කරන ලදි. අවසන් වසර සිසුන් 250කට අධික පිරිසක් මීට සහභාගී වූ අතර කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක පාසල් දේශන ශාලාවේදී මෙය පවත්වන ලදී..

**'ඔබ අසිරිමත්' වැඩසටහන**

නිපුණතා සංවර්ධනය පිළිබඳ රැකියා මාර්ගෝපදේශ වැඩමුළුවක් එම ඒකකයෙහිදී 2008 අගෝස්තු මස 25 සිට 27 දක්වා පවත්වන ලදී. කම්කරු අමාත්‍යංශයේ සම්පත් දායකයන් විසින් මෙම වැඩසටහන පවත්වන ලදී. සිසුන් හතලිස් දෙනෙකු සහභාගී වූහ.

**රැකියා උපදේශනය**

අවසන් වසර ශාස්ත්‍ර පීඨයේ සිසුන් සඳහා .උපදේශන වැඩසටහන් දෙකක් පවත්වන ලදී. 2008 සැප්තැම්බර් මස 13 වන දින පැවැත්වූ වැඩමුළුව ට සිසුන් 50 දෙනෙක්ද 2008 සැප්තැම්බර් මස 20 වන දින පැවැත්වූ වැඩමුළුවට සිසුන් 100 දෙනෙක්ද සහභාගි වූහ. ඩොයිෂ් බැංකුවේ සම්පත් දායකයන් ද වෙනත් ආයතන කිහිපයක සම්පත් දායකයින් ද මෙම වැඩසටහන සංවිධානය කළහ.

**ශාස්ත්‍ර පීඨයට ඇතුළු වන නවකයන් සඳහා වෘත්තිය මාර්ගෝපදේශන සම්මන්ත්‍රණය**

2008 සැප්තැම්බර් මස 23 වන දා මුළු දා සම්මන්ත්‍රණයක් පවත්වන ලද අතර ශාස්ත්‍ර පීඨයට ඇතුලත් වූ නවකයින් 600 කට අධික පිරිසක් ඊට සහභාගී වූහ. ශාස්ත්‍ර පීඨ සිසුන්ට පුද්ගලික අංශයෙහි ඇති අවස්ථා පිළිබඳ දැනුවත් කිරීම මෙහි අරමුණ විය. උපාධි අපේක්ෂක දිවිය තුළදීම සිසුන් පුද්ගලික අංශයෙහි අවස්ථා සඳහා සැරසිය යුතු ආකාරය, විශ්වවිද්‍යාල දිවිය තුළදී කිනම් රැකියා නිපුනතා සංවර්ධනය කර ගතයුතුද යනාදි අංග මෙම සම්මන්ත්‍රණයේදී ආවරණය විය. ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය විසින් මෙම සම්මන්ත්‍රණයට දායකත්වය සපයන ලද අතර සහ ඊගල් රක්ෂණ සමාගම විසින් මෙම ව්‍යාපෘතියට අනුග්‍රාහකත්වය දක්වන ලදී.

**ඉංග්‍රීසි බසෙහි වැදගත්කම යන මැයෙන් සම්මන්ත්‍රනය**

සන්නිවේදන හැකියා සංවර්ධනයෙහි වැදගත්කම හුවාදැක්වීම ඉලක්ක කර ගත් මෙම සම්මන්ත්‍රණයට එකසිය පනහකට අධික සිසු පිරිසක් සහභාගී වූහ.

## 02. මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය (CSHR)

### හැඳින්වීම

මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය වනාහි නීති පීඨ පරිශ්‍රයෙහි පවත්වාගෙන යනු ලබන විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කේන්ද්‍රයකි. එහි අරමුණ මානව හිමිකම් පිළිබඳ අධ්‍යාපනය හා පර්යේෂණයයි. එය විශ්වවිද්‍යාලයට අනුබද්ධ කේන්ද්‍රයක් වුවද විශ්වවිද්‍යාල රාමුව තුළ හෝ මනා ලෙස ක්‍රියාකාරී වීම සඳහා එයට අවශ්‍ය ස්වාධීනත්වයක් තුළ එය ක්‍රියා කරයි. කේන්ද්‍රයට මූල්‍ය දායකත්වය විදේශීය ආධාර මගින් ලැබේ. එය පාලනය වනුයේ කළමනාකරණ මණ්ඩලයක් විසිනි. එම මණ්ඩලයෙහි සභාපතිනිය උපකුලපතිතුමියයි.

**දැක්ම**
මානව හිමිකම් කේන්ද්‍රයෙහි දර්ශනය වනුයේ සියල්ලන්ගේ ආත්ම ගරුත්වය හා මානව අයිතිවාසිකම් කෙරෙහි ගෞරව දක්වන හිමිකම් පිළිබඳ හැඟීමක් සහිත ජාතියක් ගොඩනැගීමය.

**මෙහෙවර**
මානව හිමිකම් කේන්ද්‍රයෙහි මෙහෙවර වනුයේ බහු විධ ක්‍රමවේද භාවිතා කරමින් මානව හිමිකම් අධ්‍යයනය සඳහා උත්කෘෂ්ට කේන්ද්‍රයක් බවට පත්වීමය.

### කාර්ය මණ්ඩල තොරතුරු

කේන්ද්‍රයෙහි අධ්‍යක්ෂ ලෙස මහාචාර්ය රවීන්ද්‍ර ප්‍රනාන්දු, නියෝජ්‍ය අධ්‍යක්ෂ මහාචාර්ය ශාර්යා ස්කානිවෙල් ඇතුළු පසළොස් (15) දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයකින් යුක්තය.

### විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් සඳහා වැඩසටහන්

**මානව හිමිකම් සීමාවාසික වැඩසටහන**

**විශ්වවිද්‍යාල සිසුන් හට දෙදින සහතිකපත් පාඨමාලාව**
උපාධි අපේක්ෂකයින් තුළ මානව හිමිකම් කෙරෙහි දැනුවත් බව හා ගෞරවය වර්ධනය කිරීම මෙහි අරමුණයි. පළමු වැඩසටහන කොළඹ විශ්වවිද්‍යාලයෙහිදී 2008 මැයි මස සිංහල මාධ්‍යයෙන් පැවැත්විණ. දෙවන වැඩසටහන පැවැත්වුණේ දෙමළ මාධ්‍ය සිසුන් හටයි. ඒ 2008 නොවැම්බර් මස 22 හා 23 යන දෙදිනදීය.

**නීති පීඨ සිසුන් හට මානව හිමිකම් චිත්‍රපට කණ්ඩායමක්**
මානව හිමිකම් වල විවිධ පැතිකඩ පිළිබඳ විශ්වවිද්‍යාලයීය සිසුන් දැනුවත් කිරීම මෙම කර්තව්‍යයේ අරමුණයි.

**ව්‍යාප්ති පාඨමාලා/ප්‍රජා සත්කාර සේවා වැඩසටහන්**
වසර තුළ දුරස්ථ අධ්‍යයන ක්‍රමවේද භාවිතයෙන් මානව හිමිකම් සහ සාම අධ්‍යයනය සඳහා වන දුරස්ථ අධ්‍යාපන ඩිප්ලෝමාවක් පවත්වන ලදී. පළමු ශිෂ්‍ය කණ්ඩායම හට ඩිප්ලෝමා සහතික ප්‍රදානය කරනු ලැබීය.

**මානව හිමිකම් පිළිබඳ විද්‍යුත් මාධ්‍යයෙන් කෙරෙන දුරස්ථ අධ්‍යාපන ඩිප්ලෝමාව**
මෙම පාඨමාලාව සඳහා විෂය අන්තර්ගතය නිර්මාණය කෙරෙමින් පවතී.

**ප්‍රජාව සඳහා මානව හිමිකම් අධ්‍යාපන වැඩසටහන (Human Rights Education Programme for the Community – HREC)**

දිවයින පුරා ප්‍රජා මධ්‍යස්ථාන 48ක් ස්ථාපනය කර ඇත. දිවයින පුරා මානව හිමිකම් පිළිබඳ දැනුවත්භාවයක් ඇතිකිරීම මෙම ප්‍රජා මධ්‍යස්ථානයෙහි අරමුණයි. ඒ මගින් එම ප්‍රජාවන් තුළ ආකල්පමය වෙනසක් ඇති කිරීමට මග පෑදීමත් ප්‍රජා මට්ටමේදී මානව හිමිකම් උල්ලංඝනය වන අවස්ථා හඳුනා ගැනීමට සහාය වීමත් සිදු වේ. ප්‍රජාව වෙත මගපෙන්වීම මෙම ප්‍රජා මධ්‍යස්ථාන සේවකයන්ගෙන් සිදුවන අතර එවැනි මානව හිමිකම් කඩකිරීම් සඳහා ප්‍රතිකර්ම කිරීමට සහාය දේ.

**කාර්ය මණ්ඩල සංවර්ධනය**

දේශීය පුහුණු හා අධ්‍යයන වැඩසටහන් සඳහා කාර්ය මණ්ඩලය සහභාගී වූහ.

**පුද්ගලික අංශය සමග ජාතික සංවර්ධන ජාලයට දායකත්වය**

ජාතික අධ්‍යාපන ආයතනය හා නීති සහ ශාස්ත්‍ර පීඨ සමග එක්ව ප්‍රජාචාරය හා පරිපාලනය යන විෂය සඳහා මානව හිමිකම් පිළිබඳ උපකාරක කියවීම් පොත වසර තුළදී පිළියෙල කරන ලදී.

නීති පීඨය සමග එක්ව මොරටුව විශ්වවිද්‍යාලය සඳහා මානව හිමිකම් විෂය නිර්දේශය නිර්මාණය කරන ලදී.

ආබාධිත විශ්‍රාමික හමුදා නිලධාරීන් හා ඔවුන්ගේ පවුල් සඳහා මානව හිමිකම් මධ්‍යස්ථානය ‘ADEP’ සමග එක්ව කටයුතු කරන ලදී.

නිවාස හිමිකම් හා ඉවත් කිරීම් සම්බන්ධව ද CSHR විසින් ‘COHRE’ සමග එක්ව කටයුතු කරනු ලැබීය.

**පර්යේෂණ හා වෙනත් ප්‍රකාශන**

ශ්‍රී ලංකාවේ අපරාධ නීතියේ ලිංගබේදය පිළිබඳ සංවේදීත්වය අවබෝධ කර ගැනීම සඳහා අධ්‍යයනයක් සිදු කරන ලදී. වසර තුළ පහත දැක්වෙන ප්‍රකාශන නිකුත් කරන ලදී.

*CSHR e ප්‍රවෘත්ති සංදේශය*
*CSHR ‘සම්භාෂනෙයි’, I වන කළඹ, 2007*
*මගේ අදහසටත් ඉඩක් දෙන්න*
*යුද්ධය ට එදිරිව සාමය පිළිබඳ කතිකාවත*
*වැදි ප්‍රජාවගේ මූලික අධ්‍යාපනය පිළිබඳ මිනුම. (දඹාන සහ හෙන්නානිගල)*
*උපකාරක කියවීම් පොත- මානව හිමිකම් හා ජාත්‍යන්තර සබඳතා*

**යටිතල පහසුකම්, සම්පත්, ගොඩනැගිලි හා ආධාර**

මානව හිමිකම් කේන්ද්‍රයට නීති පීඨයෙහි බිම් මහලේ කාර්යාල අවකාශය, සහ යටිතල පහසුකම් සපයනු ලබනුයේ විශ්වවිද්‍යාලය මගිනි.

විශ්වවිද්‍යාල පරිපාලන පිරිවැයට හා විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදල වෙත CSHR විසින් වාර්ෂික ව ඒ වෙත ලැබෙන අරමුදල් වලින් 16% ක් දායකත්වයක් සපයයි.

2008 වසර සඳහා මූල්‍යමය ආධාර සැපයූවෝ සහ එම අරමුදල් වලින් පවත්වන ලද වැඩසටහන් මෙසේය : ඩයකෝනියා – ප්‍රධාන ආධාරකරු
එක්සත් ජාතීන්ගේ සංවර්ධන ව්‍යාපෘතිය (UNDP), ඔස් ඒඩ් (Aus Aid), ඒ. ආර්. ඩී.

## 03. කොළඹ විශ්වවිද්‍යාලයීය ප්‍රජා ව්‍යාප්ති මධ්‍යස්ථානය (CUCEC)

### හැඳින්වීම

2005 වසරෙහිදී ස්ථාපනය කරන ලද කොළඹ විශ්වවිද්‍යාලයීය ප්‍රජා ව්‍යාප්ති මධ්‍යස්ථානය ප්‍රජා සංවර්ධන කටයුතු සඳහා කැප වූ ශ්‍රී ලංකාවේ ප්‍රථම බහුවිධ කේන්ද්‍රයයි. කේන්ද්‍රය විසින් විවිධත්වයක් ඇති අපහසු පර්යේෂණ කටයුතු හා උපදේශනාත්මක කටයුතු සඳහාද මූලික ජනගහන, සමාජයීය ආර්ථික සංවර්ධන කරුණු සඳහා විධිමත් පුහුණුවක් ලබා දීමද සිදු කරයි. කොළඹ විශ්වවිද්‍යාලයීය ප්‍රජා ව්‍යාප්ති මධ්‍යස්ථාන තොරතුරු හුවමාරුව, අධ්‍යාපන සේවා ලබාදීම, බෙදාහැරීම හා විවාදය සඳහා මධ්‍යස්ථානයක් ලෙසින්ද ක්‍රියා කරයි. කොළඹ විශ්වවිද්‍යාලයීය ප්‍රජා ව්‍යාප්ති මධ්‍යස්ථානය විසින් ජාතික හා කලාපීය ප්‍රතිපත්ති සැලසුම්කරණ කටයුතු ද ප්‍රජා සංවර්ධන කටයුතු ද සඳහා සම්බන්ධතා ඇති කර ගෙන ඇත.

මධ්‍යස්ථානය විසින් පළමු වරට රටෙහි ප්‍රධාන විශ්වවිද්‍යාලයෙහි විවිධ අධ්‍යාත්මික සම්පත් එක්තැන් කර වෘත්තීය එක්තැන් කරන සංවේදී පරිසරයක්, සහභාගිත්ව පුහුණුව හා ප්‍රජා සංවර්ධන කටයුතු වල ක්‍රියාකාරී පර්යේෂණ සිදු කළ හැකි යථා සැකිල්ලක් ලබා දේ.

### කාර්ය මණ්ඩලය

අධ්‍යක්ෂ ලෙස මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක 2008.09.19 දක්වා කටයුතු කළේය. මහාචාර්ය කේ ඒ පී සිද්ධිසේන වැඩ බලන අධ්‍යක්ෂ ලෙස 2008.10.10 සිට කටයුතු කළේය.

මධ්‍යස්ථානයෙහි අධ්‍යක්ෂ ඇතුළුව එක් (01) සම්බන්ධීකාරකවරයෙක් ද එක් (01) තාවකාලික පර්යේෂණ සහකාරවරයෙක්ද එක් (01) තාවකාලික පරිගණක සහකාරවරයෙක් ද එක් (01) තාවකාලික රියැදුරෙක් ද වෙති.

### ව්‍යාප්ති පාඨමාලා/ ප්‍රජා සේවා දායක වැඩසටහන්

මධ්‍යස්ථානය විසින් "සංවර්ධන කටයුතු සඳහා පර්යේෂණ" යන මැයෙන් 2008 අප්‍රේල් සිට ජූනි දක්වා සහතික පත් පාඨමාලාවක් පවත්වන ලදී.

විෂයමාලාව අළුත් කරන ලදුව මෙම සහතිකපත් පාඨමාලාවේ නව නාමකරනයෙන් පසු එය "සංවර්ධන සැලසුම්කරණය හා කළමණාකරනය සඳහා පර්යේෂණ ක්‍රමවේද" නම් වේ.

### පුද්ගලික අංශය සමග ජාතික සංවර්ධන ජාලගතකිරීමට දායකත්වය

- එංගලන්තයේ ලීඩ්ස් මෙට්‍රොපොලිටන් විශ්වවිද්‍යාලය සමග එක්ව සුනාමි බලපෑම් ඇතිවූ කලාපයෙහි පවතින බේරාගැනීමක් හා ශක්තිය ගොඩනැගීම වෙනුවෙන් ව්‍යාපෘතියක් පවත්වන ලදී. මෙයින් සුනාමිය මගින් මිනිසුන්ගේ ජීවිකාවට වූ බලපෑම පිරික්සූ අතර සංචාරක ව්‍යාපාරයෙන් ජීවත්වන කතරගම, අනුරාධපුර හා හික්කඩුව වාසීන්ගේ ජීවිකාවට යුද්ධයෙන් වන බලපෑම ගැනද සොයා බැලේ.
- 'හික්කඩුව සංචාරක ව්‍යාපාරය යළි ගොඩනැගීම' වැඩසටහන යටතේ හික්කඩුව පිළිබඳ සමාජවිද්‍යාත්මක සොයාබැලීම් සිදුවිය. ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය වෙත මෙහි අවසන් වාර්තාව ලබා දෙන ලදී.
- ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය දියුණු කිරීම සඳහා සංචාරක ව්‍යාපාර හා එම ව්‍යාපාරිකයන් පිළිබඳ දත්ත ගබඩාවක් ඇති කරන ලදී.

- පළාතේ කෘෂිකාර්මික කටයුතු සඳහා වාරියපොළ පටක රෝපන විද්‍යාගාරයක් ඇති කරන ලද්දේ වයඹ සංවර්ධන සැලැස්ම අනුවයි. එය වයඹ පළාත් සභාව වෙත 2008 සැප්තැම්බර් මස භාර දෙන තුරු ඉඩම් , කෘෂිකර්ම, වාරි තාක්‍ෂණ හා සත්ව නිෂ්පාදන සේවා එමගින් සපයාදෙන ලදි.

**පර්යේෂණ**

**සුනාමි බලපෑම් වලට යටත් වූ කලාප තුළ පවතින යළි ගොඩනැංවීම් සිදු කිරීම සහ ශක්තිය අත් කර දීම (ලීඩ්ස් මෙට්‍රොපොලිටන් විශ්වවිද්‍යාලය සමග සම්බන්ධව පවත්වන ව්‍යාපෘතියකි)**

ස්වීඩනයේ ස්ටොක්හෝම් පරිසර අධ්‍යයනායතනය විසින් කොළඹ විශ්වවිද්‍යාලයීය ප්‍රජා ව්‍යාප්ති මධ්‍යස්ථානය වෙත සංචාරක කර්මාන්තයෙහි නියැලි බොහෝ පාර්ශ්ව කෙරෙහි ශක්තිමත්භාවය ලඟාකර දීමේ ක්‍රමවේද සොයා දුර්වලතා ඇගයීම් සිදුකිරීම බාර ගැනීමට ආරාධනා කර ඇත. (2007 ඔක්තෝබර් මස සිට 2008 ජූලි මස දක්වා)

**හික්කඩුව සංචාරක ව්‍යාපාරය යළි ගොඩනැගීමේ වැඩසටහන සඳහා හික්කඩුවේ සමාජ විද්‍යාත්මක පර්යේෂණයක් සිදුකිරීම**

හික්කඩුවේ සංචාරක ව්‍යාපාරය යළි ගොඩනැගීමේ වැඩසටහනක් පැවැත්වීමට ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරය විසින් භාරදී ඇත. (2008 පෙබරවාරි මස සිට ජූනි මස දක්වා)

## 04. කොළඹ විශ්වවිද්‍යාලයීය මාගම්පුර කෘෂි තාක්ෂණික හා ප්‍රජා සේවා මධ්‍යස්ථානය (MATCSC), වැලිගත්ත, හම්බන්තොට

මධ්‍යස්ථානයෙහි වැඩබලන අධ්‍යක්ෂ ලෙස ආචාර්ය සී එම් නානායක්කාර 2008.01.02 දින පත්වූ අතර සමාලෝචිත වසර මුළුල්ලේම එම තනතුරෙහි ක්‍රියා කළේය.

**මධ්‍යස්ථානයෙහි අරමුණු**

මධ්‍යස්ථානයෙහි ප්‍රධාන අරමුණු දෙයාකාර වේ. අ) රටෙහි ජාතික සංවර්ධනය ඇසුරින් කලාපීය සංවර්ධන ක්‍රියාකාරකම් වල භූමිකාවක් සිදු කිරීම ආ) විශ්වවිද්‍යාලයෙහි ඉගැන්වීම් හා පර්යේෂණ කටයුතු සිදුකරන අතරම ප්‍රජා සහභාගිත්ව සේවයෙහි යෙදෙන අධ්‍යයන කාර්ය මණ්ඩලයක් මගින් දැනුම බෙදා හැරීම, කෘෂි තාක්ෂණික හා ප්‍රජා සේවා කේන්ද්‍රය හරහා තාක්ෂණය හා ක්‍රමවේද පිළිබඳ දැනුම ලබා දීම ඒවා වේ.

වසරක් පාසා මෙම මධ්‍යස්ථානය මගින් ග්‍රාමීය ප්‍රජාව වෙත ඔවුන්ගේ ආර්ථික වර්ධනය සහ කෘෂිකාර්මික හා අදාල කලාපීය කෘෂි පදනම් කර්මාන්ත වල කාර්යක්ෂමතාව වර්ධනය කිරීමට තාක්ෂණය, දැනුම හා ක්‍රමවේද කාර්යක්ෂම ලෙස ලබාදීම සඳහා ප්‍රජාව සමග සමීප අන්‍යොන්‍ය සබඳතාවක් ගොඩනැගීමට පර්යේෂකයන් හා විශ්වවිද්‍යාලය සමත් වූහ.

ප්‍රජා සේවාවට කැපවූ එසේම ශ්‍රී ලංකාවෙහි විශ්වවිද්‍යාල පද්ධතියකින් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන කිහිපයක සබඳතාවයෙන් බිහිවූ එවැනි ප්‍රථම ව්‍යාපෘතිය ලෙස 2000 වසරෙහිදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත මූල්‍ය ව්‍යාපෘතිය වෙමින් 2008 වසරෙහිදී මධ්‍යස්ථානයෙහි ජයග්‍රහණ ග්‍රාමීය ප්‍රජාවගේ ආර්ථිකය නැංවීම සඳහා සැලකිය යුතු තරම් විය.

මධ්‍යස්ථානය මේ වන විට හම්බන්තොට, පොළොන්නරුව, මාතර, අම්පාර, මොනරාගල, බදුල්ල, මඩකලපුව හා මන්නාරම යන දිස්ත්‍රික්ක වෙත සේවය සලසයි.

**අධ්‍යයන වැඩසටහන්**

2008 ඔක්තෝබර් මස 30 වන දින ඩිප්ලෝමා හා උපාධි දක්වා දිවෙන සහතික පත් පාඨමාලා 8ක් ආරම්භ කරනු ලැබීය. උසස් අධ්‍යාපන වරම් අහිමිව කෘෂිකර්මය තම ජීවන වෘත්තිය කරගත් තරුණ කෘෂි නිෂ්පාදක හා කෘෂි ව්‍යාපාරික ව්‍යවසායකයන් හට මෙම පාඨමාලා ඉලක්ක කර ඇත. මෙම තරුණ ප්‍රජාව දැනුම පාදක කරගත් කෘෂිකර්මයෙහි නියැලෙන අතර ඔවුන්ගේ සමාජීය ආර්ථික තත්ත්වය ඉහළ නැංවීමට උපකාර වේ. මෙමගින් දේශීය ආර්ථිකයටද දායකත්වයක් ලැබේ.

ශක්තිමත් තොරතුරු තාක්ෂණික අංගයක් ද සහිතව on-line ක්‍රමයෙන් විවෘත හා දූරස්ථ ඉගෙනුම් ක්‍රමවේදයක් මගින් දැනුම ලගා කරදීම මෙම පාඨමාලාවේ විශේෂ ලක්ෂණය වේ. මෙසේ නව තාක්ෂණය ග්‍රාමීය ප්‍රජාව වෙත ගෙන යනු ලබයි. අධ්‍යාපන අමාත්‍යාංශයීය දූරස්ථ අධ්‍යාපන නව්‍යකරණ ව්‍යාපෘතිය (DEMP) විසින් මේ සඳහා විද්‍යුත් සබඳතා පහසුකම් ලබා දේ.

**කාර්ය මණ්ඩලය**

සමාලෝචිත වසර තුළ පර්යේෂණ සහකාරවරුන් දෙදෙනෙක් (02) ද, එක් (01) කළමනාකරුවෙක්ද, අධීක්ෂකවරු (02) දෙදෙනෙක්ද (පටක රෝපණ විද්‍යාගාරය හා ආහාර තාක්ෂණික ඒකකය), එක් (01) ක්ෂේත්‍ර සහායකයෙක් ද සහ නුපුහුණු පසලොස් (15) දෙනෙක් ද (පැළැටි නිෂ්පාදන හා තවාන) කොන්ත්‍රාත් පදනම හා අනියම් පදනමින් සේවය කළහ.

පැළ විකිණීමෙන් ලද ආදායමින් ඒ සියල්ලන් හට වැටුප් ගෙවන ලදී.

## ව්‍යාපෘතිය ආරම්භ කිරීම

1. 1999 දී ලුණුගම්වෙහෙර වාරිතාක්ෂණික ව්‍යාපෘතිය යටතේ ගොඩනගන ලද වැලිගත්ත නව නගරයෙහිදී හම්බන්තොට මෙම ව්‍යාපෘතිය අරඹන ලදී. එහෙත් එය ලුණුගම්වෙහෙර ජල ව්‍යාපෘතිය විසින් සැලසුම්කරන ලද ලෙස භාවිතයට ගෙන නැත.
2. වාරි කර්මාන්ත දෙපාර්තමේන්තුවේ මව් ආර ව්‍යාපෘතිය සමග සාමූහිකව මෙම කේන්ද්‍රය ස්ථාපිත කරන ලදී. මවු ආර වාරි තාක්ෂණික ව්‍යාපෘතිය යටතේ නව කෘෂි තාක්ෂණය හඳුන්වාදීමට මධ්‍යස්ථානය ගොවීන් සමග කටයුතු කිරීමට නියමිත ය.
3. දිස්ත්‍රික්කයේ ප්‍රධාන ආදායම් ජනනය කෘෂිකර්මාන්තයයි. මෙනයින් මධ්‍යස්ථානයෙහි ප්‍රධාන කර්තව්‍යයන් කෘෂිකර්මය හා බැඳේ. ඒවා නම් අදාල ආයතන හා සම්බන්ධ වෙමින් හම්බන්තොට නව තාක්ෂනික කෘෂිකර්ම විධි හඳුන්වා දීම වේ. වසර පුරාම වැවීමේ ද්‍රව්‍ය නිෂ්පාදනය කරන පටක රෝපණ විද්‍යාගාරය ක්‍රියාකාරී ව පැවතිණ. රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන කිහිපයක උදව් ඇතිව වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් අතහැර දමා තිබූ ගොඩනැගිලි නැවත සකසා මෙම කටයුත්තෙහි නියැලෙන ලදී.

## මධ්‍යස්ථානයෙහි මූල්‍ය තත්ත්වය

හම්බන්තොට මහජන බැංකුවෙහි කොළඹ විශ්වවිද්‍යාලය මගින් අනුමත වූ වෙනම ලෙජර ගිණුමක් පවත්වාගන යනු ලැබීය. පැල විකිණීමෙන් හා පුහුණු වැඩසටහන් මගින් ඉපයූ මුදල් මෙම ගිණුමෙහි බැර කරන ලදී. ඒ මෙම මධ්‍යස්ථානය මූල්‍යමය වශයෙන් ස්වයංපෝෂිත ආයතනයක් කිරීමටයි.

මධ්‍යස්ථානයට සම්බන්ධ සියළු සේවකයන් පැල විකිණීමෙන් ලද ආදායමින් වැටුප් ලැබූහ.

## සහභාගිත්ව පර්යේෂණ හා පුහුණුව

පහත දක්වා ඇති පරිදි වසර තුළ මධ්‍යස්ථානය තම සේවා හා පුහුණු කටයුතු කර ගෙන යන ලදී.

**1. පටක රෝපණය වර්ධනය කිරීම/ පැල නිෂ්පාදන විද්‍යාගාරය**

මසකට කෙසෙල් පැල 15,000ක නිෂ්පාදනයක් දැනට සිදුවේ. පලාතෙන් තෝරාගත් කාන්තා සේවිකාවන් විසින් මෙම විද්‍යාගාරය නඩත්තු කරනු ලැබේ. (එක් අධ්‍යක්ෂිකාවක් හා පටක රෝපිකාවන් 14 දෙනෙක්)

නව විද්‍යාගාරය සාර්ථක ලෙස ක්‍රියා කල අතර පැල නිෂ්පාදනයට දායක විය. දැනට පැල සඳහා ඇති ඉල්ලුම වසරකට මිලියනයක් පමණ වන අතර විද්‍යාගාරය මෙම ඉල්ලුමට සරිලන සේ විස්තීරණය කිරීමට කටයුතු කරගෙන යනු ලැබේ.

කොළඹ විශ්වවිද්‍යාලය හා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය (MASL) අතර ගිවිසුමකට අනුව තෙවසරක කාල සීමාවකට වැලිගත්ත මධ්‍යස්ථානයට ලබා දුන් සූරියවැව මහවැලි අධිකාරියෙහි පටක රෝපණ විද්‍යාගාරය සම්බන්ධ මුල් ගිවිසුමට අදාල කාලසීමාව නිමා විය. කෙසේ වෙතත් MASL හි ඉල්ලීම මත අධීක්ෂණය තවදුරටත් කෙරීගෙන යයි.

**2. කෘෂි ජෛව තාක්ෂණය සඳහා වන ක්ෂේත්‍ර සහභාගිත්ව පර්යේෂණ**

මධ්‍යස්ථානය ගොවින්ට උපකාර වෙමින් ඔවුන්ගේ ආදායම් උපරිම තත්ත්වයට ගෙන ඒමටත් අන්තර් බෝගකරණය වැනි දෑ පිළිබඳවත් මාර්ගෝපදේශකත්වය ලබා දෙන ලදී. ක්ෂේත්‍ර අධීක්ෂණය කරනු ලබන්නේ ක්ෂේත්‍ර සහකරුවන් විසිනි.

ඉහත දැක්වූ දිස්ත්‍රික් වල දැනට මධ්‍යස්ථානය ගොවින් 400 දෙනෙකු පමණ සමග කටයුතු කරයි. මෙම සහභාගිත්ව ක්‍රමවේදය විසින් ආදායම් වැඩි කළ අතර එය ගොවිජනතාව උනන්දු කරවීය. එබැවින්, මෙම සහභාගිත්ව ක්‍රමවේදය තවත් දිස්ත්‍රික් කිහිපයකට හඳුන්වා දෙන ලදී. ඒවා නම් බදුල්ල, අම්පාර, පොළොන්නරුව ආදියයි. මධ්‍යස්ථානයෙහි සේවා සඳහා පොළොන්නරුවෙන් පමණක් ලද ඉල්ලීම් අපමණය.

තම දිස්ත්‍රික්ක තුළ වැවිලි කටයුතු සිදුකිරිමට වවුනියා සහ මන්නාරම් ගොවිජනයා ද එක් කර ගන්නා ලදී. මෙය සර්වෝදය සංගමය සම්බන්ධ කරගනිමින් සිදුකරනු ඇත.

3. **කෙසෙල් අපනයනය**
කෙසෙල් වැවීම ව්‍යාප්ත කිරීම නොකඩවා සිදුකරනු ලබනුයේ අඛණ්ඩ නිෂ්පාදන ප්‍රමාණයක් වෙත ලගා වෙමින් අවසාන ඉලක්කය ලෙස කෙසෙල් අපනයනය දක්වා ලගා වීමටයි.

4. **ආහාර තාක්‍ෂණය** හම්බන්තොට, මොණරාගල හා පොළොන්නරුව යන දිස්ත්‍රික් වල කෘෂි පාදක කරගත් කර්මාන්ත සංවර්ධනය කිරීමේ දීර්ඝ කාලීන අරමුණින් මෙම අංශය අඛණ්ඩව කටයුතු කරන ලදී. කෙසෙල් චිප් නිෂ්පාදනය ආරම්භ කරන ලද්දේ කෙසෙල් අපනයනයත් සමගයි. මධ්‍යස්ථානය එහි තත්ත්ව සහතිකකරණය කරනු ලැබේ.

5. **බිම්මල් වගාකිරීම පිළිබඳ පුහුණු වැඩසටහන** යටතේ මෙම තාක්‍ෂණය සමග සම්බන්ධ වූ ජනයා හට අඛණ්ඩ සහායක් ලබා දෙන්නේ ඔවුන්ගේ ව්‍යවසායකත්වය තව දුරටත් පවත්වා ගනිමිනි. ප්‍රජාව අතර මෙම කර්මාන්තය ජනප්‍රිය වෙමින් පවතී.

6. **පාසල් ළමුන් සඳහා දැනුවත්වීම්**
වසර තුළ පාසැල් 20ක සිසුන් මෙම කේන්ද්‍රය නැරඹීම සඳහා පැමිණියහ. පටක රෝපණ තාක්‍ෂණය, කෘෂි ජෛව තාක්‍ෂණය, සහ ආහාර සැකසුම්කරණයෙහි විවිධ අංග පිළිබඳ ඔවුන්හට අධ්‍යාපනයක් ලබා දීමට විශේෂ වැඩසටහන් පවත්වනලදී. සිසුන් හට මධ්‍යස්ථානය කුඩා විද්‍යා උද්‍යානයක් බවට පත්වෙමින් කටයුතු කරන ලදී.

7. **Commonwealth of Learning (COL) හි ගොවීන් හට යාවජීව වූ අධ්‍යාපනයක් (L3 Project)** ලබා දීම සඳහා සම්බන්ධතා ව්‍යාපෘතියක් COL සමග ශ්‍රී ලංකාවේ විවෘත විශ්වවිද්‍යාලය හා ගිණිකොන විශ්වවිද්‍යාලය සමග එක්ව ඇති කරගත් අතර එමගින් ගොවීන්හට ජීවිතාන්තය දක්වා අධ්‍යාපනයක් ලබාදීම වෙනුවෙන් කටයුතු කරයි. දිමුතුගම හා තිස්ස ගම්මාන ආදර්ශ ගම් ලෙස තෝරා ගෙන එහි ගොවීන් හට තාක්‍ෂණය, සමග තොරතුරු තාක්‍ෂණය සහ ඉගෙනුම් සම්පත් දෙන ලද්දේ ස්වයං අධ්‍යයනයකටයි. මෙම සංකල්පය ගැමියන් විසින් ග්‍රහණය කර ගෙන ඇති අතර ඔවුන් තාක්‍ෂණයෙහි සාර්ථක ලෙස ඉදිරියට යති. COL හි ප්‍රධාන විධායක නිලධාරී ශ්‍රීමත් ජෝන් ඩැනියල්ස් සහ උපදේශකයන් දෙදෙනෙක් මෙම ව්‍යාපෘතිය නැරඹීමට පැමිණියහ.

**කෘෂි තාක්‍ෂණය හා ග්‍රාමීය විද්‍යා සඳහා ආයතනය**

**කෘෂි තාක්‍ෂණය හා ග්‍රාමීය විද්‍යා සඳහා අධ්‍යයනායතනයක් ස්ථාපනය කිරීම**
මාගම්පුර කෘෂි තාක්‍ෂණික හා ප්‍රජා සත්කාර මධ්‍යස්ථානය අධ්‍යයනායතනයක් බවට උසස් කරන ලද අතර අමාත්‍ය මණ්ඩල අනුමැතිය මේ සඳහා ලබා ගන්නා ලදී. රජයේ 2008.10.16 දින දරණ අංක 1511/15 දරණ විශේෂ ගැසට් නිවේදනයෙහි මෙම නියමාවලිය පළවිය.

ඩිප්ලෝමා දක්වා ඉදිරියට යා හැකි සහතිකපත්‍ර පාඨමාලා මධ්‍යස්ථානය විසින් පවත්වනු ලැබේ. මෙය කෘෂි තාක්ෂණ උපාධියක් දක්වා ගෙන යාමේ ශක්‍යතාවක් ඇත. පාඨමාලා විවෘත දුරස්ථ අධ්‍යාපන ක්‍රමයකින් කෙරෙන අතර උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ දුරස්ථ අධ්‍යාපන නව්‍යකරණ ව්‍යාපෘතිය (DEMP) මගින් මූල්‍ය පහසුකම් සපයා ඇත.

**ආයතනයේ අරමුණ**

- දැනටමත් කෘෂිකර්මයෙහි නියැලි විශේෂයෙන්ම ග්‍රාමීය අංශයේ සිටින දැනුම පාදකකරගත් කෘෂිකාර්මික ව්‍යවසායකයින් හඳුන්වාදී ඔවුන් කෘෂි ජෛව තාක්ෂණික හා කෘෂි ව්‍යාපාරික සහතිකපත්, ඩිප්ලෝමා, හා උපාධි මගින් ස්ථාපිත කරීම
- පරිසරයේ ඇති ස්වභාවික සම්පත් සමගින් ව්‍යවසායකත්වය ඇරඹීමට ව්‍යාපාර තිඹිරිගෙවල් සැපයීම
- විද්‍යා හා තාක්ෂණික පසුබිමකින් දේශීය ව්‍යාවසායකයින් හට සේවා සැපයීම
- රටෙහි ග්‍රාමීය අංශය සඳහා සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය කිරීම සඳහා විශ්වවිද්‍යාලයෙහි භූමිකාව
- ඉගැන්වීම හා පර්යේෂණ සිදුකරන අතරතුරම විශ්වවිද්‍යාලයෙහි ප්‍රජා ව්‍යාප්ති සේවාවෙහි වගකීම සැපිරීම
- දීර්ඝකාලීන අරමුණ වනුයේ කෘෂිකාර්මික කර්මාන්ත මගින් ග්‍රාමීය සමාජ ආර්ථිකය දියුණු කිරීමයි.

**කාර්ය මණ්ඩලය**

මධ්‍යස්ථානයෙහි කාර්ය මණ්ඩලයට අමතරව පාඨමාලා සම්බන්ධීකාරකවරයෙක් කොන්ත්‍රාත් පදනම මත මේ වසරේදී බඳවා ගැණිනි. මධ්‍යස්ථානයට යා වූ කාර්ය මණ්ඩලය මූල්‍යමය වශයෙන් ස්වයංපෝෂිතව සිටී.

**අධ්‍යයන හා වෘත්තීය වැඩසටහන්**

ආයතනය විසින් කෘෂි ජෛව තාක්ෂණය, ආහාර තාක්ෂණය හා ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ සහතික හා ඩිප්ලෝමා පාඨමාලා පවත්වන අතර ඒවා සඳහා ගාස්තු අය කරනු ලැබේ.

ආයතනය විසින් ප්‍රධාන වැඩසටහන් දෙක ඇගයීමකට ලක්කර ඇති අතර ඒවා අඛණ්ඩව පවත්වා ගෙන යනු ලබයි.

| | |
|---|---|
| සහතික පත් පාඨමාලා | - කාලය මාස **3** |
| ඩිප්ලෝමා පාඨමාලා | - කාලය මාස **12** |

කෘෂි තාක්ෂණික කණ්ඩායම් ප්‍රථම වශයෙන් ඇරඹුණේ **2008** ඔක්තෝබර් මාසයේය. බඳවා ගැනීම සඳහා විභාගයක් පැවැත්වූ අතර ගොවීන් **50** දෙනෙකු ඊට ඇතුළත් වූහ. තේරුණු අයගෙන් පාඨමාලා ගාස්තු අය කරන ලදී.

**සහභාගිත්ව පර්යේෂණ හා පුහුණුව**

MATCSC විසින් එහි අධ්‍යයන පාඨමාලා වලට අමතරව පවත්වන සියළුම පාඨමාලා ආයතනය විසින් අඛණ්ඩව කරගෙන යනු ලබයි. එමනිසා, ආයතනය අධ්‍යාපන ආයතනයක් ලෙස බහු විධ භූමිකාවක් ඉටු කර ඇත. එනම් කෘෂි කාර්මික පර්යේෂණ හා පුහුණු ආයතනයක්, පටක රෝපිත කෙසෙල් පැළ නිෂ්පාදනය හා බෙදාහැරීම් කේන්ද්‍රයක්, කෙසෙල් වගාව සඳහා ක්ෂේත්‍ර ව්‍යාප්ති සේවා කේන්ද්‍රයක් සහ විශ්වවිද්‍යාලයිය ඇකඩමියාව සහ කෘෂි ව්‍යාපාරික ප්‍රජාවත් ගොවිජනතාවත් එක්තැන් කරන කේන්ද්‍රයක් ලෙසිනි.

**මහජනයාට ඇති ලාභය**

මධ්‍යස්ථානය විසින් සිදු කරන කටයුතු වැවිලිකරුවන් අතර උනන්දුවක් ජනිත කළ අතර විශේෂයෙන්ම තරුණ අය අතර කෘෂි කර්මාන්තය සඳහා නව තාක්ෂණය යොදා ගැනීමට කැමැත්තක් පෙනි ගොස් ඇත. මේ අනුව ග්‍රාමීය ජනතාව කෘෂිකර්මය හරහා දියුණු කිරීමට ඇති ඉඩකඩ පෙනී යයි. පරිගණකයෙන් විද්‍යුත්

මාධ්‍ය මගින් අධ්‍යාපන පාඨමාලා ලබා දීමෙන් ආයතනය තම කටයුතු විස්තීරණය කරන ලදී. මෙම පාඨමාලා සඳහා ඉලක්ක කරන ලද්දේ ගොවිජනතාවයි. ඔවුන් අද දින දැනුම ලබා ගැනීමට අවශ්‍ය උපකරණ වලින් ශක්තිමත් කර ඇත. ඉංග්‍රීසි, තොරතුරු තාක්ෂණය, මූලික නිපුණතා ලෙස ලබා දී ඇත. ග්‍රාමීය ප්‍රජාව තුළ මෙම පාඨමාලා වෙත ඇතුළු වීමට තිබූ කැමැත්ත ඉතා ඉහළ විය. ආරම්භක පාඨමාලාවට ලද ඉල්ලුම්පත් සංඛ්‍යාව **300** කටත් අධික වීමෙන් මේ බව පෙනී යයි.

1. **තරුණ පරපුර නව කෘෂි තාක්ෂණයට වඩා ප්‍රිය වීම** - කෘෂිකර්මය වාණිජ අතින් යහපත් ව්‍යාපාරයක් බවට පත්වෙමින් තිබේ. එබැවින් රාජ්‍ය උපකාර සහිතව ඇතිකර ගත් දැනුම හා ඇති කර ගත් අවස්ථා අදාල දිස්ත්‍රික්ක වල වාණිජමය කෘෂිකර්මාන්තයකට හා කෘෂි පාදක කරගත් කර්මාන්ත වෙත ලගා වනු ඇත.
2. **ජනතාවගේ ආර්ථික දියුණුව** - මෙය මව් ආර ව්‍යාපෘතිය තුලින් පැහැදිලි විය. මෙහි වක්‍ර ප්‍රතිදානය වූයේ ගොවීන් විසින් සැලසුම්සහගත කෘෂිකර්මය භාවිතයට ගැනීමයි. මේ හරහා ඔවුන් හට වාණිජමය මට්ටමේ කෘෂිකර්මයට ඉඩ සැලසේ. ගොවීන් හට තම ආදායම ඵලදායී ලෙස භාවිතා කිරිමට දැනුවත් කල යුතුය.
3. **විශ්වවිද්‍යාල පර්යේෂකයන් ගේ දායකත්වය** - සමාලෝචිත වසර තුල ග්‍රාමීය ජනතාව ගේ සංවර්ධනය සඳහා මෙය සිදු වූයේ සම්භාවනීය මට්ටමෙනි.
4. **ස්වයං අධ්‍යයනය** - ගොවීන් හට උපාධි මට්ටම දක්වා ඉගෙනීමට දැන් හැකියාව ඇත. මෙයින් ඔවුන්හට පිළිගැනීම මෙන්ම ආර්ථික ලාභ ද ලැබේ.
**4.** **සමාජය තුළ ඇති වන පිළිගැනීම මගින් ගොවිජනතාවට පිළිගැනීමක්** - මෙම ආයතනය ගොවිජනයා හට ඉගෙනීමට හා සහතිකපත් ඩිප්ලෝමා හා උපාධි මට්ටමට ඉගෙනීමට අවස්ථාව සලසා දෙන මෙරට තිබෙන මුල්ම ආයතනය වේ.

**අනාගත සැලසුම්**

මූලිකවම කෘෂි ව්‍යාපාර ඒකකය, ව්‍යාපාර තිඹිරිගෙයක් බවට පත්වෙමින් පවත්නේ එය වැවිලිකරුවන් හා ව්‍යවසායකයන් හට තම ව්‍යාපාරය තුළ අපහසුතා උද්ගත වන විට උපදෙස් ලබා දීමට උපකාරී වන ආයතනයක් වන බැවිනි. මෙහි උප මධ්‍යස්ථාන රටෙහි කලාප **5**ක ඇතිකිරිමට බලාපොරොත්තු වේ. (පොලොන්නරුව, කන්තලේ, අම්පාර හා ත්‍රිකුණාමලය) මේ මගින් තාක්ෂණය ග්‍රාමීය ජනයා වෙත ලැබීමට සලස්වමින් සංවර්ධනය ලගා කරගැනිම අරමුණයි.

1. කෘෂි තාක්ෂණය පිලිබඳ සහතිකපත් හා ඩිප්ලෝමා පාඨමාලා මගින් ගොවීන් පිළිගැනීමට හා බලවත් කරලීමකට ලක්කිරීම - ස්වයං අධ්‍යයන ක්‍රම මගින් දක්ෂතා හා හැකියා සංවර්ධනය ඇති වනු ඇත.
2. සහභාගිත්ව පර්යේෂණ, පුහුණුකිරීම් හා නව කෘෂි තාක්ෂණය යනාදිය වැවිලිකරුවන් වෙත ව්‍යාප්ත කිරීම - නව තාක්ෂණය හ වාණිජ මට්ටමේ කෘෂිකර්මය කෙරෙහි ආකල්ප වෙනස් කිරීම මෙම පුහුණුවට ඇතුලත්වේ. උතුරු මැද හා නැගෙනහිර පළාත් වලට මෙම සේවා ව්‍යාප්ත කිරීමට බලාපොරොත්තු වේ.
3. ආහාර තාක්ෂණය පිලිබඳ පුහුණුව හා ව්‍යාප්තිය - සුවිශේෂීව කෙසෙල් හා කෙසෙල් චිප් ආශ්‍රිත සුළු පරිමාණ කෘෂි ව්‍යාපාරයක් බිහිකිරීම
4. වෛද්‍ය, සමාජයීය හා නීති කටයුතු පිලිබඳ ප්‍රජා සේවාව - වැඩසටහන විශ්වවිද්‍යාලයීය අධ්‍යයන කාර්ය මණ්ඩල විසින් ක්‍රියාත්මක කිරීමට නියමිතයි.
5. කෘෂි සායනය හා ව්‍යාපාර ඒකකය සඳහා තිඹිරිගෙයක් ලෙස ආයතනය සේවය කරයි. මෙයින් ගොවි හා ව්‍යාවසායක ජනයා හට උපදෙස් ලබා ගත හැක. ගොවීන් හා වැවිලිකරුවන් ආයතනයේ සාමාජිකයන් විය යුතුයි. මෙවන් ඒකක වෙනත් රටවල් වල සැලකියයුතු ලෙස කෘෂිකර්මාන්තය වෙත දායක වී ඇත. මෙම අරමුණ සඳහා සේවා සැපයීමට ආයතනය කාර්යක්ෂම ආකාරයෙන් මෙරටෙහි අදාල පහසුකම් නිර්මාණය වන තුරු සූදානම්ව සිටී.

## 05. ජාතික අධ්‍යාපන පර්යේෂණ හා ඇගයීම් මධ්‍යස්ථානය (NEREC)

ජාතික අධ්‍යාපන පර්යේෂණ හා ඇගයීම් මධ්‍යස්ථානය අධ්‍යාපන පීඨයට අනුබද්ධ මධ්‍යස්ථානයකි. මෙහි අරමුණ ජාතික හා කලාපීය මට්ටමින් අධ්‍යාපනය හා පුහුණු කිරීම දියුණු කිරීමයි. මේ සඳහා පර්යේෂණ ඇගයීම් සංවර්ධනය බෙදාහැරීමේ කටයුතු හා තොරතුරු සේවා ලබා දීම සිදු කෙරේ. තෙරෙක් හි මෙහෙවර වනුයේ උත්සාහවත් ඉදිරිය දක්නා බාහිර ලොවට විවෘත වූ අධ්‍යාපනික පර්යේෂණ, ඇගයීම්, පරීක්‍ෂා හා පුහුණුව ඇති කිරීමයි.

ජාතික අධ්‍යාපන පර්යේෂණ හා ඇගයීම් මධ්‍යස්ථානයෙහි අරමුණු මෙසේයි:

- ප්‍රතිපත්ති සම්පාදකයන් හටත් වෘත්තිකයන් හටත් ප්‍රායෝගික වටිනාකමකින් යුතුව යෙදවිය හැකි ව්‍යවහාරික පර්යේෂණ සිදුකිරීම හා ඒවා සංවර්ධනය කිරීම
- පර්යේෂණයෙහි ඇගයීමෙහි හා පුහුණු කටයුතු වල ඉහළම තත්ත්වයට ළඟා වීම
- සාක්ෂි ඇගයීම මත පදනම් වූ සාධාරණ හා විශ්වසනීය පර්යේෂණ ප්‍රතිපල සෙවීම
- සමාජ විද්‍යා පර්යේෂණයෙහි හොඳම ක්‍රමවේද වල සාරධර්ම පදනම් වූ ප්‍රතිපත්ති වලට එකග ව කටයුතු කිරීම
- ගනුදෙනුකරුවන් වෙත කැපවූ හා අනුග්‍රාහකයන්ගේ අවශ්‍යතා කෙරෙහි අවධානය සහිත බව
- මාර්ගෝපදේශ ලෙස අවශ්‍යතාවට ගැලපීම හා මුදලට අගය යන කරුණු ගැන අවධානය
- නව තාක්‍ෂණයෙහි සම්පූර්ණ ඵලය ලබා ගැනීමටත් අධ්‍යාපනයෙහි ක්‍රමානුකූල සංවර්ධනය තොරතුරු ලබා දීම හා පර්යේෂණ සංවර්ධනය ද පුහුණුවද කෙරෙහි දායක වීමටත් කැපවීම
- ව්‍යුහගත, ඉල්ලුමට සරිලන, කෙටි හා මධ්‍ය කාලීන පුහුණු පාඨමාලා මගින් අධ්‍යාපන පර්යේෂණ හා ඇගයීම් සඳහා හොඳම ක්‍රමවේද බෙදා හැරීම

**2000** වසරේදී ස්ථාපනය කළ දා පටන් අධ්‍යාපන ක්‍ෂෙත්‍රයෙහි ජාතික මට්ටමේ පර්යේෂණ අධ්‍යයන **23**ක් සම්පූර්ණ කරන ලදී. මේවා වර්ග දෙකකි. පළමුවැන්න ජාතික මට්ටමේ පර්යේෂණ අධ්‍යයනයයි. දෙවැන්න, පාසල් ළමුන් සඳහා පරීක්‍ෂණ මට්ටමින් විදුලි කෝෂ නිපදවීමයි. මෙයින් 4, 8 හා 10 ශ්‍රේණි වල ළමුන් සඳහා කළ ජාතික ඇගයීම් සැලකිය යුතු වැදගත් කමක් ඇත. ශ්‍රී ලංකාවෙහි පර්යේෂණ සංස්කෘතියක් ඇති කරලීමට මෙම අධ්‍යයන උපකාරී විය. අධ්‍යාපන සැලසුම්කරුවන් මෙන්ම වැඩසටහන් ක්‍රියාත්මකකරන්නන් තත්ත්වයෙන් වෙනස්කමක් ගෙනදෙන වෙනසක් අධ්‍යාපන ක්‍රමවේදයෙහි මෙන් ම පිළිවෙත් වල මේ නිසා ඇති කරලීමට උනන්දුවක් දැක්වූහ. මේවායේ ඉහළ ප්‍රතිඵල ද ලබාගන්නා ලදී. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පර්යේෂණයෙහි ඉදිරි පිම්මක් ලෙස මෙම **6** සිට **13** ශ්‍රේණි දක්වා සිසුන් සඳහා කළ කෝෂ ව්‍යාපෘතිය පෙන්නුම් කළ හැකිය. මෙම හැකියා ශ්‍රේණිගත කිරීම ඔස්සේ ගුරුවරුන් හට සිසුන් සතු විධග්ද හැකියාවන් මැන ගැනිමට මගක් පෑදී ඇත. එසේම මෙම පරීක්‍ෂණ මගින් හේතු සොයාගැනීම් සඳහා ද මග පෑදී ඇත. පාසැල් මට්ටමේදී අනෙකුත් මැනීම් ක්‍රමවේද සමග උපකාරක ක්‍රමවේදයක් ලෙස මෙම ශ්‍රේණිය භාවිත කිරීම උපකාරී වනු ඇත. තෙරෙක්හි සිංහල හා දෙමළ මාධ්‍ය දෙකෙන්ම මුළු රටම සඳහා පිළිවෙත් සපුරන ලෙස මෙම ක්‍රමවේද සකසා ඇත. මේවා පර්යේෂකයන් හා අධ්‍යාපනඥයන් විසින් ලබා ගත හැක. තෙරෙක් මොවුන්හට, මෙය පරිපාලනය කරගැනීමටත් ලබා ගත් ලකුණු පිළිබඳ තිරණය කිරීමටත් උපකාරී වනු ඇත.

ලෝක බැංකුවේ හා අධ්‍යාපන අමාත්‍යංශයේ අනුග්‍රහය ඇතිව තෙරෙක් සම්පූර්ණ වශයෙන් ම **2008** වසරෙහිදී 4 ශ්‍රේණියේ ජාතික ඇගයීම් ලබා ගැනීමට සමත් විය. මෙය 4 ශ්‍රේනියේ සිසුන්ගේ දක්‍ෂතා **2003** හා **2007** වසර වල සැසඳීමකි. මේ අනුව යම් දක්‍ෂතා වර්ධනයක් සිදු වූ බවට සාක්‍ෂියක් ලැබී තිබේ. කලාපීය, පළාත් හා

දේශීය ලෙස සම්මන්ත්‍රණ කිහිපයක් පවත්වන ලදී. මෙමගින් අධ්‍යාපන සැලසුම්කරුවන් හා ක්‍රියාත්මකකරන්නන් අවශ්‍ය යථාවත් කරලීමේ කටයුතු කිරීමට සමත් වූහ. මෙමගින් යහපත් ප්‍රතිඵල ලගා කර ගන්නා ලදී.

2008 වසරෙහිදී පර්යේෂණ අධ්‍යයන තුනක් ක්‍රියාත්මකය. 8 ශ්‍රේණිය සඳහා ජාතික ඇගයීම ඉන් එකක් වන අතර 2005 වසර සමග වර්තමාන සිසුන්ගේ දක්ෂතා ඇගයීම මෙහි අරමුණ වේ. දෙවැන්න, සම්පූර්ණ ඇතුළත් ඉගෙනුමයි. මෙය යුනිසෙෆ් හා අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුග්‍රහයෙන් සිදු වේ. සියළු වැඩසටහන් සඳහා වන ඉලක්ක හා අරමුණු ලගාකරගැනිමට අවශ්‍ය ක්‍රමවිධි සොයාගැනීමට මෙම අධ්‍යයනය උපකාරී වනු ඇත. තෙවන අධ්‍යයනය වනුයේ, පාසැල් පාදකකරගත් කළමනාකරණ ව්‍යාපෘතියකි. මෙය ලංකාවේ තෝරාගත් පාසල් නියැදියක් ආශ්‍රයෙන් සිදු කරනු ලබයි. පර්යේෂණාත්මක සොයාගැනීම් ක්‍රමවේදය මත ක්‍රියාත්මක වන මෙම අධ්‍යයනය විසින්, මූලික ව්‍යාපෘතියක් ලෙස පාසල් පාදක කළමනාකරණයෙහි ක්‍රමවේද හඳුන්වාදෙනු ඇත.

## 06. කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය (SDC)

### හැඳින්වීම

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය (SDC) තම එකොලොස් වන වසර සම්පූර්ණ කරන ලදී. කාර්ය මණ්ඩල සංවර්ධන කේන්ද්‍රය නොයෙක් ක්‍රම වලින් උසස් අධ්‍යාපනය සංවර්ධනය කිරීමට තම දායකත්වය අඛණ්ඩව ලබා දෙන ලදී. මෙයින් කොළඹ විශ්වවිද්‍යාලය පමණක් නොව ශ්‍රී ලංකාවේ අනෙකුත් සියළු විශ්වවිද්‍යාල හා ආයතන ඵල ලැබීය. ක්‍රියාකාරකම් අධ්‍යයන, පරිපාලන, ලිපිකරු කාර්ය මණ්ඩලය, අනෙකුත් අය හා සිසුන් සඳහා ඉලක්ක විය.

සමාලෝචිත වසර තුළ කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් 404 දෙනෙකු පුහුණු කරන ලදී. මෙම පුහුණු කටයුතු වලට පහත දෑ ඇතුළත් විය.

- වෘත්තීය සංවර්ධනය සඳහා ශිෂ්‍ය මූලික ඉගැන්වීම් හා ඉගෙනීම් ක්‍රම සංවර්ධනය හා හුවා දැක්වීම
- විශ්වවිද්‍යාල පද්ධතිය තුළ කළමනාකරුවන් ගේ කළමනාකරණ දක්ෂතා වර්ධනය
- සහායක කාර්යමණ්ඩලයෙහි දක්ෂතා වර්ධනය
- විශ්වවිද්‍යාල පිළිවෙත් හා රෙගුලාසි වල අධ්‍යයන, පරිපාලන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයෙහි දැනුවත්බව වැඩිකිරීම
- කාර්යමණ්ඩලයේ හා සිසුන්ගේ අධ්‍යයන දක්ෂතාවන් ගේ හා ආකල්පමය දැක්මේ වර්ධනය

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය ඇතිකිරීමේ පරමාර්ථයට අනුකූලව ප්‍රාථමික පුහුණුකිරීමේ කටයුත්ත පවත්වාගෙන යන ලදී. එනම් ඉගැන්වීම සංවර්ධනය කිරීම සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩලය පුහුණු කිරීමය. මේ අනුව උසස් අධ්‍යාපනය සඳහා ඉගැන්වීමේ සහතිකය (CTHE) පාඨමාලාව පවත්වාගන යන ලදී. අළුතින් බඳවා ගත් පරිපාලන හා මූල්‍ය සේවකයන් සඳහා උපකුලපතිතුමියගේ අනුදැනුමැතිව හඳුන්වාදීමේ වැඩසටහනක් සැලසුම්කර පවත්වාගෙන යන ලදී. මෙය විශ්වවිද්‍යාලයීය ක්‍රමය හා එය ක්‍රියාත්මක වන ආකාරය ගැන ඒ අය දැනුවත්කිරීමට ගත්තාලද නව පියවරකි.

සම්පත් දායකයන් පුහුණුකිරීම හා ඔවුන්ගේ වැඩසටහන් සකසා ගැනීමට උපදෙස් දීම මගින් වෙනත් කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථාන සඳහා සහාය වීම කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් සිදු කරන අනෙකුත් කටයුතු වේ.

### කාර්ය මණ්ඩල තොරතුරු

සප්ත වාර්ෂික නිවාඩු ලැබීම සඳහා මහාචාර්ය එස් යූ කේ ඒකරත්න මහතා දැරූ අධ්‍යක්ෂ පදවියෙන් 2008.02.15 දින ඉල්ලා අස්විය. 2008 පෙබරවාරි 15 සිට සැප්තැම්බර් 14 දක්වා වයි එම් එස් කේ වීරකෝන් මිය එම ධූරයෙහි වැඩ බලන ලදී. 2008.09.15 දින සිට මහාචාර්ය මාරි පෙරේරා මිය අධ්‍යක්ෂ පදවිය භාර ගත්තාය.

කාර්ය මණ්ඩලයෙහි ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙක්, ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහායකයෙක්, පරිගනක යෙදවුම් සහකරුවෙක් හා කම්කරුවෙක් වූහ.

සමාලෝචිත වසර තුළ නව සාමාජිකයන් දෙදෙනෙකු බඳවා ගන්නා ලදී. විද්‍යාත්මක සහායිකා ලෙස පී ඩී දයානන්ද මිය 2008.04.16 දින වැඩ භාර ගත් අතර 2008.06.24 දින ආර් එම් සි රත්නායක මහතා සේවක සංවර්ධනය සඳහා පරිවාස කථිකාචාර්ය ලෙස වැඩ භාර ගත්තේය. 2008.09.15 දින සිට වයි. එම්. එස්. කේ. වීරකෝන් මිය සප්ත වාර්ෂික නිවාඩු ලැබුවාය.

## ප්‍රථම උපාධි වැඩසටහන්

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් කිසිදු උපාධි පාඨමාලාවක් පැවැත්විමට නියමිත ක්‍රියා නොකරන අතර හුදෙක් කාර්ය මණ්ඩල පුහුණුකිරීම් සිදු කරයි. කෙසේ වෙතත් නවක සිසුන් හට ඉගෙනීම් ක්‍රමවේද පිළිබඳ දේශන පවත්වන ලදී. මෙය මූලිකවම විශ්වවිද්‍යාලයීය ඉගෙනීම් සංස්කෘතියක් ඇති කිරිමේ අරමුණින් හා විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය ප්‍රජාවගේ කාර්යක්‍ෂමභාවය ප්‍රවර්ධනය සඳහා සිදුකරන ලදී.

## ව්‍යාප්ති පාඨමාලා/ප්‍රජා සේවා වැඩසටහන්

බාහිර ප්‍රජාව ඉලක්ක කර කිසිදු වැඩසටහනක් පවත්වනු නොලැබේ. එහෙත් එහි පාඨමාලා හා වැඩමුළු සඳහා වෙනත් විශ්වවිද්‍යාලයන්හි හා ආයතනයන්හි කාර්යමණ්ඩල විසින් සහභාගි වනු ලබයි.

## පශ්චාත් උපාධි වැඩසටහන්

විශ්වවිද්‍යාල කාර්යමණ්ඩල සඳහා පැවැත්වූ එකොළොස්වන උසස් අධ්‍යාපන ඉගෙනුම් සහතිකපත් පාඨමාලාව සඳහා විශ්වවිද්‍යාල කිහිපයක අධ්‍යයන කාර්ය මණ්ඩලය **80** දෙනෙකු විසින් සහභාගී වූහ. පැමිණීමේ අප්‍රමාණවත්භාවය කරණ කොට ගෙන කිහිප දෙනෙක් ඉදිරියට යාමට අපොහොසත් වූ අතර එය ප්‍රධාන වශයෙන් පශ්චාත් උපාධි අධ්‍යයන සඳහා විදේශගත වීම කරන කොට ගෙන සිදුවිය. ඉතිරි අය හා පළමු කණ්ඩායම් එක්ව **80** දෙනෙක් සමත් වූ අතර එම සමත් ප්‍රතිශතය 93.5% කි. එක්සත් රාජධානියේ සෙඩා සඳහා **36**ක් වූ අතර මෙය ජාත්‍යන්තර මට්ටමේ පිළිගැනීම සඳහා 45% ක ප්‍රතිශතයකි. මහාචාර්ය සුකී ඒකරත්න හා එස් වීරකෝන් විසින් එක්ව මෙම පාඨමාලාව පැවැත්විය. **2008** අගෝස්තු මසදී **12**වන උසස් අධ්‍යාපනය සඳහා ඉගැන්වීමේ සහතිකය (CTHE) පාඨමාලා කණ්ඩායම ආරම්භ වූ අතර එය ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල කිහිපයක කථිකාචාර්යවරුන් **62** දෙනෙකු සඳහා පවත්වනු ලැබේ. මේ සියළු වැඩමුළු මහාචාර්ය මාරි පෙරේරා විසින් මෙහෙයවනු ලැබේ.

## කාර්යමණ්ඩල වැඩසටහන්

නේවාසික හා එක් දින වැඩමුළු පවත්වන ලදී. ඉගැන්වීමට සම්බන්ධ කරුණු සංවර්ධනය සඳහා යොදාගත් මාතෘකා නම් ලිවීමේ දක්‍ෂතා, ස්මරණ පුහුණු, එස් පහ සහ කාර්යක්‍ෂමතාව, ඉගැන්විම කාර්යක්‍ෂමකිරීම, ඉගැන්වීමේ පාඨමාලාවකට ඔබ්බෙන් ශිෂ්‍ය ඉගෙනීම් සම්බන්ධ ප්‍රශ්න විසඳීම, විෂය මාලා සැලසුම් ඒකාග්‍ර කිරීම, ඉගෙනීම වැඩිදියුණු කිරීම සඳහා ඉගැන්වීම හා ඇගයීම, අපගේ විශ්වවිද්‍යාලයීය කටයුතු වල වෙනස්කම් සැලසුම්කිරීම හා ක්‍රියාත්මක කිරීම, විශ්වවිද්‍යාලයන්හි වෙනස්කම් සැලසුම්කරණය හා මාදිරි පුහුණු කිරීම්, ශ්‍රී ලංකාවේ සහේතුක උසස් අධ්‍යාපනයක් සඳහා විශ්වවිද්‍යාල විෂය මාලා නැවත සැලසුම් කිරීම, සිසුන්ගේ ඉගෙනුම් ක්‍රියාකාරීත්වය හා ප්‍රතිදානය පරිපාලන හා කළමනාකරණ ක්‍රියාකාරකම් සමග සමපාත කිරීම, අර්ථසාධක ක්‍රියාකාරකම් හා පුද්ගලික ලිපිගොනු පද්ධතිය, විශ්වවිද්‍යාලයෙහි පරිපාලනමය ක්‍රමවේද වැඩිදියුණු කිරීම සඳහා මාදිරි වෙනස් කිරීම වේ.

තම වගකීම් හා කාර්යභාරය කාර්යක්‍ෂම ලෙස සිදුකිරීමට අධ්‍යයන, පරිපාලන හා සහාය කාර්ය මණ්ඩලයෙහි උනන්දුව වැඩිදියුණු කිරීම සඳහා SDC විසින් වැඩමුළු හා පරිගණක නිපුණතා, ඉංග්‍රීසි භාෂා ඥානය, කාර්යක්‍ෂම මූල්‍ය ක්‍රමවේද වැනි විෂයයන් සඳහා පාඨමාලා පවත්වන ලදී.

වැඩමුළු මෙහෙයවූ විදේශීය උපදේශකවරුන් අතර මහාචාර්ය රනල්ඩ් මැක්ඩොනල්ඩ් හා මහාචාර්ය මැතිව් ඔලෙට් වැනි අය වූහ. ඉගෙනගන්නා ප්‍රජාවන් ලෙස සොක්‍රටීක

කණ්ඩායම් වෙත සහය වීම පිලිබඳ හා කතිප්ඨ පීඨය කෙරෙහි උපදේශනය යන තේමාව යටතේද සාරධර්ම සහිත ක්‍රමවිධි හා අපගේ උගැන්වීම් තුල සම අවස්ථා ලබාදීම යන තේමාව යටතේ ද  මහාචාර්ය ඔලෙට් විසින් වරුවේ වැඩමුළු තුනක් පවත්වන ලදී. ඉගෙනීමට උත්සුක කිරීම සඳහා ඇගයීම් ක්‍රමවේද නමින් දිනක වැඩමුළුවක් මහචාර්ය රනල්ඩ්  මැක්ඩොනල්ඩ් විසින් පවත්වන ලදී.

සතියකට වරුවක් සති 15ක් පුරා කොළඹ විශ්වවිද්‍යාලයීය පරිපාලන හා මූල්‍ය ඒකක වල නව කාර්ය මණ්ඩල සඳහා වරුවේ වැඩමුළු පවත්වන ලදී. මෙම වැඩමුළු සඳහා පීඨාධිපතිවරුන් හා ජ්‍යෙෂ්ඨ පරිපාලන හා මූල්‍ය ක්ෂේත්‍ර වල නිලධාරීන් සම්පත් දායකයන් වූහ. මෙම වැඩසටහන නිලධාරීන් 16 දෙනෙක් විසින් නිම කරන ලදී.

සිසුන්ගේ හා කාර්ය මණ්ඩලයෙහි නිපුණතා සංවර්ධනය පුළුල් කිරීම සඳහා ඉගැන්වීම භාවිත කිරීම යන තේමාවෙන් අධ්‍යාපන සංවර්ධනය සඳහා සම්මන්ත්‍රණයක් උසස් අධ්‍යාපනයෙහි කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා වන ශ්‍රී ලංකා සංගමයේ (SLAIHEE) සහභාගිත්වය ඇතිව පවත්වන ලදී. සියළු ජාතික විශ්වවිද්‍යාල වලින් අධ්‍යයන කාර්ය මණ්ඩලය 90 දෙනෙක් මීට සහභාගී වූහ. කොළඹ විශ්වවිද්‍යාලයෙහි කාර්ය මණ්ඩලය 25 දෙනෙකු මීට සහභාගි වූ අතර, ඊට ලන්ඩනයේ RIPA ජාත්‍යන්තර ආයතනයේ ක්‍රමවේදී වෙනස් වීම් වෙත නායකත්වය ලබා දීම පිළිබඳ පුහුණු වැඩසටහනකට සහභාගී වූ ලේඛකාධිකාරිතුමිය ද අයත් විය.

**පුද්ගලික අංශය සමග ජාතික සංවර්ධන ජාලගත වීම**

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය වෙනත් රටවල කාර්ය මණ්ඩල හා අධ්‍යාපන සංවර්ධන ආයතන සමග අඛණ්ඩව කටයුතු කළ අතර ඒවා නම්, එක්සත් රාජධානියෙහි සෙඩා කාර්ය මණ්ඩල හා අධ්‍යාපන සංවර්ධන සාමාජිකයන්, ජාත්‍යන්තර අධ්‍යාපන සංවර්ධන උපදේශක සභාව (ICED) වෘත්තීය හා ආයතනික සංවර්ධන ජාලය, ඇමරිකා එක්සත් ජනපදය, වේ. ඉදිරිපත් කර ඇති පාඨමාලා දෙකක් වන උසස් අධ්‍යාපනය සඳහා ඉගැන්වීමේ සහතිකය (CTHE) සහ ASTHE එක්සත් රාජධානියේ සෙඩා සමග අනුබද්ධිතය. මෙම පාඨමාලා දෙක ශෙෆීල්ඩ් හැලම් විශ්වවිද්‍යාලයේ අධ්‍යයන සංවර්ධනය පිළිබඳ මහාචාර්යවරයෙකු වන මහාචාර්ය රනල්ඩ් මැක්ඩොනල්ඩ් විසින් සමාලෝචනයට බඳුන්කර ඇත.  සමාලෝචිත වසර තුළ එක්සත් රාජධානියේ සෙඩා විසින් මෙම පාඨමාලාවන්හි ක්‍රියාකාරිත්වය ඇගයීමට ලක් කරන ලදුව තවත් වසර තුනකට අනුබද්ධිතතාව ලබා දෙන ලදී.

මහාචාර්ය ඒකරත්න මෙහි පාලක සභා සාමාජිකයෙක් ලෙස තවදුරටත් කටයුතු කළේය. ජාතික අධ්‍යාපන ආයතනයෙහි පාලක සභා සාමාජිකයෙක් ලෙසද මානව සම්පත් හා අධ්‍යාපනය පිළිබඳ ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලයෙහි අනු කමිටුවෙහි සාමාජිකයෙක් ලෙසද කටයුතු කරයි. කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයෙහි අධ්‍යක්ෂ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමෙහි කාර්ය මණ්ඩල සංවර්ධන නිත්‍ය කමිටු සාමාජිකයෙක් ද වෙයි.

ශාස්ත්‍ර පීඨ වාර්ෂික විෂය මාලා විශෝධන වැඩමුළුව සඳහා අනුග්‍රහය දැක්වීමට කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය පොහොසත් විය.

උසස් අධ්‍යාපනයෙහි කාර්යක්ෂම බව වර්ධනය කිරීමෙ ශ්‍රී ලංකා සංගමයෙහි සභාපති හා ලේකම් ලෙස මහාචාර්ය ඒකරත්න හා වීරකෝන් මිය දෙවන වසරටත් කටයුතු කළහ. එම සංගමයෙහි සංදේශයෙහි කතෘ ලෙස මහාචාර්ය ඒකරත්න කටයුතු කළ අතර අධ්‍යාපන සංවර්ධන ජාත්‍යන්තර වාර සගරාවෙහි ජාත්‍යාන්තර තීරකයෙක් ලෙසද කටයුතු කරයි.

## පර්යේෂණ හා ප්‍රකාශන

ඒකරත්න සූකී සහ වීරකෝන් ශ්‍රීනිකා; The Use of New Alliances to Broaden the Scholarship of Teaching and Learning Horizons in Training New Lecturers, ඉගැන්වීම හා ඉගෙනීම පිළිබඳ ලන්ඩන් ශිෂ්‍යත්ව ජාත්‍යන්තර සමුළුව, පිටුව 32.

වීරකෝන් වයි. එම්. එස්. කේ.; Issues Affecting First Year Student University Experience and Impact on Future Sustainable Development, පිටු 79 -85, ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පස්වන ජාත්‍යන්තර සම්මන්ත්‍රණය, කළමනාකරණ අධ්‍යයන හා මූල්‍ය පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

වීරකෝන් ශ්‍රීනිකා සහ ඒකරත්න සූකී; Training Lecturers to use Small Group Teaching to Facilitate a Range of Skill Development in Students Through a Learning Agreement Tool, පිටුව 2, සිව් වන සම්මන්ත්‍රණය, උසස් අධ්‍යාපනය නගා සිටුවීමෙහි ශ්‍රී ලංකා සංගමය, කොළඹ, ශ්‍රී ලංකාව.

## යටිතල පහසුකම් හා සම්පත්

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථාන කාර්යාලයෙහි වායු සමන යන්ත්‍ර සවිකරන ලදී. බාහිර සීඩා සරෙක් ආධාරයෙන් මෙය සිදු කළත් මෙය සම්මන්ත්‍රණාගාරයෙහි සවිකිරීමට නියමිතය.

කාර්ය මණ්ඩලයේ 8 දෙනෙක් විදේශීය පුහුණුවකට යැවීම සඳහා නිශ්චිත කාර්ය වෙනුවෙන් ස්වීඩනයෙන් ලද සීඩා සරෙක් කාර්ය මණ්ඩල සංවර්ධන අරමුදල භාවිතා කළේය. ශාස්ත්‍ර පීඨ වාර්ෂික විෂය මාලා ඇගයීම සඳහා වූ නේවාසික වැඩමුළු දෙකක් සඳහා ද එයින් අනුග්‍රහය දැක්වීමට හැකි විය.

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථාන පුස්තකාලයට නව ග්‍රන්ථ ද පරිගණක භාවිතය හා ඉංග්‍රීසි භාෂාව සඳහා නව කාර්ය මණ්ඩලය පුහුණු කිරීමට ද මෙම අරමුදලින් වසර මුළුල්ලේම හැකි විය.

මෙම අරමුදලින් කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය වෙත තම කටයුතු සිදුකිරීමට සහාය දෙන ලද අතර අප මෙම අරමුදල සඳහා බෙහෙවින් ස්තුතිවන්ත වෙමු. මහාචාර්ය මැතිව් ඔලෙට් විසින් 2006 සිට 2008 දක්වා කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයෙහි කාර්ය සාධනය විමර්ෂණය කරන ලද අතර විශ්වවිද්‍යාලයීය සනාතන සභාවට හා පාලක සභාවට ඉදිරිපත් කර ඇති වාර්තාව අනුව එස් ඩී සී කාර්ය මණ්ඩලය සතු සම්පත් වලින් උපරිම ඵල ලබා ගන්නා බව සඳහන් කර කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයෙහි පූර්ණ ක්‍රියාකාරිත්වය අගයා තිබිණි.

# VIII කොටස

# පුස්තකාලය

**හැඳින්වීම**

2008 වර්ෂය පුස්තකාල සම්පත් සහ සේවාවන්වල වැදගත් වර්ධනයක් පිලිබිඹු කලේය. අංශ ප්‍රධානීවරුන්ට විවිධ වැඩ කොටස්වල යෙදීමට අවකාශ සලසා දෙමින් එතෙක් පුරප්පාඩුව තිබූ තනතුරු කිහිපයක් පිරවිය.

රුපියල් මිලියන 2.5 ක වියදමින් ප්‍රධාන පුස්තකාලයේ ආරක්ෂක ප්‍රවේශ මාර්තු මාසයේදී ස්ථාපනය කරන ලද අතර 2009 වර්ෂය වන විට ඒවා මැනවින් ක්‍රියාත්මක වනු ඇත.

**සම්පත්**
පුස්තකාලයට දායක විය හැකි වූ උධෘත 138 අමතරව පොත් සහ වාර සගරා සඳහා 2008 වර්ෂයේ වෙන් කරන ලද මුදල රුපියල් මිලියන 22 කි. එය 2007 වසරේ ප්‍රමාණයට වඩා උද්ධෘත 24 ක අඩුවීමකි. මෙම වසරේ වාර සගරා සඳහා දායක මුදල් ඉහල යාම එක්සත් රාජධානි පවුම, යුරෝව සහ අමෙරිකන් ඩොලරයේ වටිනාකම රුපියලට සාපේක්ෂව ඉහළ යාමෙන් ඇති වූ බලපෑමකි.

2008 වසර ඉලෙක්ට්‍රෝනික දත්ත බැංකුවලට ප්‍රවේශවීම සම්බන්ධයෙන්ද හරසුන් වසරකි. එවැනි ඉලෙක්ට්‍රෝනික දත්ත බැංකුවලට ප්‍රවේශ වීමට ප්‍රතිපාදන සැපයූ සීඩා/සරෙක් පුස්තකාල ආධාර ව්‍යාපෘතිය 2007 දී අවසන් විය ඉතිරි වී තිබූ අමෙරිකානු ඩොලර් 11,476.00 ක මුදල භාවිත කිරීමෙන් පල්ග්‍රාව්-මැක්මිලන් සගරාවලටත් ටේලර්-ෆ්‍රැන්සිස් ඉලෙක්ට්‍රෝනික පොත්වලටත් වෝල්ටර් ඩි ගෲයිට අන්තර්ජාල සගරාවලටත් දායක වීමට හැකි විය මීට අමතරව කැලිෆෝනියා විශ්ව විද්‍යාල මුද්‍රණාලයේත් චිකාගෝ විශ්ව විද්‍යාල මුද්‍රණාලයේත් අන්තර්ජාල සම්පත්වලට එකිසත් රාජධානියේ ඔක්ස්ෆර්ඩ් අයි.එන්.එස්.පී. හරහා ප්‍රවේශ වීමේ හැකියාව සැපයිණි. එබ්ස්කෝ සහ බ්ලැක්වෙල්ස් ප්‍රකාශන සමාගමේ ඉතා ජනප්‍රිය දත්තබැංකු ප්‍රතිපාදන හිඟකම නිසා අවලංගු කර දැමීමට සිදු විය.

ෆෝර්ඩ් පදනමේ අනුග්‍රහයෙන් JSTOR සහ IMF ප්‍රකාශන වෙත ප්‍රවේශ වීම පුස්තකාලය විසින් අඛණ්ඩව පවත්වා ගෙන යන ලදී.

**පාඨක සේවාව.**
අධි ආරක්ෂක කලාපයක පිහිටා තිබීම හේතුවෙන් ප්‍රධාන පුස්තකාලය විවෘත කොට තිබෙන කාලය පැය දෙකකින් අඩු කෙරිණි. ඒ අනුව දැන් ප්‍රධාන පුස්තකාලය පස්වරු 6 ට වසා දැමේ. කෙසේ වෙතත් වෛද්‍ය පුස්තකාලය පස්වරු 8 වන තරු විවෘතව තැබීමට කටයුතු කෙරිණි. සෙමෙස්තර විභාග කාලවලදී විද්‍යා පුස්තකාලය පස්වරු 8 දක්වා විවෘතව තැබිණි.

උපාධි අපේක්ෂකයින් සහ පශ්චාත් උපාධි අපේක්ෂකයින් 5691 ක් ද අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් 1570 ක් ඇතුලුව සමස්ත පාඨක සංඛ්‍යාව 7261 ක් ප්‍රධාන පුස්තකාලය වෛද්‍ය සහ විද්‍යා පුස්තකාලවල ලියාපදිංචි විය. විදේශ ශිෂ්‍යයින් 8 දෙනෙකු ඇතුලුව ශිෂ්‍යයින් 33 දෙනෙකුට කෙටිකාලීන පාඨකභාවය ලබාදුන්නේය පුස්තකාලය භාවිත කළ පාඨකයින්ගේ ප්‍රතිශතය 1245 ක් විය.

**පුස්තකාල ස්වයංක්‍රීයකරණය.**

2007 වසරේදී ආරම්භ කරන ලද ප්‍රධාන පුස්තකාලයේ එකතුව කේතකරණය මෙහිදි විමර්ශනයට ලක්වන වසර ෑතෙක් අඛණ්ඩව පවත්වා ගෙන ආවේය.

කේතකරණය සඳහා සම්බන්ධ වූ කාර්ය මණ්ඩලයේ සියලුම දෙනා වෙත පුස්තකාලාධිපති විසින් කෘතවේදිව සිහිපත් කරනු ලැබේ.

**සම්පත් මධ්‍යස්ථානය සහ වෙනත් සේවාවන්**

කළ හැකි ආරක්ෂක වෘද්ධි සඳහා පුස්තකාලයේ ඉලෙක්ට්‍රෝනික සම්පත් මධ්‍යස්ථානයේ පරිගණකවල ක්‍රියාකාරී පද්ධතිය ලිනක්ස් වෙත මාරු කෙරිණි. ශිෂ්‍යයින් සඳහා ඉලෙක්ට්‍රොනික සම්පත් පරිහරණය පුහුණු කිරීම ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය විසින් පවත්වා ගෙන යන ලදී. මීට අමතර වශයෙන් ඉලෙක්ට්‍රෝනික තොරතුරු වැඩමුළු දෙකක් විශ්ව විද්‍යාලයේ පර්යේෂණ ශිෂ්‍යයින් සඳහා සංවිධානය කෙරිණි. ප්‍රධාන පුස්තකාලයේත් වෛද්‍ය සහ විද්‍යා පුස්තකාලවලත් තිබෙන ඉලෙක්ටෝනික සම්පත් ශිෂ්‍යයින් විසින් තීව්‍ර ලෙස භාවිතයට ගත් අතර තව තවත් පරිගණක ලබා දීමෙන් එම පහසුකම වැඩි දියුණු කළ යුතුය.

ප්‍රධාන පුස්තකාලය වෛද්‍ය සහ විද්‍යා පූසතකාලවලින් වර්ෂයේ ලද ආදායම් පහත වන පරිදිය.

**VIII-01 වගුව පුස්තකාල මගින් ලද ආදායම්**

| ගාස්තු/දඩ | එකතුව (රුපි) |
|---|---|
| ඡායාස්ථිති පිටපත් මිල | 4,202.00 |
| නැති වූ පොත් ප්‍රතිපූරණය | 148,062.62 |
| පොත් බැඳීම් | 52,115.00 |
| දඩ | 456,501.20 |
| සම්මන්ත්‍රණ ශාලා කුලී | 148,000.00 |
| තාවකාලික පාඨක ගාස්තු | 9,600.00 |
| නැති වූ ප්‍රවේශපත්‍ර ස්ථානගත කිරීම් | 7,903.75 |
| **එකතුව** | **826,384.57** |

**කාර්ය මණ්ඩල තොරතුරු**

එස් සී ජයසූරිය මහත්මිය සිය සප්ත වාර්ෂික නිවාඩු නිමවා සේවයට වාර්තා කරන තෙක් **31.10.2008** දක්වා ඩී. සී. කුරුප්පු මහත්මිය වැඩ බලන පුස්තකාලයාධිපති තනතුරේ කටයුතු කළාය.

පී විජේතුංග මහත්මිය ජාතික පුස්තකාල හා විඥාපන ආයතනයේ අධ්‍යක්ෂක ලෙස වසර හයක කාලයක සේවය සම්පූර්ණ කිරීමෙන් පසුව ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලාධිපති ලෙස 24.02.2008 දින සේවයට වාර්තා කළාය.

පුස්තකාලය සංවර්ධනය කිරීමට බාධාවක්ව පැවති කාර්ය මණ්ඩල හිගය පියවීම සඳහා වසරේ පසු භාගයේදී පුරප්පාඩු තනතුරු කිහිපයක් පිරවිය.

**උපාධි අපේක්ෂක වැඩසටහන්**

පුස්තකාලයේ ඉලෙක්ට්‍රොනික සම්පත් මධ්‍යස්ථානය උපයෝගී කර ගනිමින් උපාධි අපේක්ෂකයින් සඳහා පුහුණු වැඩ සටහන් කිහිපයක් පැවැත්විය.

**විස්තිරණ පාඨමාලා/ප්‍රජා සේවා ප්‍රචාරණ වැඩ සටහන**

පුස්තකාලය මගින් ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සහ ජාතික පුස්තකාල සහ විඥාපන විද්‍යා ආයතනයේ ශිෂ්‍යයින්ට සති දෙකක පුහුණු වැඩ සටහනක් පැවැත්විය. ආරක්ෂක

අමාත්‍යාංශයේ රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂගේ ඉල්ලීම පරිදි පුහුණුවන්නන් 12 දෙනෙකු සඳහා බැඳුම්කරණය පිලිබඳ පුහුණුවක් ලබා දුන්නේය.

**පශ්චාත් උපාධි වැඩසටහන්.**

උපාධි අධ්‍යයන පීඨයේ පුස්තකාල තොරතුරු පද්ධති කලමණාකරනය පිලිබඳ ශාස්ත්‍රපති උපාධිය දක්වා වන තොරතුරු පද්ධති කළමනාකරණය පිලිබඳ ඩිප්ලෝමාවක් පුස්තකාලය මගින් 11.07.2008 දින ආරම්භ කලේය.

**කාර්ය මණ්ඩල සංවර්ධනය.**

2008 සැප්තැම්බර් මස එක්සත් රාජධානියේ වරලත් පුස්තකාල හා තොරතුරු වෘත්තිකයන්ගේ අධ්‍යයනායතනයෙහි යාවජීව සාමාජිකත්වය පී විජේතුංග මිය වෙත ප්‍රදානය කරන ලදී.

උපාධි අධ්‍යයන පීඨයෙහි සහකාර පුස්තකාලයාධිපතිවරුන් පස් දෙනෙක් ශාස්ත්‍රපති උපාධිද ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන් තිදෙනෙක් දර්ශනශූරි උපාධිය ද හදාරති. විශ්වවිද්‍යාල පුස්තකාල සංගමය හා ශ්‍රී ලංකා පුස්තකාල සංගමය විසින් පවත්වන ලද වැඩමුළු වලට ජ්‍යෙෂ්ඨ සාමාජිකයන් සහභාගී වූහ. පුස්තකාල සහායකවරුන් තිදෙනෙක් කෙටි කාලීන පුහුනු වැඩසටහන් වලට සහභාගී වූහ.

**VIII-02 වගුව : පර්යේෂණ ප්‍රකාශන හා ඉදිරිපත් කිරීම්**

| පර්යේෂණ | එකතුව |
|---|---|
| ඉදිරිපත් කිරීම්/වාර සගරා | 07 |
| ඇගයීම්/ පර්යේපණ පත්‍රිකා හා ප්‍රධාන දේශන | 03 |

## පුද්ගලික අංශය සමග ජාතික සංවර්ධන ජාලගතකිරීම සඳහා දායකත්වය

සිඩා හා සරෙක් මූල්‍ය දායකත්වය සහිතව ඉලෙක්ට්‍රොනික දත්ත ගබඩා තුනකට අවකාශ සලසා දෙනලදී. මෙම පහසුකම සියලු විශ්වවිද්‍යාල, අධ්‍යයන, පර්යේෂණ, රාජ්‍ය, වාණිජ නොවන ආයතන වෙත ලබා දෙන ලදී. ශ්‍රී ලාංකීය විශ්වවිද්‍යාලය වෙත පුස්තකාල සහාය යන වැඩසටහනෙහි ව්‍යාපෘති නායකයා ලෙස ද දේශීය සම්බන්ධීකාරක ලෙසද පුස්තකාලයාධිපති කටයුතු කරන ලදී.

හෙලිස් ජාලයෙහි වැඩි අවධානය ගැනෙන වෛද්‍යපීඨ පුස්තකාලය භාවිතා කරන්නන්ගේ දැනුවත් බව වර්ධනය කරන්නට පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. සෞඛ්‍යය, පුස්තකාල සේවකයන් හට තොරතුරු තාක්ෂණ (IT) පුහුණුව සහ ඉලෙක්ට්‍රොනික ලේඛන ලබාදීමේ සේවා, ජාලයෙහි සියලු සාමාජික පුස්තකාල 22ට හා ශ්‍රී ලංකාවේ හා ගිණිකොනදිග ආසියාවේ සෞඛ්‍ය හා සෞඛ්‍ය සම්බන්ධ විද්‍යා වෘත්තිකයන් හා අර්ධ වෘත්තිකයන් හට SDCP සේවා ලබා දීම ඒවා වේ,

# IX කොටස

# ගොඩනැගිලි ව්‍යාපෘති

## හැඳින්වීම

කෙරීගෙන යන ගොඩනැගිලි ව්‍යාපෘති **6**ක් සඳහා ඇස්තමේන්තුගත මුළු පිරිවැය රුපියල් මිලියන 1,569.27 කි. මිලියන **220** ක් වටිනා නව ගොඩනැගිලි ව්‍යාපෘති දෙකක වැඩ **2008** වසරේදී ආරම්භ විය. වෛද්‍ය පීඨයෙහි සිදු කරන විශ්වවිද්‍යාල පද්ධතියෙහි සුවිශාලම ගොඩනැගිලි ව්‍යාපෘතිය මෙම වසරෙහිදී ආරම්භ විය. මෙම ගොඩනැගිලි ව්‍යාපෘති සඳහා වසර තුළ භාවිත මුළු ප්‍රාග්ධන අරමුදල වූයේ රුපියල් මිලියන **160.5**කි.

## ගොඩනැගිලි ව්‍යාපෘතිවල වර්තමාන තත්ත්වය

මෙය IX -01 වගුවෙහි දැක්වේ. විශ්වවිද්‍යාලයෙහි සැලසුම්කරණ හා සංවර්ධන සහ ගොඩනැගිලි කමිටුව විසින් නිතිපතා මෙම ව්‍යාපෘති වල වර්ධනය ඇගයීමට ලක්කිරීමේ කටයුතු සිදු කෙරේ. ඊට අමතරව, නිත්‍ය වැඩබිම් රැස්වීම් සිදුකෙරිනි.

වසර තුල **2008.05.07** දින සංඛ්‍යාන හා ගණිත අධ්‍යයනාංශයෙහි පරිගණක විද්‍යාගාරයෙහි ගොඩනැගීම් කටයුතු ආරම්භ වූ අතර, විශ්වවිද්‍යාල පද්ධතියෙහි විශාලතම ගොඩනැගිල්ලේ කොන්ක්‍රීට් කුළුණු අත්තිවාරම් වැඩ **2008.11.11** දින ආරම්භ විය.

සායනික වෛද්‍ය විද්‍යාව හා දේශනාගාර ව්‍යාපෘති සඳහා වැඩ නිමවා තිබූ මහල් දෙක කොන්ත්‍රාත්කරුගෙන් විශ්වවිද්‍යාලය භාර ගන්නා ලදී.

## සැලසුම්ගත ව්‍යාපෘති

වර්තමාන ව්‍යාපෘතීන්ට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව විසින් පහත දැක්වෙන නව ගොඩනැගිලි ව්‍යාපෘති කොළඹ විශ්වවිද්‍යාලය වෙත අනුමත කරන ලදී.

i. නේවාසිකාගාර ඉදිකිරීම (සිසුන් 400 දෙනෙකුට මුත්තයියා නේවාසිකාගාර නව ඒකකය) – මුළු ඇස්තමේන්තුගත පිරිවැය – රුපියල් මිලියන 173.0 පමණ

ii. විද්‍යා පීඨයේ ශිෂ්‍ය පහසුකම් හා භෝජනාගාර ගොඩනැගිල්ල - මුළු ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 95.0 පමණ

iii. භෝජනාගාරය සඳහා ගොඩනැගිලි සංකීර්ණය, දේශන ශාලා හා නිබන්ධනාගාර, ව්‍යාප්ති දේශනාගාර හා පරිගණක විද්‍යාගාර සහ කළමනාකරණ හා මූල්‍ය පීඨය සඳහා පහසුකම් මුළු ඇස්තමේන්තුගත පිරිවැය – රුපියල් මිලියන 113.0 පමණ

iv. විද්‍යා පීඨය සඳහා නව පුස්තකාල ගොඩනැගිල්ල ගොඩනැගීම මුළු ඇස්තමේන්තුගත පිරිවැය – රුපියල් මිලියන 53.0 පමණ

v. කොළඹ විශ්වවිද්‍යාලය සඳහා විභාග ශාලා ගොඩනැගිල්ල ගොඩනැගීම මුළු ඇස්තමේන්තුගත පිරිවැය – රුපියල් මිලියන 22.0 පමණ

## IX-01 වගුව : ගොඩනැගිලි ව්‍යාපෘති වල වර්තමාන තත්ත්වය – 2008

| ගොඩනැගිලි ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත මුළු පිරිවැය (රු) | කොන්ත්‍රාත්කරු | උපදේශක | මුළු වියදම (රු) | සටහන් |
|---|---|---|---|---|---|
| සායනික වෛද්‍යවිද්‍යා ගොඩනැගිල්ල හා දේශනාගාරය | මුල් අගය – මි. 70.00 යළි සැකසූ අගය – මි. 133.77 | M/S සීමාසහිත එස් ඩී ස්ටිවන් සහ සමාගම | ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | මි. 59.86 | බිම් මහල හා පළමු මහල විශ්වවිද්‍යාලය විසින් භාර ගන්නා ලදි. 2009 මාර්තු 31 වන විට මුළු ව්‍යාපෘතියම සම්පූර්ණ කර භාර දෙන බවට කොන්ත්‍රාත්කරු එකගවී ඇත. ව්‍යාපෘතිය ඉලක්ක දිනට වඩා ප්‍රමාද වුවත් කෙරෙමින් පවති. |
| ද සේරම් ශිෂ්‍ය නේවාසිකාගාරම, අංක 220, ද සේරම් පෙදෙස, කොළඹ 10 | මි. 163.00 | M/S සීමාසහිත එස් ඩී ස්ටිවන් සහ සමාගම | ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | මි. 102.95 | කොන්ත්‍රාත්කරු විසින් ගොඩනැගිලි කටයුතු වලින් 85% ක් සම්පූර්ණ කර ඇත |
| මුත්තයියා කාන්තා නේවාසිකාගාරය, අංක 48, ජිනරතන මාවත, කොළඹ 2 | | තවම තෝරාගෙන නැත | ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | මි. 0.27 | - |
| විද්‍යා පීඨයේ ජීව විද්‍යා අදියර II, II ඒකකය (ජීවවිද්‍යා) | මි. 85.00 (ඒකක I හා II) | තවම තෝරාගෙන නැත (III ඒකකය) | සෙන්ට්‍රල් ඉංජිනියරිං කන්සල්ටන්සි බියුරෝ | මි. 54.00 (I හා II ඒකකය) | මෙම ව්‍යාපෘතියෙහි ඒකක I (උද්භිද විද්‍යා) සම්පූර්න කරන ලදි. II වන ඒකකය (ජීව විද්‍යා) සඳහා මුළු ඇස්තමේන්තුගත පිරිවැය වනුයේ රු මි 296.48කි. මෙම ඇස්තමේන්තුව නැවත සකසන ලෙස ඉල්ලා ඇත. |
| වෛද්‍ය පීඨයෙහි මරදාන පාරේ ගොඩනැගිලි සංකීර්ණය | මුල් - මි. 290.0 නව අගය මි. 1139.0 | පයිලිං වැඩ (M/s නවලෝක පයිලිං (පුද්) සමාගම | ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | මි. 64.50 | අමාත්‍ය මණ්ඩලය විසින් රු. මි. 192ක් වූ මෙම පයිලිං කොන්ත්‍රාත්තුව සඳහා අනුමැතිය දී ඇත. මෙම කොන්ත්‍රාත්තුව පිරිනමා ඇති අතර 10% ක් වැඩ නිමවා ඇත. |
| ගණිත හා සංඛ්‍යාන අධ්‍යයනාංශය සඳහා ගොඩනැගිල්ල | මි 48.50 | සැම්සන් ඉංජිනියරිං (පුද්) සමාගම | සෙන්ට්‍රල් ඉංජිනියරිං කන්සල්ටන්සි බියුරෝ | මි. 08.09 | කොන්ත්‍රාත්කරු විසින් දැනටමත් වැඩ අරඹා ඇති අතර 75% වැඩ නිමවා ඇත |

## X කොටස

# ඉඩම් හා ගොඩනැගිලි නඩත්තු කිරීම

සමාලෝචිත වසර තුල නඩත්තු අංශයේ කාර්ය මණ්ඩලය **54** දෙනෙක් වූහ. එක් වැඩ අධීක්ෂකයෙකු වැඩ අධිකාරීවරයෙකුගේ තත්ත්වයට උසස් කරනු ලැබිය. සිවිල් අධීක්ෂකවරු 4 දෙනෙකු බඳවා ගැනිණි. විදුලි කාර්මික අධිකාරීවරයෙකු බඳවා ගන්නා ලදි.

වෛද්‍ය පීඨයෙහි දැඩි අවශ්‍යතාවක් වූ නඩත්තු අංශය නැවත ස්ථාපිත කරන ලදි. මෙම අනු අංශයෙහි පූර්ණ කාලීන සිවිල් අධීක්ෂකවරයෙක්, ගබඩා භාරකරුවෙක්, එක් විදුලි කාර්මිකයෙක්, පුහුණු වන විදුලි කාර්මිකයන් දෙදෙනෙක්, ජලනල කාර්මිකයෙක් හා පුහුණු වන ජලනල කාර්මිකයන් දෙදෙනෙක්, එක් වඩු කාර්මිකයෙක් එක් පෙදරේරුවෙක් හා කම්කරුවන් දෙදෙනෙක් වූහ.

අධ්‍යයනාංශයන්හි ද බ්ලොම්ෆොන්ටේන් හා ද සේරම් නේවාසිකාගාරයන්හිද බොරැල්ලේ පිහිටි සමගාමී සෞඛ්‍ය හා භෞත චිකිත්සා ඒකකයෙහිද නඩත්තු කටයුතු සැලකිය යුතු ප්‍රමාණයක් පීඨ හා අංශ බාධාවකින් තොරව ක්‍රියාත්මක වීමට අවශ්‍ය පරිදි මෙම නව අංශය විසින් කරනු ලබයි.

කාර්ය මණ්ඩලය **43**ක්වූ අතර එහි පරිපාලකවරු දෙදෙනෙක් ද අධීක්ෂක මට්ටමේ අට දෙනෙක්ද ලිපිකරු හා කාර්මික **6** දෙනෙක්ද කුසලතා මට්ටමේ **27** දෙනෙක්ද වූහ.

වසර තුළ නඩත්තු අංශය විසින් ප්‍රමාණවත් පරිදි නඩත්තු කටයුතු, අළුත්වැඩියා හා වැඩිදියුණු කිරිම් සිදු කරන ලද අතර අංශයට සෘජුවම සම්බන්ධ කම්කරුවන් විසින් මෙම කටයුතු සිදු කිරීම මගින් විශ්වවිද්‍යාලයට රුපියල් මිලියන **1.3**ක් ඉතිරි කර ගන්නා ලදි. එම කටයුතු නම් සාක් සමුළුවට පෙර විශ්වවිද්‍යාලයේ හා හැව්ලොක් නේවාසිකාගාරයේ මායිම් බිත්ති වර්ණාලේප කිරීම, **60**වන සංවත්සරයට පෙර නීති පීඨයෙහි වර්ණාලේප කිරීම, නීති, විද්‍යා හා කාර්ය මණ්ඩල සංවර්ධන කේන්ද්‍රයෙහි විදුලි රැහැන් සම්බන්ධ වැඩ, බොරලැස්ගමුව හා රත්තනපිටිය කාන්තා නේවාසිකාගාරවල ද, අයිතිකරුවන්ට භාර දීමට පෙර බොරැල්ලේ පිහිටි සහකාර වෛද්‍ය සහ සමාන්තර ශ්‍රේණීන්ට අයත් සෞඛ්‍ය සේවා අංශවල භාවිතයේ තිබූ දෙමහල් ගොඩනැගිල්ලෙහි සියළු අළුත්වැඩියා හා යථාවත් කිරීම්, යනාදිය වේ.

**2008** වසර තුළ සමහර අළුත්වැඩියා කටයුතු, වැඩිදියුණු කිරීම්, පුනරුත්ථාපන කටයුතු හා ගොඩනැගිලි වැඩ බාහිර පාර්ශ්ව වෙත භාර දි සිදු කරන ලද අතර වසර අවසාන වන විට ඒවායේ ස්වභාවය X-01 වගුවෙහි වේ.

## X-01 වගුව : නිමකර ඇති වැඩ – අළුත්වැඩියාකිරීම්, වැඩිදියුණු කිරීම් හා පුනරුත්ථාපන කටයුතු

*(පීඨය හා අර්ථ ලාභියා අනුව වර්ගීකරණය කර ඇත)*

| විස්තරය | කොන්ත්‍රාත්කරු | ටෙන්ඩර් පිරිවැය (වැට් රහිත) |
|---|---|---|
| **පොදු** | | |
| හැව්ලොක් කාන්තා නේවාසිකාගාරයේ ගෑස් සැපයුම් පද්ධතියෙහි අළුත්වැඩියා කිරීම | ගෑස් වැඩ මධ්‍යස්ථානය | 23,725.00 |
| මුත්තයියා කාන්තා නේවාසිකාගාරය ගෑස් සැපයුම් පද්ධතියෙහි අළුත්වැඩියා කිරීම් | ගෑස් වැඩ මධ්‍යස්ථානය | 17,350.00 |
| මුත්තයියා නේවාසිකාගාරයේ කෘමි නාශක කටයුතු | යුනයිටඩ් ප්‍රොෆෙෂනල් ඒජන්සීස් | 60,000.00 |
| කිත්යාකර නේවාසිකාගාරයේ ගෑස් නල පද්ධතියේ අළුත්වැඩියාකිරීම් | ගෑස් වැඩ මධ්‍යස්ථානය | 35,835.00 |
| **උප එකතුව** | | **136,910.00** |
| **ශාස්ත්‍ර පීඨය** | | |
| පවත්නා වැසිකිලි නවීකරණය හා මාර්ගයෙහි වංගුව වැඩිදියුණු කිරීම | ලීනස් ඉලෙක්ට්‍රිකල්ස් | 185,200.00 |
| වාහන නැවතුම්පලවල් දෙකක් සෑදීම | ලීනස් ඉලෙක්ට්‍රිකල්ස් | 952,945.00 |
| භෝජනාගාරයේ ගෑස් පද්ධතිය අළුත්වැඩියා කිරීම | ගෑස් වැඩ මධ්‍යස්ථානය | 15,880.00 |
| අමතර ජල සැපයුම | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | 144,834.50 |
| **උප එකතුව** | | **1,298,859.50** |
| **අධ්‍යාපන පීඨය** | | |
| මානව සමාජයීය අධ්‍යාපන අධ්‍යයනාංශයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ඇලුමිනියම් කුටි සෑදීම | ලීනස් ඉලෙක්ට්‍රිකල්ස් | 229,940.00 |
| **උප එකතුව** | | **229,940.00** |
| **නීති පීඨය** | | |
| දේශන ශාලා අංක I හා II නවීකරණය කිරීම, නව දේශනාගාරය | කල්හාර ගොඩනැගිලිකරුවෝ | 3,927,380.50 |
| අභ්‍යන්තර වෙන්කිරීම් බිත්ති | උදාර ලංකා ඩිවෙලොප්මන්ට් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන් කම්පනි | 522,490.00 |
| **උප එකතුව** | | **4,449,870.50** |
| **වෛද්‍ය පීඨය** | | |
| මානව ජාන විද්‍යාගාරයෙහි ඇලුමිනියම් වෙන් කිරීම් | දූලංග ඇසෝසියේට්ස් | 128,600.00 |
| **උප එකතුව** | | **128,600.00** |
| **විද්‍යා පීඨය** | | |
| භෞතික විද්‍යා අංශයට පිවිසුම් මග සෑදීම | සියනෑ කොන්ත්‍රාත්කරුවෝ | 148,775.00 |
| න්‍යෂ්ටික විද්‍යා අධ්‍යයනාංශය සඳහා ඇලුමිනියම් දොරවල් හා වීදුරු පැනල් සැපයුම හා සවිකිරීම | උදාර ලංකා ඩිවෙලොප්මන්ට් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන් කම්පනි | 74,300.00 |
| ශාක විද්‍යා අධ්‍යයනාංශයේ ශුද්ධ ජීවවිද්‍යාගාරය සඳහා එල් පි ජී නල සපයා සවිකිරීම | ලාෆ්ස් ඉංජිනියරිං (පුද්) සමාගම | 328,600.00 |
| **උප එකතුව** | | **551,675.00** |
| **එකතුව** | | **6,795,855.00** |

**X-02 වගුව : කෙරීගෙන යන කටයුතු - අළුත් වැඩියා, වැඩිදියුණු කිරීම් හා පුනරුත්ථාපන කටයුතු**

*(පීඨ හා අර්ථලාභියා මත වර්ගීකරණය කරන ලදී)*

| **විස්තරය** | **කොන්ත්‍රාත්කරු** | **ටෙන්ඩර් පිරිවැය (වැට් බද්ද රහිතව)** |
|---|---|---|
| **පොදු** | | |
| රාජ්‍ය විගණන ඒකකයේ මිමී 5ක් ඝන පොලිමර් යට් තට්ටුව සහිත ලූපමය පයිල් කාපට් සැපයීම හා එලීම | හවුස් ඔෆ් ගිහාන් ටෙක්ස් | 55,607.15 |
| ශ්‍රී පාලි මණ්ඩපයේ විදුලි සන්නායක ආරක්ෂිත පද්ධතිය සපයමින් එය සවිකිරීම හා නඩත්තුව | සීමාසහිත එස් ඒ ඩබ් ඉංජිනියරිං | 1,498,000.00 |
| කිත්යාකර පිරිමි නේවාසිකාගාරයේ වැසිකිලි දෙකක් නවීකරණය කිරීම | උදාර ලංකා සංවර්ධන හා ගොඩනැගීම් සමාගම | 872,425.00 |
| කළමණාකරන හා මූල්‍ය පීඨයටත් අධ්‍යාපන පීඨයටත් පිවිසුම් මාර්ගය සෑදීම | සියනෑ කොන්ත්‍රාත්කරුවෝ | 823,610.00 |
| ප්‍රධාන පුස්තකාලයට වානේ ග්‍රිල් ගේට්ටු සපයා සවි කිරීම | ලීනස් ඉලෙක්ට්‍රිකල්ස් | 116,197.50 |
| මහාචාර්ය ස්ටැන්ලි විජේසුන්දර මාවත දෙසින් ඇති ප්‍රවේශය සඳහා ආරක්ෂක කුටියක් හා වානේ නල වලින් තැනූ බාධකයක් තැනීම | උදාර ලංකා සංවර්ධන හා ගොඩනැගීම් සමාගම | 520,205.00 |
| ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය අනුශාසක වෙනුවෙන් නානකාමරයක් තැනීම | ලීනස් ඉලෙක්ට්‍රිකල්ස් | 329,450.00 |
| ප්‍රධාන පුස්තකාලයේ පිටත මතුපිට පින්තාරු වැඩ හා වහල අළුත්වැඩියාව | ටෙන්ඩර් ඇගයීම් තත්ත්වයේ වෙයි | |
| HEMIS කාර්යාලයේ වෙන් කිරීම් කටයුතු | ලීනස් ඉලෙක්ට්‍රිකල්ස් | 352,005.00 |
| නඩත්තු අංශයේ ඇලුමිනියම් ජනේල වලින් වෙන්කිරීම් වැඩ හා සිවිලිම් වැඩ | දුලංගා ඇසෝසියේට්ස් | 256,587.60 |
| නෙලවල නේවාසිකාගාරයේ පිලිස්සුනු විදුලි පැනලය නැවත දැමීම | සීමාසහිත ඕ/එස් ව්‍යාපෘති (පුද්ගලික) සමාගම | 518,360.00 |
| මාපල් කාර්යාලය අළුත්වැඩියාව හා යතාවත් කිරීම | ලීනස් ඉලෙක්ට්‍රිකල්ස් | 130,735.48 |
| **උප එකතුව** | | **5,473,182.73** |
| **කළමණාකරන හා මූල්‍ය පීඨය** | | |
| ප්‍රධාන ගොඩනැගිල්ලේ නැගෙනහිර කොටසේ නවීකරණ කටයුතු | සැම්සන් ඉංජිනියර්ස් | 3,600,086.75 |
| කියවීම් ශාලාව නැවත ගොඩනැගීම | වර්ක් ඉංජිනියරිං සමාගම | 1,048,229.60 |
| ටෙනිස් පිටිය නැවත සැකසීම | කේ. සුබ්‍රමනියම් | 29,850.00 |
| **උප එකතුව** | | **4,678,166.35** |
| **වෛද්‍ය පීඨය** | | |
| අධිකරණ වෛද්‍ය විද්‍යා අංශයේ ඇලුමිනියම් වෙන්කිරීම් සෑදීමේ කටයුතු | ලෝචනා එන්ටර්ප්‍රයිසස් | 736,796.40 |
| රඟහල හා කාර්යාල අභ්‍යන්තරයෙහි වැඩිදියුණු කිරීම් හා අළුත්වැඩියා කිරීම් | ලෝචනා එන්ටර්ප්‍රයිසස් | 583,840.00 |
| **උප එකතුව** | | **1,320,636.40** |
| **විද්‍යා පීඨය** | | |
| යෝජිත අණුකජීව විද්‍යා විද්‍යාගාරයෙහි අළුත්වැඩියා හා වැඩිදියුණුකිරීම් | සම්පත් කන්ස්ට්‍රක්ෂන්ස් | 1,541,713.50 |
| ශාක විද්‍යා අධ්‍යයනාංශයෙහි හා තර්ස්ටන් විද්‍යාලය අතර දම්වැල් සම්බන්ධතා වැට ගොඩනැගීම | උදාර ලංකා සංවර්ධන හා ගොඩනැගීම් සමාගම | 325,300.00 |
| භෞතික විද්‍යා අධ්‍යයනාංශයේ පරිගණක විද්‍යාගාරයෙහි පළමු හා දෙවන මහල් වල ඇලුමිනියම් වෙන් කිරීම් වැඩ | ලීනස් ඉලෙක්ට්‍රිකල්ස් | 360,898.36 |
| **උප එකතුව** | | **2,227,911.86** |
| **එකතුව** | | **13,699,897.34** |

# XI කොටස

## ප්‍රවාහන සේවා

විශ්වවිද්‍යාලයීය ප්‍රවාහන සේවා සම්බන්ධීකරණය කරන ලද්දේ සාමාන්‍ය පාලන අංශය විසිනි. සමාලෝචනයට ලක් කර ඇති වර්ෂය තුල, ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරිගේ අධීක්ෂණය යටතේ එක් ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාරවරයෙකුද, රියදුරන් දහ නව (19) දෙනෙකු ද ප්‍රවාහන සේවා ඒකකයෙහි සේවයෙහි නියුතුව සිටියහ.

2008 දෙසැම්බර් මස අවසානය වන විට විශ්වවිද්‍යාලය සතුව වාහන තිස් හයක් (36) පැවතිණ. විවිධ පීඨ හා අධ්‍යයනාංශ අතර වාහන බෙදා හැරීම පහත දැක්වෙන ආකාරයට සිදු කර තිබිණ.

**XI-01 වගුව : වාහන බෙදා හැරීම 2008**

*(භාවිතා කරන්නා සහ වාහන වර්ගය අනුව වර්ගීකරණය කර ඇත)*

| වාහන වර්ගය | විද්‍යාල මන්දිරය | විද්‍යා පීඨය | වෛද්‍ය පීඨය | නඩත්තු අංශය | භූමි අලංකරණ | එකතුව |
|---|---|---|---|---|---|---|
| කාර් කැබ් | 01 | - | - | - | - | **01** |
| කාර් | 08 | - | - | - | - | **08** |
| වෑන් රථ | 04 | - | 05 | - | - | **09** |
| කැබ් රථ | 02 | - | - | - | - | **02** |
| ජීප් රථ | 03 | - | - | - | - | **03** |
| බස් රථ | 03 | - | - | - | - | **03** |
| ත්‍රි රෝද රථ | 02 | - | - | - | - | **02** |
| අත් ට්‍රැක්ටර් | - | - | - | 02 | 01 | **03** |
| මෝටර් සයිකල්[1] | 04 | 01 | - | - | - | **05** |
| **එකතුව** | **27** | **01** | **05** | **02** | **01** | **36** |

*[1] සයිකල් පහෙන් එකක් ශ්‍රී පාලි මණ්ඩපයට ලබා දී ඇත*

නඩත්තු වියදම (අළුත් වැඩියාකිරීම්, තත්ත්ව තහවුරු කිරීම්, බලපත්‍ර බදු, රක්ෂණ ගෙවීම්) රුපියල් 1,577,833.52 ක් වූ අතර, ඉන්ධන වියදම රුපියල් 1,785,826.00 ක් විය.

වාහන අළුත් වැඩියා කිරීම්, බලපත්‍ර සහ රක්ෂණ ලබාගැනීම් ආදිය සම්බන්ධ සියළු කටයුතු සම්බන්ධීකරණය කර ක්‍රියාත්මක කරනු ලබන්නේ විශ්වවිද්‍යාල ප්‍රවාහන අංශය විසිනි.

# XII කොටස

## අභ්‍යන්තර විගණන, මූල්‍ය හා ගණකාධිකරණ කටයුතු

### අභ්‍යන්තර විගණනය

2008 වසර තුල අභ්‍යන්තර විගණන අංශය අට (08) දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයකින් යුක්ත විය. එනම්, ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන් දෙදෙනෙකුගෙන් ද, ලිපිකරුවන් පස් දෙනෙකුගෙන් හා එක් කාර්යාල කම්කරුවෙකුගෙනි.

සමාලෝචිත වර්ෂය තුල කොළඹ විශ්වවිද්‍යාලයීය විගණන කමිටුව සත් වතාවක් රැස් වූහ. කොළඹ විශ්වවිද්‍යාලයෙහි අනෙකුත් ආයතන විසින් විගණන කමිටු රැස්වීම් පැවැත්වූ ආකාරය මෙසේය. ( XII-01 වගුව)

**XII-01 වගුව : රැස්වීම්**

| ආයතන විසින් පැවැත්වූ විගණන කමිටු රැස්වීම් | රැස්වීම් |
|---|---|
| මානව සම්පත් අභිවර්ධන ආයතනය (IHRA) | 02 |
| දේශීය වෛද්‍ය ආයතනය (IIM) | 05 |
| ජෛව රසායන, අණුක ජීව විද්‍යා හා ජෛව තාක්ෂණ ආයතනය (IBMBB) | 03 |
| පුස්තකාල සහ විඥාපණ විද්‍යාව පිළිබඳ ජාතික ආයතනය (NILIS) | 03 |
| වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය (PGIM) | 04 |

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල ආපසු ගෙවීම, විශ්‍රාම පාරිතෝෂික ගෙවීම්, වැටුප් වර්ධක වාසි පිරිනැමීම, විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා අයදුම්පත්, හිඟ වැටුප් ගෙවීම් යන කරුණු සම්බන්ධ පූර්ව විගණන කටයුතු සිදුකරන ලදී.

### විගණන විමසුම් හා වාර්තා

සමාලෝචිත වසර තුල, අභ්‍යන්තර විගණන අංශය විසින් විගණන විමසුම් කිහිපයක් සිදු කල අතර, විගණකාධිපති හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙහි ප්‍රධාන අභ්‍යන්තර විගණක වෙත පිටපත් සහිතව වාර්තා **19**ක් ද, විගණන වාර්තා **3**ක් ද සම්පාදනය කරන ලදී.

### විශේෂ කාර්යයන්

අභ්‍යන්තර විගණන අංශය විසින් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය සමිතීන් මූල්‍ය විගණනයනට භාජනය කරන ලදී. ඒවා නම්, සංඛ්‍යාණ කවය, උද්භිද විද්‍යා සංගමය, හින්දු වෛද්‍ය ශිෂ්‍ය සංගමය, ශාස්ත්‍ර පීඨ ශිෂ්‍ය සංගමය, අධ්‍යාපන පීඨ ශිෂ්‍ය සංගමය, ක්‍රිස්තියානි සහෝදරත්ව සංගමය, රසායනික සංගමය, 'ගවේෂකයෝ' ශිෂ්‍ය සංගමය, 'එප්සිලන් ඩෙල්ටා' සංගමය හා විද්‍යා පීඨ ශිෂ්‍ය සංගමය වැනි සංගම් වේ.

**2008 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වසර සඳහා කොළඹ විශ්වවිද්‍යාලයීය මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වාර්තාව**

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 106 (1) (2) සහ 107 (බී) වගන්ති ප්‍රකාර 2008.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයීය වාර්ෂික මූල්‍ය ප්‍රකාශනය මේ සමග ඉදිරිපත් කෙරේ.

2008.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ ආදායම්, වියදම් පිළිවෙලින් රු. 1,496,527,934/= ක් සහ රු. 1,496,514,752/= ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු. 13,182/- ක අතිරික්තයක් වූ අතර 2007 වර්ෂයේදී ඊට අදාලව රු. 150,434,746/- ක ඌණතාවයක් පෙන්නුම් කරයි. පොදුවේ පිළිගත් ගණකාධිකරණ මූලධර්ම පදනම් කර ගිණුම් පිළියෙළ කර ඇත.

සමාලෝචිත වර්ෂයේ හා පෙර වර්ෂයේ ආදායම් හා වියදම් වල සාරාංශයක් පහත දැක්වේ.

| | **2007 (රු.)** | **2008 (රු.)** |
|---|---|---|
| රජයේ ආධාර | 859,600,000 | 956,500,000 |
| වෙනත් ආදායම් | 450,700,271 | 540,027,934 |
| මුළු ආදායම | **1,310,300,271** | **1,496,527,934** |
| අඩු කළා : මුළු වියදම | (1,460,735,016) | (1,496,514,752) |
| වියදමට වඩා ආදායම | **(150,434,746)** | **13,182** |

2008 වසර සඳහා මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති විසින් පිළිගෙන ඇති අතර විශ්වවිද්‍යාල පනතේ 109 වන වගන්තිය ප්‍රකාර මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වාර්තාව රජයේ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරන ලදී.

(මහාචාර්ය ක්ෂණිකා හිරිඹුරේගම)
උප කුලපතිනි

කොළඹ විශ්වවිද්‍යාලය

**මූල්‍ය සමාලෝචනය – 2008**

1. **වාර්තා කිරීමේ ආයතනය**

**1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතින් ස්ථාපිත කරන ලද කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පරිපාලනය කොළඹ 3, කුමාරතුංග මුණිදාස මාවතෙහි, අංක 94 යන ලිපිනයෙහි පිහිටි විද්‍යාල මන්දිරයෙන් සිදු වේ.**

2. **වර්ෂය සම්බන්ධ ප්‍රතිපල**

| **ආදායම්** | **2008 (රු. මිලියන)** | | **2007 (රු. මිලියන)** | |
|---|---|---|---|---|
| රජයේ ආධාර | 956.50 | | 859.6 | |
| මහපොළ සඳහා ආධාර | 107.16 | | 91.0 | |
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආධාර | 34.20 | | 44.8 | |
| අභ්‍යන්තරව උත්පාදනය කළ අරමුදල් | 79.32 | 1,177.18 | 76.0 | 1,071.4 |
| **වියදම්** | | | | |
| ප්‍රථම උපාධි අපේක්ෂක අධ්‍යයන | 1,007.60 | | 958.7 | |
| මහපොළ ප්‍රතිපාදන | 107.16 | | 83.9 | |
| ශිෂ්‍යාධාර සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ප්‍රදාන | 31.71 | 1,146.47 | 29.4 | 1,072.0 |
| ප්‍රතිපාදන යටතේ පෙර අතිරික්තය /හිගය | | 30.71 | | (0.60) |

| **මූලධන ආධාර** | **2008** ප්‍රතිපාදන රු. මි. | **2008** ලැබීම් රු. මි. | **2007** ප්‍රතිපාදන රු. මි. | **2007** ලැබීම් රු. මි. |
|---|---|---|---|---|
| උපකරණ | 79.05 | 51.50 | 90.00 | 62.90 |
| පුනරුත්ථාපනය | 41.85 | 37.00 | 64.00 | 46.40 |
| ඉදිකිරීම් | 232.50 | 113.00 | 125.00 | 52.70 |
| | **353.4** | **201.5** | **279.00** | **162.00** |

මූලික රාජ්‍ය ප්‍රතිපාදන වෙන්කිරීමෙහි අඩුවීමක් සිදු ව ඇතත්, වසරෙහි මූල්‍ය ක්‍රියාකාරිත්වය යහපත් බව පෙනී යයි. කෙසේවෙතත්, 2009 වසර තුළදී අදාල බිල් පත් පියවෙනු ඇතැයි යන අපේක්ෂාවෙන් අත්‍යවශ්‍ය ඉගැන්වීම් උපකරණ, පොත් පත් ආදිය සැපයීම ද අළුත්වැඩියා කටයුතු හා නඩත්තු කටයුතු ද ගොඩනැගිලි වල නව කොටස් ඉදිකිරීම්ද විශ්වවිද්‍යාලය විසින් තවදුරටත් සිදුකරන්නට යෙදුණි.

ප්‍රාග්ධන ප්‍රදාන 2007 වසරට සාපේක්ෂව 58% සිට 57% දක්වා අඩු වී ඇති අතර, මුළු වත්කම් ප්‍රමාණයෙහි වර්ධනයක් පෙන්නුම් කෙරේ. භාණ්ඩාගාර අරමුදල් නිදහස් කෙරෙනු ඇතැයි යන අපේක්ෂාවෙන්, උපදේශක සේවා සහ ව්‍යාපෘති සඳහා ලැබූ මුදල් තාවකාලිකව භාවිතා කරන ලද අතර බොහෝ

අවස්ථා වලදී විශ්වවිද්‍යාලය විසින් 2008 වසර තුළ මෙම බිල්පත් පියවීමට හැකි වන සේ ණය පහසුකම් සපයාගන්නා ලදී.

## 3. මුදල් සහ ආයෝජන

විශ්වවිද්‍යාලය විසින් මුදල් සහ ආයෝජන ගොනුවක් පවත්වාගෙන යනු ලබයි. බූදල් පැවරුම්, හා ශිෂ්‍යත්ව වැනි දීර්ඝ කාලීන ලැබීම් අරමුදල් ස්ථිර තැන්පතු ලෙස ආයෝජනය කර ඇති අතර, තාවකාලික මුදල් අතිරික්තයන් කැඳවුම් තැන්පතු ලෙස ආයෝජනය කර ඇත. උපදේශක සේවා ව්‍යාපෘතීන්හි හදිසි ක්‍රියාකාරකම් සඳහා සමහර ගිණුම් වල යම් මුදල් ශේෂයක් පවත්වාගෙන යාමට අනිවාර්යයෙන් අපට සිදු විය.

## 4. සමාප්තිය

2008 වසරෙහිදී ප්‍රධාන වශයෙන් යටිතල පහසුකම් සංවර්ධනය ද ඇතුළුව විශ්වවිද්‍යාලයෙහි ක්‍රියාත්විත කාර්යසාධනයෙහි සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කර ඇත. සංඛ්‍යානය හා ගණිතය අධ්‍යයනාංශ සඳහා පරිගනක විද්‍යාගාරයක් ගොඩනැගීම සඳහා රුපියල් මිලියන 28ක් සහ වෛද්‍ය පීඨය සඳහා රුපියල් මිලියන 192ක වියදමක් දරමින් මහල් 14ක ගොඩනැගිල්ලක් ගොඩනැගීම සඳහා අදාල අඩිතාලම් ඉදිකිරීම් ආදී කටයුතු විශ්වවිද්‍යාලය විසින් අරඹා ඇත.

ප්‍රමාණවත් මුදල් ලබා ගැනීමට විශ්වවිද්‍යාලය අපොහොසත් වුවද, රාජ්‍ය ප්‍රතිපාදනයන් යටතේ 2008 වසර තුල විශ්වවිද්‍යාලය තවදුරටත් භෞත චිකිත්සාව, අනුක ජීව විද්‍යාව, ජෛව රසායන විද්‍යාව හා කර්මාන්ත ගණිතය සඳහා වන නව උපාධි පාඨමාලා තව දුරටත් පවත්වාගෙන යන ලදී. මූල්‍ය අවහිරතා තිබුණද, 2008 වසර සඳහා අපේක්ෂිත ඉලක්ක වෙත විශ්වවිද්‍යාලය ළගා වූයේ මූලික වශයෙන්ම උපදේශක ව්‍යාපෘති හා පර්යේෂණ අංශයේ දායකත්වය ඉහල අගයක් ගත් බැවිනි. වේතන, සැපයීම් හා උපයෝගිතා හැර අනෙකුත් ක්‍රියාකාරී කටයුතු සම්බන්ධයෙන් මහාභාණ්ඩාගාර මුදල් මත යැපීම අවප්‍රමාණ කිරීමට තව දුරටත් විශ්වවිද්‍යාලය කටයුතු කළාය. මෙය සිදුකරන ලද්දේ උපදේශන සේවා වර්ධනය කිරීමෙන්, පශ්චාත් උපාධි පාඨමාලා මගින් කෙරෙන ඉපයීම් ශක්‍යතාව වර්ධනය කිරීමෙන් හා ඒ මගින් බාහිර ආදායම් උපයා ගැනීම ඔස්සේ ය.

කේ. එස්. ටී. ස්වර්ණලතා ජයසූරිය
මූල්‍යාධිකාරී

## 2008 දෙසැම්බර් මස 31 දිනට ශේෂ පත්‍රය

| | සටහන් | 2008 (රු.) | | 2007 (රු.) | |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| **දේපල, පිරියත සහ උපකරණ** | 02 | | 1,081,307,711 | | 1,163,502,365 |
| **කෙරීගෙන යන වැඩ** | 03 | | 273,630,468 | | 114,163,730 |
| **ආයෝජන** | 04 | | 508,743,504 | | 445,384,180 |
| **ජංගම නොවන වත්කම් - වෙනත්** | | | | | |
| විවිධ ණය ගැතියෝ | 05 | 4,237,273 | | 4,016,657 | |
| සේවක ණය සහ අත්තිකාරම් | 06 | 116,054,485 | | 74,713,310 | |
| සැපයුම් සේවා ණය | 07 | 76,315 | | 17,315 | |
| වෙනත් විශ්වවිද්‍යාල වලින් ලැබිය යුතු මුදල් | 09 | 369,649 | 120,737,723 | 579,101 | 79,326,383 |
| **ජංගම වත්කම්** | | | | | |
| බඩු තොග | | 6,728,898 | | 5,429,911 | |
| විවිධ ණය ගැතියෝ | 05 | 25,618,090 | | 26,304,780 | |
| සැපයුම් සේවා ණය අත්තිකාරම් | 07 | 17,943,678 | | 16,158,308 | |
| විවිධ අත්තිකාරම් | 08 | 4,279,926 | | 3,207,827 | |
| විවිධ ආයතන හා විශ්වවිද්‍යාල වලින් ලැබිය යුතු මුදල් | 09 | 2,989,493 | | 1,018,198 | |
| කලින් ගෙවීම් | | 320,220 | | 1,027,731 | |
| මුදල් සහ මුදල් හා සමාන දේ | 10 | 40,773,603 | 98,653,908 | 31,883,587 | 85,030,342 |
| **මුළු වත්කම්** | | | **2,083,073,314** | | **1,887,407,000** |
| **ස්කන්ධ ප්‍රාග්ධනය** | | | | | |
| වැය වූ මූලධන ආධාර | 11 | 1,530,874,786 | | 1,457,872,969 | |
| වැය නොවූ මූලධන ආධාර | 12 | 24,118,444 | | 4 8,368,603 | |
| ත්‍යාග සහ පරිත්‍යාග | 13 | 51,075,521 | 1,606,068,751 | 49,562,943 | 1,555,804,514 |
| **සමුච්චිත අරමුදල** | | | | | |
| පොදු සංචිතය | | 18,958,102 | | 18,958,102 | |
| ආදායම් සහ වියදම් ගිණුම | | (656,817,160) | (637,859,058) | ( 674,800,112) | (655,842,010) |
| **සංචිත සහ නිශ්චිත අරමුදල්** | | | | | |
| විශේෂිත සංචිත | 14 | 283,587,900 | | 239,675,191 | |
| ප්‍රදාන අරමුදල | | 51,649,778 | | 45,004,824 | |
| පර්යේෂණ අරමුදල් | | 132,524,859 | | 120,013,394 | |
| බාහිර පාඨමාලා | | 261,492,428 | | 209,585,092 | |

| | | | | | |
|---|---|---|---|---|---|
| ත්‍යාග සහ පරිත්‍යාග | | 30,214 | | 30,214 | |
| වෙනත් | 15 | 13,957,121 | 743,242,300 | 3,426,679 | 617,735,394 |
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| පාරිතෝෂික දීමනා වෙන්කිරීම් | | 307,350,755 | 307,350,755 | 305,956,485 | 305,956,485 |
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| ගෙවිය යුතු වියදම් | 16 | 8,161,302 | | 1,028,870 | |
| ආපසු ගෙවිය යුතු තැන්පතු | 17 | 2,018,118 | 10,179,419 | 8,250,726 | 9,279,596 |
| **ජංගම වගකීම්** | | | | | |
| ගෙවිය යුතු වියදම් | 16 | 17,173,648 | | 20,437,275 | |
| උපචිත වියදම් | | 25,821,061 | | 29,436,980 | |
| ආපසු ගෙවිය යුතු තැන්පතු | 17 | 11,096,437 | 54,091,146 | 4,598,766 | 54,473,021 |
| **මුළු වගකීම්** | | | **2,083,073,314** | | **1,887,407,000** |

මූල්‍යාධිකාරී විසින් පිළියෙල කර සහතික කරන ලදී :

කේ. එස්. ටී. ස්වර්ණලතා ජයසූරිය

**පාලක සභාව සඳහා සහ ඒ වෙනුවෙන්**

මහාචාර්ය ක්ෂාණිකා හිරිඹුරේගම
උපකුලපතිනි

ඩී. පී. එල්. ජේ. නානායක්කාර
වැඩ බලන ලේඛකාධිකාරී

## කොළඹ විශ්වවිද්‍යාලය
**2008 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ**
**වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය**
**(අගයන් ආසන්නතම රුපියලට වටයන ලදී)**

| | ආදායම් | සටහන් | 2008 (රු.) | | 2007 (රු.) | |
|---|---|---|---|---|---|---|
| 01 | රජයේ ආධාර | | | | | |
| | (අ) රජයේ ආධාර (පුණරාවර්තන) | | 956,500,000 | | 859,600,000 | |
| | (ආ) රජයේ ආධාර සහ වත්කම් ප්‍රතිසංස්කරණ නඩත්තු | | 12,841,848 | | 24,020,162 | |
| | (ඇ) ප්‍රාග්ධන ප්‍රතිපාදන ක්‍රමක්‍ෂය | | 164,803,138 | | 16,873,087 | |
| | (ඇ) තොරතුරු තාක්‍ෂණ ප්‍රතිපාදන ක්‍රමක්‍ෂය | | 2,642 | | 1,195,276 | |
| | (ඉ) ශිෂ්‍යාධාර සඳහා ආධාර | | 15,858,800 | | 14,289,000 | |
| | (ඊ) මහපොළ සඳහා ආධාර | | | | | |
| | (i) වි.වි.ප්‍ර.කො. | | 18,355,350 | | 15,919,720 | |
| | (ii) මහපොල භාරකාර අරමුදල් සංරචකය (ආදායම) | | 107,167,100 | | 91,056,750 | |
| | (උ) හිග වැටුප් ගෙවීම සඳහා වි.වි.ප්‍ර.කො. සභාවෙන් ආධාර | | - | **1,275,528,877** | 14,574,000 | **1,037,527,996** |
| 02 | ලියාපදිංචි ගාස්තු (ප්‍රථම උපාධි) | | 2,217,440 | | 2,086,606 | |
| 03 | ලියාපදිංචි ගාස්තු (පශ්චාත් උපාධි) | | 481,000 | | 1,197,171 | |
| 04 | අධ්‍යයන ගාස්තු (ප්‍රථම උපාධි) | | 9,285,576 | | 7,688,971 | |
| 05 | අධ්‍යයන ගාස්තු (පශ්චාත් උපාධි) | | 372,000 | | 5,209,050 | |
| 06 | විභාග ගාස්තු (ප්‍රථම උපාධි) | | 115,970 | | 120,470 | |
| 07 | විභාග ගාස්තු (පශ්චාත් උපාධි) | | 110,475 | | 891,700 | |
| 08 | බාහිර විභාග | | - | | 172,860 | |
| 09 | පොලී ණය සහ අත්තිකාරම් වලින් පොලිය | | 3,221,054 | | 2,962,239 | |
| 10 | ආයෝජන පොලී | | 48,863,690 | | 34,005,470 | |
| 11 | ප්‍රකාශන විකුණුම් | | 36,600 | | 5,960 | |
| 12 | පරණ තොග හා භාණ්ඩ විකුණුම් | | - | | 44,032 | |
| 13 | දේපල කුලී ආදායම | | 804,022 | | 1,365,207 | |
| 14 | වෛද්‍ය ගාස්තු | | 329,100 | | 242,020 | |
| 15 | පුස්තකාල දඩ | | 629,667 | | 602,433 | |
| 16 | ව්‍යාපාරික කටයුතු වලින් | | 2,905,300 | | 2,195,315 | |
| 17 | සුළු මිශ්‍ර ආදායම් | | 5,674,987 | | 8,501,537 | |
| 18 | විදේශ විනිමය හුවමාරු ලාභය | | 306,438 | | 87,235 | |
| 19 | බාහිර සේවා සැපයීම් | | 403,548 | | 2,348,961 | |
| 20 | ගිවිසුම් කඩ කිරීම | | 3,426,351 | | 5,533,690 | |
| 21 | පරිත්‍යාග සහ ත්‍යාග | | 140,299 | | 817,782 | |
| 22 | බාහිර පාඨමාලා | | 90,688,621 | | 82,511,282 | |
| 23 | පර්යේෂණ ව්‍යාපෘති අරමුදලින් ලැබීම් | | 49,754,752 | | 113,276,388 | |
| 24 | ප්‍රදානයන් ලැබීම් | | 1,232,166 | **220,999,056** | 905,897 | **272,772,275** |
| | | | | **1,496,527,934** | | **1,310,300,271** |

| | | | | | |
|---|---|---|---|---|---|
| වියදම | | | | | |
| **පෞද්ගලික පඩිනඩි** | | | | | |
| වැටුප් සහ වේතන | 18 | 503,163,769 | | 499,025,383 | |
| වි.අ.අ./සේ.හා.අ./විශ්‍රාම වැටුප් | | 99,477,459 | | 98,741,291 | |
| දීමනා | | 116,720,292 | | 116,956,495 | |
| අතිකාල /නිවාඩු දින ගෙවීම් | | 24,249,886 | | 19,581,800 | |
| ගමන් වියදම් | 18 | 4,725,176 | | 2,926,091 | |
| සැපයීම් | 18 | 48,457,757 | | 39,922,040 | |
| නඩත්තු | 18 | 15,158,491 | | 12,088,800 | |
| කොන්ත්‍රාත්තුමය සේවා | 18 | 160,201,792 | | 135,477,779 | |
| වෙනත් | 18 | 35,444,896 | | 33,899,760 | |
| (i) මහපොල ශිෂ්‍යත්ව – වි.වි.ප්‍ර.කො.ස. | 18 | 17,528,500 | | 16,442,050 | |
| (ii) මහපොල ශිෂ්‍යාධාර සඳහා ආධාර (වියදම්) | | 107,167,100 | | 83,905,450 | |
| ශිෂ්‍යාධාර | 18 | 14,189,022 | | 12,978,791 | |
| ක්ෂය වීම් | | 166,239,874 | | 157,107,280 | |
| පාරිතෝශික දීමනා | | 29,114,862 | | 10,968,278 | |
| බාහිර පාඨමාලා වියදම | | 90,688,621 | | 82,511,282 | |
| පර්යේෂණ වියදම | | 49,754,752 | | 113,276,388 | |
| ප්‍රදානයන් හා ශිෂ්‍යත්ව | | 1,232,166 | | 905,897 | |
| ඉවත් කරන ලද වත්කම් විකිණීමෙන් ලාභය / පාඩුව | | 158,490 | | - | |
| ගොඩනැගිලි (පුනරාවර්තනය පුනරුත්ථාපනය) | | 12,841,848 | **1,496,514,752** | 24,020,162 | **1,460,735,016** |
| **වියදමට වඩා වැඩි ආදායමේ අතිරික්තය** | | | **13,182** | | **(150,434,746)** |
| **ආදායම් හා වියදම් විසර්ජන ගිණුම** | | | | | |
| ආදායම් හා වියදම් ගිණුම් ශේෂය | | | 13,182 | | (150,434,746) |
| පසුගිය වර්ෂයේ ගැලපීම | | | 17,969,771 | | (20,319,909) |
| ආදායම් හා වියදම් ගිණුමේ ශේෂය ඉ/ගෙ/ආ | | | (674,800,113) | | (504,045,458) |
| ශේෂ පත්‍රය ට ගෙන ගියා | | | **(656,817,160)** | | **(674,800,113)** |

